# ජාතික ප්‍රතිපත්ති රාමුව

## පොහොසත් රටක්

## ලස්සන ජීවිතයක්

## සාරාංශය

# ජාතික ප්‍රතිපත්ති රාමුව

## සෞභාග්‍යයේ දැක්ම

## පොහොසත් රටක්
## ලස්සන ජීවිතයක්

## සාරාංශය

## පටුන


**1. පරිසමාප්ත ජීවිතයක් - සුව පහසු රටක් ........ 1**

1.1 ශිෂ්ය සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක් ........ 2

1.2 නිරෝගී ජීවිතයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ........ 10

1.3 සුවපහසු නිවසක් - සනීපාරක්ෂක ජීවිතයක් ........ 16

1.4 ජවසම්පන්න පුරවැසියෙක් - ජයග්‍රාහී ජනතාවක් ........ 18

1.5 උදාර සංස්කෘතික ජීවිතයක් - සහකම්පනීය ජනතාවක් ........ 21

1.6 සංරක්ෂිත ඉතිහාසයක් - උරුම නව්‍යකරණයක් ........ 28

1.7 තිරසර ජෛව ලෝකයක් - සදාහරිත ජීවිතයක් ........ 30

1.8 නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් - සමබර තොරතුරු සමාජයක් ........ 38

**2. ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක් ........ 41**

2.1 ආරක්ෂිත සමාජයක් - සුපෝෂිත ජාතියක් ........ 42

2.2 කාර්යක්ෂම ශ්‍රම සම්පතක් - ගෞරවනීය වෘත්තීය ජීවිතයක් ........ 47

2.3 නිදහස් ස්ත්‍රී පුරුෂ සමාජභාවයක් - සාධාරණ මිනිස් අනන්‍යතාවක් ........ 50

2.4 සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක් ........ 53

2.5 තෘප්තිමත් තාරුණ්‍යයක් - සංස්කෘතිකවත් නිවහල් චින්තනයක් ........ 56

2.6 ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක් ........ 60

2.7 නිර්බාධිත සමාජ ජීවිතයක් - යුක්තිසහගත සම ප්‍රවේශයක් ........ 61

**3. නවීන ජීවිතයක් - පොහොසත් රටක් ........ 65**

3.1 ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක් - පොහොසත් රටක් ........ 67

3.2 ඉහළ ඵලදායිතාවක් - ආහාර සුරක්ෂිත රටක් ........ 74

3.3 ගුණාත්මක පශු නිෂ්පාදනයක් - ව්‍යවසායකත්ව ප්‍රවේශයක් ........ 79

3.4 තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් ........ 82

3.5 ඩිජිටල් රාජ්‍යකරණයක් - ජාත්‍යන්තර හවුල්කාරිත්වයක් ........ 90

3.6 පර්යේෂණ සහ සංවර්ධන ප්‍රවේශයක් - විදුහුරු සමාජයක් ..... 93
3.7 නව්‍ය සංචාරක කර්මාන්තයක් - ආකර්ශනීය ගමනාන්තයක් ..... 100
3.8 ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක් - ජීවධරණී ප්‍රවේශයක් ..... 105
3.9 තිරසර සම්පත් භාවිතාවක් - උපරිම ප්‍රතිලාභ ජනනයක් ..... 112
3.10 සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් - තිරසර විනිමය ප්‍රභවයක් ..... 116
3.11 මහජන ප්‍රවාහන සේවාවක් - කාර්යක්ෂම ගමනාන්තයක් ..... 125
3.12 තිරසර සමුද්‍ර සම්පතක් - ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයෙන් පංගුවක් ..... 130
3.13 ආරක්ෂිත දත්ත පද්ධතියක් - සන්නිවේදන තාක්ෂණ විප්ලවයක් ..... 133
3.14 ඵලදායී කළමනාකරණයක් - ඒකාබද්ධ පරිහරණ සැලසුමක් ..... 138
3.15 විද්‍යාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයක් - ගුණාත්මක සේවානියුක්තියක් ..... 141
3.16 ශක්තිමත් සහ නව්‍ය ගුවන් සේවා අංශයක් ..... 144

**4. අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක් ..... 147**

4.1. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් - ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක් ..... 149
4.2 කාර්යක්ෂම රාජ්‍ය සේවයක් - කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක් ..... 151
4.3 නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක් ..... 154
4.4 මිත්‍රශීලි පොලිස් සේවාවක් - තෘප්තිමත් වෘත්තීයභාවයක් ..... 158
4.5. මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක් ..... 161
4.6. මතින් තොර රටක් - නීරෝගී පුරවැසි ජීවිතයක් ..... 163
4.7 උදාර රාජ්‍යතාන්ත්‍රිකත්වයක් - ස්වෛරී රාජ්‍යයක් ..... 165
4.8 උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක් ..... 176
4.9 ශ්‍රී ලාංකේය ජාතියක් - විශ්වීය පුරවැසියෙක් ..... 181

පළමුවන පරිච්ඡේදය

# 1. පරිසමාප්ත ජීවිතයක් - සුව පහසු රටක්

## හැඳින්වීම: ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයේ අභියෝග සහ අවස්ථා

අධ්‍යාපන ක්‍රමය ප්‍රධාන අදියර කිහිපයකට එනම්; මුල් ළමාවිය, ප්‍රාථමික හා ද්විතීයික, උසස්, සහ වෘත්තීය අධ්‍යාපනය වශයෙන් බෙදා දැක්විය හැකිය. අධ්‍යාපන ක්‍රමයේ පවතින අභියෝග රටේ මානව ප්‍රාග්ධනය ගොඩනැගීමට බලපායි. එම ගැටළු ප්‍රවේශය, ගුණාත්මකභාවය, දැරිය හැකි මිල සහ අදාළත්වය ඇතුළු විවිධ මානයන් හරහා විහිදේ. මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමේ අඩු ප්‍රතිශතය, ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරීමට ඇතුළත් වීම ඉහළ නමුත් ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමේ පවතින විෂමතා, විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ඉහළ ඉල්ලුමක් ඇති නමුත් සීමිත ධාරිතාවක් පැවතීම සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුමක් ඇති නමුත් ශ්‍රම වෙළඳපල අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවීම මෙම අධ්‍යාපන ක්‍රමය තුළ පවතින ප්‍රධාන ගැටළු වේ. එබැවින්, මෙම ගැටළු විසඳීම සඳහා සියලුදෙනා අන්තර්කරණය වූ සහ ප්‍රතිචාරශීලී අධ්‍යාපන ක්‍රමයක් සහතික කිරීම සඳහා අධ්‍යාපන අංශයේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය රටේ ජනතාවට සාධාරණ, කාර්යක්ෂම සහ උසස් තත්ත්වයේ සෞඛ්‍ය සේවාවක් සැපයීමේ හැකියාවට බලපාන අභියෝග කිහිපයකට මුහුණ දෙයි. ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික සත්කාර පද්ධති කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීමෙන්, සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග වැළැක්වීම සහ ඩිජිටල් පරිවර්තනයේ අභියෝග ආමන්ත්‍රණය කරන අතරම වගවීම, ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය සහ අන්තර්ග්‍රහණය වන සේවා සැපයීම ශක්තිමත් කරයි.

විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල මූලික පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස නොමැතිකම තවත් ප්‍රධාන ගැටලුවකි. නොපැහැදිලි ඉඩම් හිමිකම සහ අධික ඉදිකිරීම් පිරිවැය ඇතුළුව ග්‍රාමීය නිවාස සමාන අභියෝගවලට මුහුණ දෙයි. මහල් නිවාස සංකීර්ණ සංවර්ධනය කිරීම මගින් මෙම ගැටලු විසඳීමට රජය අපේක්ෂා කරයි.

ක්‍රීඩාව සහ සංස්කෘතිය ප්‍රජා සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ; කෙසේ වුවද, ඇතැම් ප්‍රධාන තීරණ ගැනීමේ ක්ෂේත්‍රයන් මෙහි ප්‍රගතියට බාධාවක් වී ඇත. එබැවින්, ධනාත්මක සමාජ දායකත්වය පෝෂණය කිරීම සඳහා මෙම අංශ දෙකම සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

මේ අතර, අවිධිමත් පාරිසරික කළමනාකරණය සහ සංවර්ධනය දිගුකාලීන ප්‍රශ්නයක් වන අතර එය ඉඩම් හායනය හා ජල හිඟයට හේතු වී ඇති අතර, තිරසර සංවර්ධනයට සහ සම්පත් කළමනාකරණයට ප්‍රමුඛත්වය දීමට රජය පොළඹවයි.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

සංවර්ධිත, මානවවාදී සහ වගකිවයුතු සමාජයක් බිහි කරන ගුණාත්මක අධ්‍යාපනයක්, තිරසර සංවර්ධනයක් සහ සම්පත් කළමනාකරණයක් සහතික කිරීම.

## ප්‍රතිපත්ති මූලධර්මයන්

- සැමට නිදහස් අධ්‍යාපනය සහ සම ප්‍රවේශය
- මානව සංවර්ධනය හා සේවා නියුක්තියට අදාළතාවය
- සියල්ලන්ටම පිළිගත හැකි බව
- සමාජයට වගවන පුරවැසියන්
- තිරසර බව සහ නවෝත්පාදනය
- යාවජීව අධ්‍යාපනය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය. | වයස අවුරුදු 03 සිට 05 දක්වා වන සියලු දරුවන්ට උසස් තත්ත්වයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය ඇති බවට සහතික කිරීම.<br><br>වයස අවුරුදු 05 ට වැඩි දරුවන්, පාසල් ජීවිතයට සාර්ථක ලෙස ඒකාබද්ධ වීම සහතික කිරීම.<br><br>බහු සංස්කෘතික විවිධත්වය සඳහා අනුවර්තනය වීමේ මූලාරම්භය සහතික කිරීම.<br><br>නිරෝගී අනාගත පරපුරක් සහතික කිරීම.<br><br>මුල් ළමාවිය අධ්‍යාපනය සංවර්ධනය නියාමනය කිරීම සඳහා පහසුකම් සැලසීම.<br><br>අධ්‍යාපනඥයින්ට සේවාවට අදාල වෘත්තිය සුදුසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය පුහුණුව අනිවාර්යය කිරීම. | ▪ වයස අවුරුදු 03 සිට 05 දක්වා සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක් ලබා දීම.<br>▪ සෑම දරුවෙකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර 2 ක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>▪ දරුවන්ගේ කායික හා මානසික තත්ත්වයන්ට ගැලපෙන පරිදි සහ සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප, සහ ආචාර ධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස ඉංග්‍රීසි ඇතුළු අනෙකුත් ජාතික භාෂා ඇතුළත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ බහු සංස්කෘතික විවිධත්වයට කටයුතු කිරීමට හුරුකරවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ දරුවන්ගේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක් පිහිටුවීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් සහිත, අනිවාර්යය වෘත්තීය පුහුණුව සහ අවම වැටුපක් හඳුන්වා දීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් සහ ශාඛා පද්ධතියක් (branch system) ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය | අධ්‍යාපනය සඳහා යහපත් සහ සුවපහසු පරිසරයක් පවතින බවට සහතික කිරීම.<br><br>සමාන සහ සියළු දෙනා අන්තර්කරණය වූ අධ්‍යාපනයක් සහතික කිරීම.<br><br>අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය සහතික කිරීම.<br><br>අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම.<br><br>සිසුන්ගේ දැනුම හා කුසලතා අඛණ්ඩව වර්ධනය කිරීම සහතික කිරීම<br><br>සිසුන්ගේ හැකියාවන් සහ කැමැත්ත මත පදනම්ව සාමාන්‍ය සහ තාක්ෂණ හෝ වෘත්තීය විෂය ධාරාවන් තෝරා ගැනීමට සිසුන් යොමු කරවීම සහතික කිරීම.<br><br>සංස්කෘතිය, සොබාදහම සහ මනුෂ්‍යත්වය පිළිබඳ සංවේදනය සහිත සිසුන් නිර්මාණය කිරීම.<br><br>ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීම සහතික කිරීම. | ▪ තම නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 3ක් ඇතුළත ප්‍රාථමික අධ්‍යාපනය සඳහා රජයේ පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ ළමා වියට බාධාවක් නොවන පරිදි බුද්ධිමය කුතුහලය සහ දැනුම වර්ධනය උත්තේජනය කරන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීම.<br>▪ අවම පහසුකම් පවත්වා ගැනීම සඳහා පාසල්වලට භෞතික හා මානව සම්පත් ලබා දීම.<br>▪ ජනගහනය සහ භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික පාසල් 2ක් හෝ 3ක් ආවරණය වන පරිදි කණිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ නවවන වසරේ පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගයේ ප්‍රතිඵල සහ පාසල් පාදක අඛණ්ඩ ඇගැයීම් වාර්තා මත පදනම්ව ශිෂ්‍යයාගේ විභවයට සහ රුචිකත්වයට සරිලන පරිදි විද්‍යා, කලා, වාණිජ, සහ තාක්ෂණ වැනි සාමාන්‍ය විෂය ධාරා හෝ වෘත්තීය විෂය ධාරාව (vocational education stream) (සෘජුවම වෘත්තියකට අදාළවන) තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම.<br>▪ අවශ්‍යතාවන් සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පාසල් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ සමාජ වටිනාකම් සහ පුරවැසි වගකීම් පිළිබඳ අවබෝධය ඇති කිරීම සඳහා අතිරේක විෂයයන් සහ ක්‍රියාකාරකම් හඳුන්වා දීම.<br>▪ සිසුන්ගේ හැකියාවන් සහ විශේෂ කුසලතා අනුව උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රධාන විෂයයන් තෝරා ගැනීමට ඉඩ ලබා දීම.<br>▪ සිසුන්ට ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යයන කාලය තුළ එක් විෂය ධාරාවකින් තවත් විෂය ධාරාවකට මාරුවිය හැකි නම්‍යශීලී විෂය මාලා හඳුන්වා දීම.<br>▪ සිය ආගම පිළිබඳව අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන් සකස් කිරීම.<br>▪ ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැළපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.<br>▪ සංස්කෘතිය, පරිසර හිතකාමීත්වය සහ සොබාදහම සංරක්ෂණය පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ නවෝත්පාදන, ජීවන කුසලතා සහ සමාජ දායකත්වය සඳහා අවශ්‍ය දැනුම සහ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ අධ්‍යාපන විෂය ධාරාවන්ට විශේෂිත වූ විෂයයන් මෙන්ම නිපුණතා වර්ධනය වන තාක්ෂණික සාක්ෂරතාව, භාෂා, ජීවන කුසලතා, සාහිත්‍යය රසවින්දනය සහ මූලික නීතිය ආදී පොදු විෂයයන් තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම.<br>▪ ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවයන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ පිරිවෙන් ඇතුළු රජයේ ආධාර ලබන පාසල් සඳහා ප්‍රමාණවත් මුදල් සහ අනෙකුත් පහසුකම් සපයා අධ්‍යාපනය ශක්තිමත් කිරීම. |
| ජාතික මට්ටමේ ඇගයීම් | විභාග චක්‍රයේ අඩංගු ක්‍රියාවලීන්හි නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. | ▪ සියලුම තාක්ෂණික සහ අනෙකුත් භෞතික පහසුකම් සහිත ජාතික විභාග ඇගයීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>▪ ජාතික විභාග ඇගයීම් කටයුතු මාසයක් ඇතුළත අවසන් කිරීම සහ මාස දෙකක් ඇතුළත ප්‍රතිඵල ලබා දිය හැකිවන පරිදි වාර්ෂික පාසල් දින දර්ශනයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ විභාග ඇගයීම් ක්‍රියාවලියට දායකවන පරීක්ෂකවරුන්ගේ බුද්ධිමය දායකත්වයට සරිලන ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම.<br>▪ විෂයමාලා සංවර්ධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ කටයුතු නියාමනය සහ පුළුල් කිරීම.<br>▪ ජාතික අධ්‍යාපන ආයතනය තුළ විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා පූර්ණ පහසුකම් සහිත විෂයමාලා සංවර්ධන ඒකකයක් පිහිටුවීම. |
| මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම | සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ශ්‍රම බලකාය සඳහා හිතකර සේවා පරිසරයක් සහතික කිරීම. | ▪ ගුරු හා විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කිරීම.<br>▪ ගුරු සේවා ව්‍යවස්ථාවක් සහ ගුරු සභාවක් ස්ථාපිත කිරීම.<br>▪ ගුරු වෘත්තිය ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ස්ථානගත කිරීම.<br>▪ ගුරු වෘත්තියට පිවිසීමට පෙර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වසරක වෘත්තීය පුහුණුවක් ලබා දීම.<br>▪ සියලු අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල ඒකාබද්ධ කර ජාතික අධ්‍යාපන විශ්වවිද්‍යාලයක් පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ගුරුවරුන් සඳහා සෑම වසර තුනකට වරක් පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>▪ විෂයමාලා සංවර්ධනය, පෙළපොත් සම්පාදනය සහ ඇගයීම් ක්‍රියාවලිය එකිනෙක සම්බන්ධ කොට පවත්වාගෙන යාමට අවශ්‍ය වන ආයතන අතර සම්බන්ධීකරණ ව්‍යුහයක් නිර්මාණය කිරීම.<br>▪ පාසල් පද්ධතිය තුළ සියලු ප්‍රජාවන් මුහුණ දෙන ලිංගික හෝ වෙනත් හිංසනයන් පිටුදැකීම සඳහා ශක්තිමත් ව්‍යුහයක් ඇති කිරීම. |
| වෘත්තීය අධ්‍යාපනය | නිශ්චිත රැකියා ක්ෂේත්‍ර වෙත සිසුන් යොමු කරන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක් සහතික කිරීම. | ▪ පෘථුල වෘත්තීය ක්ෂේත්‍රයන්හි ව්‍යවහාරික දැනුම ලබා ගනිමින් කිසියම් නිශ්චිත රැකියා ක්ෂේත්‍රයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු වන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක් හඳුන්වා දීම.<br>▪ සාමාන්‍ය අධ්‍යාපන ධාරාවට සමාන්තරව 10 වසරේ සිට 13 වසර දක්වා ඉදිකිරීම් සහ යටිතල පහසුකම්, නිර්මාණාත්මක කර්මාන්ත, ප්‍රාථමික කර්මාන්ත, සේවා කර්මාන්ත, සමාජ හා ප්‍රජා සේවා, නිෂ්පාදන සහ තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි නියැළීමට සිසුන් සූදානම් කිරීම සඳහා වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දීම.<br>▪ රැකියා වෙළෙඳපොළ ඉල්ලුම සහ ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳව නිර්දේශ කිරීම සඳහා කර්මාන්ත හා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් සමන්විත වෘත්තීය අධ්‍යාපන නියාමන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම. |
| උසස් අධ්‍යාපනය | රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තත්ත්ව සහතික (Quality Assurance) ඇති කිරීම.<br><br>රැකියා ඉලක්ක කරගත් උසස් තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම. | ▪ විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වයට ගරු කරමින්, එම විශ්වවිද්‍යාලවල අධ්‍යයන පාඨමාලා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම.<br>▪ සමාජීය විවිධත්වය නියෝජනය සහතික කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයන් පත්කිරීම.<br>▪ විශ්වවිද්‍යාල ගෞරවය ඉහළ නැංවෙන පරිදි උපකුලපතිවරුන් පත් කිරීම.<br>▪ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් විශ්වවිද්‍යාල සඳහා බාහිර පාලක සභා සාමාජිකයන් ලෙස ස්වාධීන පුද්ගලයන් පත් කිරීම.<br>▪ විශ්වවිද්‍යාලවල සෑම පාලක සභාවකම විවිධ වෘත්තීය ක්ෂේත්‍ර සහ ස්ත්‍රී පුරුෂ නියෝජනය සහතික වන පරිදි සාමාජිකයන් පත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමය තුළ රැකියා නියුක්තිය සහ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය සහතික කිරීම.<br><br>විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සංස්කෘතිය සහතික කිරීම.<br><br>උසස් අධ්‍යාපන පද්ධතියේ පාලන ආයතනවල තීරණාත්මක සහ ගෞරවනීය නිදහස සහතික කිරීම. | ▪ පාලක සභාවේ සාමාජිකයින් පත් කිරීම සඳහා පිළිගත් වෘත්තීය ආයතනවලින් ලබා ගන්නා පොදු නිර්දේශිත නම් ඇතුළත් සංචිතයක් පිහිටුවීම.<br>▪ කිසියම් විශ්වවිද්‍යාලයකින් විශ්‍රාමලත් තැනැත්තෙකු එම විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පත් කිරීමේ දී අවම වශයෙන් වසර පහකට පෙර විශ්‍රාම ගිය අය පමණක් පත් කිරීම.<br>▪ සුභසාධනය සහ අනෙකුත් ශිෂ්‍ය කටයුතු සඳහා පවතින සීමිත අවකාශය තුළ කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයෙක් අදාල විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ඡන්දයෙන් පාලක සභාවට පත් කිරීම.<br>▪ පාලක සභා සාමාජිකයකුගේ ධූර කාලය උපරිම වශයෙන් අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම.<br>▪ අධ්‍යයන අංශයක අංශාධිපති හෝ වසර තුනක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධූරයේ සුදුසුකම් ඇති සියලු පීඨ සාමාජිකයින්ට පීඨාධිපති ධූරය සඳහා පත්වීමට අවස්ථාව පැවතීම.<br>▪ පීඨාධිපතිවරයෙකුගේ කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම.<br>▪ විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් අහෝසි කිරීම.<br>▪ සෑම විශ්වවිද්‍යාලයකම අධ්‍යයන, අනධ්‍යයන සහ ශිෂ්‍ය ප්‍රජාවගේ දුක්ගැනවිලි සොයා බලා ඒවාට පිළියම් යෙදීමට සහ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පීඨ මට්ටමින් සහ විශ්වවිද්‍යාල මට්ටමින් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.<br>▪ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රමාදයන් ඉවත් කිරීම.<br>▪ එක් එක් පාඨමාලාව සඳහා අවම සුදුසුකම් හඳුනාගෙන, එම සුදුසුකම් සපුරාලන සියලු දෙනාටම අවස්ථාව ලැබෙන පරිදි තෘතීයික අධ්‍යාපන පද්ධතිය ක්‍රමිකව පුළුල් කිරීම.<br>▪ තෘතීයික අධ්‍යාපන ආයතනවල, දේශන ශාලා, පර්යේෂණාගාර, පුස්තකාල සහ ආපනශාලා වල අන්තර්ජාල පහසුකම් නිසි ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම.<br>▪ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ආයතනයකම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක හරහා සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කිරීම.<br>▪ උසස් පෙළ සමත් සිසුන්ට ජාත්‍යන්තර ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා වසරකට ශිෂ්‍යත්ව 200ක් පිරිනැමීම.<br>▪ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිදුවන නවක වදය, ලිංගිකත්වය හෝ වෙනත් ආකාරයේ හිංසනයන් වැළැක්වීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ ආබාධ සහිත සිසුන් සඳහා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>▪ ජීවන වියදමට සාපේක්ෂව මහපොළ සහ ශිෂ්‍යාධාර දීමනාව වැඩි කිරීම.<br>▪ පශ්චාත් උපාධි පර්යේෂණ සහ සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම.<br>▪ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සැපයීම.<br>▪ කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය දිරිමත් කිරීම.<br>▪ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයෙන් පසු තෘතීයික අධ්‍යාපන ප්‍රවේශ විභාගය සමත් වන අය සඳහා වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාල පද්ධතියෙහි ධාරිතාවය වර්ධනය කිරීම.<br>▪ හෙද විදුහල් ඒකාබද්ධ කොට ජාතික හෙද විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම |
| **පෞද්ගලික අධ්‍යාපනය** | ගුණාත්මකභාවය සහ දැරිය හැකි මිල සහතික කිරීම සඳහා පෞද්ගලික අධ්‍යාපනය විධිමත් කිරීම. | ▪ පවතින පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පාඨමාලා නියාමනය කිරීම සඳහා අධ්‍යාපන ආයතන නියාමන ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| වැඩිහිටි අධ්‍යාපනය | වැඩිහිටි ජනගහනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථා ඇති බවට සහතික කිරීම | ▪ ප්‍රාදේශීය අධ්‍යාපනික ආයතන, පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධව අවිධිමත් අධ්‍යාපනය ලබාදීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක් තුළම ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ පුරවැසියන් සඳහා මූලික නීතිය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| විවෘත හා දුරස්ථ අධ්‍යාපනය | විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පුළුල් කිරීම. | ▪ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පහසුකම් පුළුල් කිරීම. |

## 1.2 නිරෝගී ජීවිතයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ජනතාවට ගෞරවයෙන් සහ අභිමානයෙන් යුතුව සෞඛ්‍ය සේවා රැකවරණ පද්ධතියේ ප්‍රශස්ත ප්‍රතිලාභ භුක්ති විඳීමේ අයිතිය තහවුරු කිරීම.
- කිසිදු භේදයකින් තොරව පුරවැසියාට රෝග නිවාරණ සහ සෞඛ්‍ය ප්‍රතිකාර සේවා ලබා දීමට රාජ්‍යය වගවීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග වැළැක්වීම හා නිවාරණ සෞඛ්‍ය ප්‍රවර්ධනය.
- ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල සෞඛ්‍ය සේවාවන් ලබාදීම.
- රෝගීන්ගේ අයිතීන් සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ප්‍රශස්ත සෞඛ්‍ය සේවා කළමනාකරණය | සෞඛ්‍ය සේවයේ කාර්යක්ෂමතාව, සඵලතාවය සහ සාධාරණත්වය වැඩි දියුණු කිරීම. | ▪ සෞඛ්‍ය සේවය සඳහා රජය විසින් දරනු ලබන වියදම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 3% ඉලක්ක කර ගනිමින් ක්‍රමිකව වැඩි කිරීම.<br>▪ ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් යුතුව අරමුදල් භාවිතා කිරීම සහ සෞඛ්‍ය සේවාවේ දූෂණ තුරන් කිරීම. |
| ඩිජිටල්කරණය වූ සෞඛ්‍ය සේවාවක් | ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ උපයෝගී කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශය පරිවර්තනය කිරීම. | ▪ සෞඛ්‍ය සේවා සැපයීමේ සඵලතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රෝගීන්ගේ වාර්තා සහ තොරතුරු ඩිජිටල්කරණය කිරීම.<br>▪ සෞඛ්‍ය සේවා ආයතනවල පොරොත්තු කාලය අවම කිරීම සඳහා වෛද්‍ය හමුවීම් සඳහා මාර්ගගත ලියාපදිංචිය ක්‍රියාත්මක කිරීම. |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග නිවාරණය | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය සහතික කිරීම. | ▪ බෝ නොවන රෝගවල සංකූලතා කල්තියා හඳුනාගෙන පාලනය කිරීම හා ප්‍රතිකාර කිරීමට ප්‍රජා පාදක යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ අවුරුදු 40 ට වැඩි සියලුම වැඩිහිටියන් සඳහා වාර්ෂික සෞඛ්‍ය පරීක්ෂණ පැවැත්වීම.<br>▪ ව්‍යායාම, ඇවිදීම සහ බයිසිකල් පැදීම වැනි සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් දිරිමත් කිරීම.<br>▪ සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට හා අවදානමට ලක්විය විය හැකි හැසිරීම් ඇති පාසල් දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ උග්‍ර හා නිදන්ගත මන්දපෝෂණය සහ තරබාරුකම පාලනය කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පිහිටුවීම. |
| ආහාර සුරක්ෂිතතාව | ආහාර සුරක්ෂිතතා පිළිබඳ නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම. | ▪ ආහාර සම්බන්ධ වෙළඳ දැන්වීම් නියාමනය කිරීම සඳහා ආයතනයක් සහ පාරිභෝගිකයින්ට නිවැරදි තොරතුරු සහිත වෙළඳ දැන්වීම් සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම.<br>▪ ප්‍රමිතීන්ට අනුකූල නොවන ආහාරපාන නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම සහ අලෙවි කිරීම පාලනය කිරීම.<br>▪ අන්තර්ගතය සඳහන් කොට ආහාර නිසි ලෙස ලේබල් කිරීම අනිවාර්ය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| වෘත්තීය සෞඛ්‍යය ආරක්ෂාව සහ යහපැවැත්ම | සේවකයන් සඳහා හිතකර පරිසරයක් සහතික කිරීම. | ▪ හඳුනාගත් වෘත්තීය ආයතන සඳහා කාර්යයේ ස්වභාවය අනුව සේවක සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකොට සහතික පිරිනැමීම.<br>▪ සේවයේ යෙදී සිටියදී හදිසි අනතුරකට මුහුණ දෙන සේවකයකුගේ වෛද්‍ය වියදම් සහ රැකියාවට නැවත පැමිණෙන තෙක් සුදුසු දීමනාවක් ලබාදීමට සේවා යෝජකයා විසින් වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| වැඩිහිටි රැකවරණය | ආර්ථිකය සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දියහැකි සෞඛ්‍ය සම්පන්න සහ ක්‍රියාකාරී වැඩිහිටි සමාජයක් සහතික කිරීම. | ▪ වැඩිහිටි ප්‍රජාවට කායික හා මානසික සෞඛ්‍ය සමතුලිතතාවක් සහිත නිරෝගී ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරකම් සහිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>▪ සේවාවන්ගෙන් විශ්‍රාම ගැන්වීමට පෙර විශ්‍රාම යාමෙන් අනතුරුව ක්‍රියාශීලි ජීවන රටාව පවත්වාගෙන යාමට අවශ්‍ය ශාරීරික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය උදෙසා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ රෝග නිවාරණ ආයතනවල විශේෂ වැඩිහිටි සායන හඳුන්වා දීම. |
| ප්‍රාථමික සත්කාර | ප්‍රාථමික සත්කාර ඒකක සඳහා සම්මත සත්කාර පැකේජයන් ලබා දීම සහතික කිරීම.<br><br>ප්‍රාථමික සත්කාර පහසුකම් ශක්තිමත් කිරීම සහ යොමු කිරීමේ ක්‍රමය(referral system) බලාත්මක කිරීම. | ▪ ජනගහනයෙන් 5,000 සිට 10,000 දක්වා ආවරණය වන පරිදි පවුල් වෛද්‍යවරයෙක් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් ඇති කිරීම.<br>▪ රෝගීන් සඳහා ඵලදායි අඛණ්ඩ සත්කාර සැපයීම සඳහා ප්‍රාථමික සත්කාර ආයතන ලෙස ප්‍රාථමික ප්‍රතිකාර ඒකක සහ ප්‍රාදේශීය රෝහල්, ද්විතියික සත්කාර ඒකක ලෙස මූලික රෝහල් සහ තෘතීයික සත්කාර ඒකක ලෙස දිස්ත්‍රික් මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් එක් පොකුරක් ලෙස පොකුරුගත කිරීම.<br>▪ පවුලේ වෛද්‍ය ඒකක ප්‍රදේශයන්හි රෝගීන්ට විශේෂිත සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පර්යන්ත සායනික සේවා (විශේෂඥ උපදේශකයින්ගේ පැමිණීම) ස්ථාපිත කිරීම (Satellite Clinics)<br>▪ මනෝ කථන, ශ්‍රවණ, වෘත්තීය සහ ප්‍රජා භෞතචිකිත්සා සඳහා පහසුකම් ස්ථාපිත කිරීම. |
| ද්විතීයික සත්කාර | ද්විතීයික සත්කාර ආයතනවල සම්මත සත්කාර පැකේජය ලබා දීම සහතික කිරීම | ▪ රෝහල්වලට ඇතුළත් කරනු ලබන සෑම නේවාසික රෝගියෙක් සඳහාම ඇඳක් සහ අනෙකුත් පහසුකම් සහතික කිරීම.<br>▪ සෑම වාට්ටුවකම වාට්ටු කළමනාකරණය සහ හෙද සත්කාර සැලස්ම යාවත්කාලීන කිරීම සහ සියලුම රෝගීන් සඳහා හෙද සත්කාර වැඩිදියුණු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ සෑම රෝහලකම එක්දින ප්‍රතිකාර සේවා ආරම්භ කිරීම.<br>▪ රජයේ සෞඛ්‍ය ආයතනවල සිදු කරනු ලබන සියලුම රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රියා පටිපාටි සඳහා ISO ප්‍රමිතීන් සහතික කිරීම සහ ප්‍රතිඵල අර්ථකථනය කිරීම සඳහා වෛද්‍යවරයකුගේ සහ හෙද නිලධාරීයෙකුගේ සේවය පැය 24 පුරා දුරකථන මාර්ගයෙන් ලබා ගත හැකිවන ක්‍රමවේදයක් ඇති කිරීම.<br>▪ වෘත්තිකයන් සහ සියලුම ප්‍රජා කණ්ඩායම්වල සහභාගීත්වයෙන් රෝහල් සංවර්ධන කමිටු ප්‍රතිසංවිධානය. |
| තෘතියික සහ විශේෂිත සත්කාර | විශේෂිත ප්‍රතිකාර අවශ්‍ය සෑම රෝගියෙකුටම එම ප්‍රතිකාර ලබාගැනීමට ඇති හැකියාව සහතික කිරීම | ▪ සුදුසු පරිදි සෑම දිස්ත්‍රික්කයකම/පළාතකම පහසුකම් සහිත විස්තීරණ හෘද රෝග ඒකකයක්, විස්තීරණ පිළිකා සත්කාර ඒකකයක්, අක්ෂි සත්කාර ඒකකයක් සහ වකුගඩු සත්කාර ඒකකයක් පිහිටුවීම. |
| රෝගීන්ගේ ආරක්ෂාව | සෞඛ්‍ය සේවකයින්ගේ වගවීම සහතික කිරීම | ▪ සේවා සැපයීමේදී සෞඛ්‍ය සේවකයින්ගේ වගකීම තහවුරු කිරීම සහ රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රෝගී ප්‍රඥප්තියක් හඳුන්වා දීම.<br>▪ "වැළැක්විය හැකි මරණ ශුන්‍ය කිරීම" තේමා පාඨය කර ගනිමින් ගුණාත්මක සෞඛ්‍ය සේවා සහතික කිරීම.<br>▪ රෝගීන්ගෙන් සහ භාරකරුවන්ගෙන් ලැබෙන පැමිණිලි ස්වාධීනව විමර්ශනය කිරීමට සේවා ප්‍රතිචාර ඒකකයක් ස්ථාපිත කිරීම. |
| හදිසි ප්‍රතිකාර | හදිසි වෛද්‍ය ප්‍රතිචාර වැඩි දියුණු කිරීම | ▪ සුවසැරිය ඇතුළු අනෙකුත් ගිලන් රථ සේවා සඳහා පුහුණු හදිසි සෞඛ්‍ය ප්‍රතිකාර කණ්ඩායම් අනුයුක්ත කිරීම. |
| අත්‍යාවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබාදීම | ඖෂධ සැපයුම් දාමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | ▪ ඖෂධවල ආරක්ෂාව සහතික කිරීම සඳහා කාර්යක්ෂම ඖෂධ පරීක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම.<br>▪ දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම.<br>▪ ඖෂධ ආනයනයේදී හා බෙදාහැරීමේදී සිදුවන දූෂණ හා වංචා මුළුමනින්ම ඉවත් කිරීම.<br>▪ රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලුම අත්‍යාවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම.<br>▪ ඖෂධවල ගුණාත්මකභාවය සහ සාධාරණ මිල සහතික කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ■ නිසි තොග පවත්වා ගනිමින් ඖෂධ හිඟය වලක්වා ගැනීම.<br>■ සෑම නගරයකම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අලෙවිසැල් ස්ථාපිත කිරීම. |
| මානසික සෞඛ්‍යය රැකවරණය | මානසික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම. | ■ සෑම දිස්ත්‍රික්කයකම මානසික සෞඛ්‍ය ආබාධ කල්තියා හඳුනාගැනීමේ සහ විශේෂ සත්කාර සඳහා යොමු කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.<br>■ ප්‍රාථමික මානසික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන (Primary Mental Health Care centers) සුදුසු පරිදි සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශයකම පිහිටුවීම.<br>■ ළමා හා නව යොවුන් වියේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතය ඇබ්බැහිවීම සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>■ මානසික ආබාධ සහිත රෝගීන් සඳහා ප්‍රතිකාර පිළිපැදීම, පසු විපරම් කිරීම සහ පවුල් ප්‍රතිකාර දිරිමත් කිරීම සඳහා ප්‍රජා පාදක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. |
| පුනරුත්ථාපන සත්කාර සහ සහන සත්කාර | ප්‍රජා සහභාගීත්වය තුළින් පුනරුත්ථාපන සේවා සහ සහන සත්කාර ශක්තිමත් කිරීම. | ■ සෑම දිස්ත්‍රික්කයකම පුනරුත්ථාපන සත්කාර සහ සහන සත්කාර මධ්‍යස්ථාන ඇති කිරීම<br>■ රෝගියාගේම වාසස්ථානයක හෝ විශේෂ මධ්‍යස්ථානයක පුනරුත්ථාපනය සඳහා ප්‍රජාපාදක පුනරුත්ථාපන සත්කාර ක්‍රමවේදයක් ඇති කිරීම.<br>■ පිළිකා සහ ආඝාත ඇතුළු සුව කළ නොහැකි රෝගීන් සඳහා නිවෙස් පදනම් කරගත් සහ ආයතන පදනම් කරගත් සහන සත්කාර සේවා ඇති කිරීම. |
| මුඛ සෞඛ්‍ය සේවා | මුඛ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම. | ■ විශේෂ මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| වතු අංශයේ සෞඛ්‍ය සේවාව | වතු අංශයේ රෝග නිවාරණය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශවීමේ හැකියාව වැඩි කිරීම. | ■ වතු ප්‍රජාව ආශ්‍රිතව පෝෂණ තත්වය, මුඛ සෞඛ්‍යය, ක්ෂය රෝග පාලනය, මධ්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් සකස් කිරීම. |
| දේශීය වෛද්‍ය සේවා | ජාතික හා ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලීම සඳහා සාම්ප්‍රදායික වෛද්‍ය සේවාවන්හි ධාරිතාව වැඩි දියුණු කිරීම. | ■ ආයුර්වේද රෝහල් පරිපාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම මගින් ආයුර්වේද, සිද්ධායුර්වේද සහ යුනානි අංශයේ වෛද්‍ය ප්‍රතිකාර පුළුල් කිරීම.<br>■ හිඟයකින් තොරව ඖෂධ නිෂ්පාදනය කිරීමට ආයුර්වේද/යුනානි/සිද්ධ රසායනාගාර වැඩිදියුණු කිරීම.<br>■ ආයුර්වේද රෝහල්වල ඇඳන් ඇතුළු ප්‍රතිකාර සැපයීමේ ධාරිතාවය ඉහළ නැංවීම.<br>■ ආයුර්වේද රෝහල්වලට අනුබද්ධ ශික්ෂණ පද්ධතිය පුළුල් කිරීම.<br>■ දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා වගා කිරීම සහ පර්යේෂණ දිරිමත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ පාරම්පරික ප්‍රතිකාර ක්‍රම සහ ඖෂධ පිළිබඳ නව පර්යේෂණ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම. |
| ශ්‍රී ලංකාවේ වෛද්‍ය සංචාරක ව්‍යාපාරය | වෛද්‍ය හා සුවතා සංචාරක ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | ▪ තෝරාගත් රජයේ රෝහල්වල අති නවීන පහසුකම් සහ හොඳින් පුහුණු වූ වෛද්‍ය විශේෂඥයින් සමඟ බටහිර සහ ආයුර්වේද සංචාරක සෞඛ්‍ය සේවා සැපයීම. |
| පෞද්ගලික වෛද්‍ය සේවය | පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාරවල ගුණාත්මකභාවය සහ දැරිය හැකි මිල සහතික කිරීම | ▪ රෝගීන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ලබාදීම සඳහා පෞද්ගලික වෛද්‍ය සේවාවන් ඇතුළු සියලුම සෞඛ්‍ය සේවා නියාමනය කිරීම. |

## 1.3 සුවපහසු නිවසක් - සනීපාරක්ෂක ජීවිතයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සෑම පුද්ගලයෙකුටම සෞඛ්‍යාරක්ෂිත නිවසක්
- ඵලදායී ඉඩම් කළමනාකරණය
- අංගසම්පූර්ණ නිවාස සංකීර්ණ

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| නාගරික නිවාස | පවත්නා ඉඩම් ඵලදායී භාවිතය තුළින් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ඇතිකරලීම සඳහා සුවපහසු නිවාස සැපයීම සහතික කිරීම. | ▪ නාගරික ප්‍රදේශවල දැරිය හැකි මිලකට මහල් නිවාස ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම හා ඒ සඳහා යෝග්‍යය ඉඩම් සැපයීම<br>▪ දැරිය හැකි මිලකට නාගරික මහල් නිවාස ව්‍යාපෘති සඳහා විදෙස් ගත ශ්‍රී ලාංකිකයන්ගේ ආයෝජන දිරි ගැන්වීම<br>▪ රාජ්‍ය නිලධාරීන් සඳහා සේවා ස්ථාන සමීපයේ නිල නිවාස ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>▪ රජයේ මැදිහත්වීම තුළින් කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී නිවාස වල ජීවත්වන ජනතාවට දැරිය හැකි මිලකට නිවාස ලබා දීම සඳහා පහසුකම් සැලසීම<br>▪ නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල සෞඛ්‍යය, අධ්‍යාපන, ක්‍රීඩා, ප්‍රවාහන, සහ උද්‍යාන යනාදී අත්‍යවශ්‍යය පහසුකම් සහිත අංගසම්පූර්ණ නිවාස ව්‍යාපෘති සංවර්ධනය කිරීම |
| ග්‍රාමීය නිවාස | | ▪ නිවාස සංවර්ධනය සඳහා වන ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු විසඳීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීම<br>▪ නේවාසික ප්‍රදේශ වෙත ප්‍රවේශ මාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම<br>▪ නිවාස පහසුකම් සඳහා සුදුසු නිවාස ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම |
| වතු නිවාස | | ▪ මලයාගම් සහ අනෙකුත් වතු ආශ්‍රිත ප්‍රජාවගේ නිවාස, ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමට මූල්‍ය හා යටිතල පහසුකම් සැපයීම<br>▪ මලයාගම් ප්‍රජාවට ස්ථිර නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දීම<br>▪ වතු ආශ්‍රිත ප්‍රදේශවල දැරිය හැකි මිළකට නිවාස යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම |
| තරුණ තරුණියන් සඳහා නිවාස | | ▪ තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම් ලබා දීම |

## 1.4 ජවසම්පන්න පුරවැසියෙක් - ජයග්‍රාහී ජනතාවක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සහභාගීත්වය, විනයගරුක බව, විශ්වාසය සහ තරඟකාරිත්වය
- ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීයභාවය සහ විශිෂ්ටත්වය
- ප්‍රමාණවත් යටිතල පහසුකම්
- සාධාරණ ප්‍රවේශය
- ජාත්‍යන්තර සහයෝගීතාව
- රාජ්‍ය, පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන සහයෝගීතාවය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ක්‍රීඩා ප්‍රතිපත්තිය, නීති සම්පාදනය සහ විධිමත් පාලනය | විනිවිදභාවය සහ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා ක්‍රීඩා ප්‍රතිපත්ති, නීති සම්පාදනය සහ පාලනය ප්‍රතිසංස්කරණය කිරීම සහ ශක්තිමත් කිරීම | ▪ ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් හා පවත්නා ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීම<br>▪ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා ජාතික ක්‍රීඩා කොමිසමක් පිහිටුවීම.<br>▪ ජාතික ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම.<br>▪ ක්‍රීඩා ආයතනවල දූෂණ හා අක්‍රමිකතා විමර්ශණය කිරීම<br>▪ නීති විරෝධී ඖෂධ භාවිතය, තරඟ පාවාදීම් සහ වෙනත් අක්‍රමිකතා ඇතුළු ක්‍රීඩා වල දූෂණ හා වංචා පිටුදැකීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.<br>▪ දේශපාලනීකරණය වූ ක්‍රීඩා ආයතන ස්වාධීන ආයතන බවට පත් කිරීම.<br>▪ ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව බලාත්මත කිරීම වේගවත් කිරීම. |
| යටිතල පහසුකම් සංවර්ධනය | ක්‍රීඩා පහසුකම් සහ සම්පත් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම | ▪ නිසි නියාමනයක් සහතික කරමින් රට පුරා ක්‍රීඩා සහ විනෝදාස්වාද පහසුකම් සඳහා සහය දැක්වීම සහ වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ගික ආයෝජන සැලැස්මක් සකස් කිරීම<br>▪ ක්‍රීඩා පහසුකම් පිළිබඳ ජාතික දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.<br>▪ සියලුම පාසල් සඳහා ක්‍රීඩා උපකරණ සහ පහසුකම් සාධාරණ ලෙස බෙදා හැරීම<br>▪ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අංග සම්පූර්ණ ක්‍රීඩා පිටි ඉදි කිරීම<br>▪ සෑම පළාතකම නේවාසික පහසුකම් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය සහිත නවීන ක්‍රීඩා සංකීර්ණ පිහිටුවීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා පොදු ක්‍රීඩා පිටි, ව්‍යායාම ශාලා සහ පිහිනුම් තටාක සඳහා වැඩි ප්‍රවේශයක් සහතික කිරීම |
| කුසලතා හඳුනා ගැනීම, සංවර්ධනය සහ පුහුණුව | දක්ෂතා සහිත පුද්ගලයින් සඳහා පාසලේ සිට ජාතික මට්ටම දක්වා අවස්ථාවන් ලබා දීම සහතික කිරීම | ▪ දක්ෂ දරුවන් හඳුනාගෙන ඔවුන්ගේ ක්‍රීඩා දියුණුව සඳහා සහාය වීම.<br>▪ සුවිශේෂී කුසලතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ආර්ථික සහය, පෝෂණය සහ පුහුණුව ලබාදීම සඳහා පාසල් සහ දිස්ත්‍රික් මට්ටමින් විශේෂිත වැඩසටහන් සංවර්ධනය කිරීම.<br>▪ සියලුම රජයේ පාසල්වලට ක්‍රීඩා ගුරුවරුන් සහ පුහුණුකරුවන් ලබා දීම<br>▪ ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඒකාබද්ධ ක්‍රීඩා පුහුණු වැඩසටහනක් නිර්මාණය කිරීම.<br>▪ ආබාධ සහිත සිසුන් සඳහා පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ ආබාධ සහිත සිසුන් සඳහා ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම. |
| ක්‍රීඩාව වෘත්තියක් ලෙස | ක්‍රීඩාව වෘත්තීයකරණය සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ | ▪ සාධාරණ වැටුප් සහ ප්‍රතිලාභ සහතික කරමින් පුහුණුකරුවන් සහ ක්‍රීඩා කළමනාකරුවන් සහතිකකරණය සහ බලපත්‍ර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා සහාය ලබා දීම | ▪ ජාතික ක්‍රීඩා සංචිතයේ ලියාපදිංචි ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සහ තාක්ෂණික නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් සහ රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍ර කරගනිමින් සියලුම පළාත් පුරා නවීන ක්‍රීඩා පාසල් ජාලයක් ස්ථාපිත කිරීම.<br>▪ ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥතාවක් සහිත ශාරීරික අධ්‍යාපනය සඳහා වෘත්තිකයන් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාල උපාධි වැඩසටහන් සංඛ්‍යාව වැඩිකිරීම.<br>▪ ක්‍රීඩා මාධ්‍ය වෘත්තිකයන් සඳහා ව්‍යුහගත අධ්‍යාපනික වැඩසටහන් සංවර්ධනය කිරීම |
| ජාත්‍යන්තර විශිෂ්ටත්වය සහ තරඟකාරිත්වය | ක්‍රීඩාවේ වෘත්තීයභාවය සහ ජාත්‍යන්තර සාර්ථකත්වය ළඟා කර ගැනීම | ▪ ක්‍රීඩා පර්යේෂණ සඳහා ජාත්‍යන්තර විශිෂ්ටතා මධ්‍යස්ථානයක් පිහිටුවීම<br>▪ ආබාධ සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තරඟ සඳහා සහය වීම පුළුල් කිරීම.<br>▪ දැනුම සහ ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ විශේෂඥතාව හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. |
| ක්‍රීඩා හරහා සෞඛ්‍ය සහ සුවතාවය | මහජන සෞඛ්‍යයට ක්‍රීඩාව ඒකාබද්ධ කිරීම සහ සුවතාවය ප්‍රවර්ධනය කිරීම | ▪ මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති සමඟ ක්‍රීඩාව ඒකාබද්ධ කිරීම<br>▪ සියලුම පාසල් දරුවන් අවම වශයෙන් එක් ක්‍රීඩාවකට හෝ සහභාගී වන බවට සහතික කිරීම<br>▪ ප්‍රජා ශාරීරික සුවතා මධ්‍යස්ථාන 1,000ක් පිහිටුවීම |
| කර්මාන්තයක් ලෙස ක්‍රීඩාව දියුණු කිරීම | කර්මාන්තයක් ලෙස ක්‍රීඩාව දියුණු කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සම්බන්ධීකරණ ප්‍රවේශයක් ඇති කිරීම | ▪ රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සම්බන්ධීකරණ ප්‍රවේශයක් හරහා ක්‍රීඩාව කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.<br>▪ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ආයෝජකයින් සහ දේශීය ක්‍රීඩා උපකරණ නිෂ්පාදකයින් සඳහා විශේෂ සහන ලබා දීම.<br>▪ ප්‍රධාන ආර්ථික අංශයක් ලෙස ක්‍රීඩා සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සහ පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් පැවැත්වීම දිරිමත් කිරීම. |

## 1.5 උදාර සංස්කෘතික ජීවිතයක්, සහකම්පනීය ජනතාවක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සෑම ප්‍රජාවකගේම සංස්කෘතික අනන්‍යතාවය, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීමේ අයිතිය
- සංස්කෘතියේ දියුණුව උදෙසා සෑම ප්‍රජාවකටම සහ පුද්ගලයකුට මැදිහත් වීමට ඇති අයිතිය
- අන්තර් සංස්කෘතික පෝෂණය සහ පරිණාමය
- දේශීය හා විදේශීය සංස්කෘතික දැනුම අත්පත් කර ගත් බුද්ධිමත්, අධ්‍යාත්මික හා සෞන්දර්යාත්මක ශක්තියෙන් යුතු සහකම්පනීය මිනිසෙක් සැකසීම
- සංස්කෘතික විවිධත්වය හා සංස්කෘතික විචාරය පිළිගැනීම
- දේශපාලන මැදිහත්වීමෙන් තොර වූ සංස්කෘතික අංගයන්
- සංස්කෘතික වශයෙන් පොහොසත් වූ සමාජයක් නිර්මාණය කිරීම සඳහා රජයේ සහයෝගය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| විවිධාංගීකරණය වූ සංස්කෘතියක් | සංස්කෘතිය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම | ▪ සංස්කෘතිය යන්න පුළුල් හා ගතික විෂය පථයක් ලෙස නිරූපණය කෙරෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.<br>▪ ජාතික හා විශ්ව සාහිත්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, නාට්‍ය, නර්තනය, දෘශ්‍ය කලාව, මූර්ති හා ඡායාරූපකරණය සහ ගීත සාහිත්‍ය ආදිය ඇතුලත්වන ලෙස පාසල් විෂය නිර්දේශ නවීන ප්‍රමිතීන්ට ගැලපෙන ලෙස යාවත්කාලීන කිරීම.<br>▪ අධ්‍යාපන පද්ධතිය යනු සංස්කෘතික සමාජයක් ගොඩනැගීමේ පදනම ලෙස සලකා විධිමත් අධ්‍යාපන ක්‍රමයට කලා හා සංස්කෘතික විෂයයන් ඒකාබද්ධ කිරීම සහ මෙම විෂයයන් වඩාත් ආකර්ෂණීය වූ ද බුද්ධි ප්‍රබෝධනයට තුඩු දෙන්නාවූ ද ආකාරයට ඉගැන්වීම පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් ගුරුවරුන්ට ලබා දීම.<br>▪ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ අඛණ්ඩ දායකත්වය සහිතව සාහිත්‍යය, සිනමාව, නාට්‍යය, හා අනෙකුත් කලා කටයුතු සඳහා "ජාතික අරමුදලක්" ගොඩනැගීම.<br>▪ ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාලා භාවිත කර කලා රසවින්දනය දියුණු කිරීම සහ මහජන කතිකාව දියුණු කරමින් 21 වන සියවසේ දී සංස්කෘතික වශයෙන් පොහොසත් වූ සමාජයක් බිහි කිරීම.<br>▪ සංස්කෘතිය, යෞවනයා වෙත සමීප වන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම මඟින් නව සංස්කෘතික පුරවැසියකු බිහි කිරීම.<br>▪ සෑම කලා ක්ෂේත්‍රයකම නව දැනුම හා පුහුණුව ලබා ගැනීම සඳහා සුදුසු පුද්ගලයින් ජාත්‍යන්තර ආයතන වෙත යොමු කිරීමට ශිෂ්‍යත්ව පිරිනැමීම.<br>▪ සෑම ප්‍රධාන නගරයකම කලා - සංස්කෘතික ආයතන සහිතව සංස්කෘතික කලාපය ගොඩනගා එම කලාපය වෙත පුරවැසියන් නිරන්තරයෙන් ආකර්ෂණය කර ගන්නා වැඩසටහන් දියත් කිරීම.<br>▪ කලාකරුවන්ගේ නිර්මාණ අයිතිය ඇතුළත්ව බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා ලෝක බුද්ධිමය දේපළ හිමිකම් සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ශක්තිමත් බුද්ධිමය දේපළ නීතියක් බලාත්මක කිරීම.<br>▪ විශ්ව සාහිත්‍ය සහ නාට්‍ය පිටපත් භාෂාවලට පරිවර්තනය දිරිමත් කිරීම සහ ජාත්‍යන්තර පරිවර්තන අයිතීන් විධිමත්ව ආරක්ෂා කිරීම.<br>▪ දැනට ක්‍රියාත්මක රාජ්‍ය සම්මාන උළෙලවල දූර්වලතා සමාලෝචනය කර, සියලු කලා ක්ෂේත්‍ර අළලා ජාතික සම්මාන උළෙලක් සංවිධානය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ කඩදාසි වැනි තෝරාගත් ද්‍රව්‍ය සහ උපකරණ සඳහා විවිධ කලා අංශ සඳහා බදු නිදහස් කිරීම් ලබාදීම.<br>▪ කලා ක්ෂේත්‍රවල විශ්‍රාමිකයන්ගේ සුබසාධනය පිණිස වන සමාජ ආරක්ෂණ ක්‍රමයක් කිරීම.<br>▪ කලා හා සංස්කෘතික ක්ෂේත්‍රයට සම්බන්ධ සම්මන්ත්‍රණ ශාලා, රඟහල, එළිමහන් රංග පීය ආදී භෞතික යටිතල පහසුකම් සම්පත් සංගණනයක් කොට දත්ත පද්ධතියක් සැකසීම සහ ඒවා අදාල ක්ෂේත්‍ර වෙත ලබා දීමේ සංයුක්ත සැලැස්මක් සැකසීම.<br>▪ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්නා සංස්කෘතික මධ්‍යස්ථාන, වේදිකා, පුහුණුවීම්, ආලෝකකරණ, ශබ්ද ආදී පහසුකම් සහිතව බහුකාර්ය සංස්කෘතික කේන්ද්‍ර බවට පරිවර්තනය කොට, පොත් දොරට වැඩුම්, වැඩමුළු, සංවාද, ප්‍රදර්ශන ආදී සංස්කෘතික අත්දැකීම් මෙම මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වා ගෙන යාමට කටයුතු කිරීම. |
| සාහිත්‍යය | සාහිත්‍යය හා ජනතාව අතර ඇති බැඳියාව වැඩි දියුණු කිරීම | ▪ සාහිත්‍ය කෘති අතරින් ජාතික මට්ටමින් ඇගයීමට ලක් වන හා හඳුනාගන්නා ප්‍රකාශන පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල වෙත බෙදා හැරීම.<br>▪ සක්‍රීය පාඨක සමාජ පිහිටුවීම සඳහා සෑම නගරයකම හා උප නගරයකම දියුණු පුස්තකාල ඇති කිරීම.<br>▪ සාහිත්‍ය විචාරය සහ රස වින්දනය සඳහාම වෙන් වූ සඟරා සංස්කෘතියක් යළි ඇති කිරීම.<br>▪ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පොත් ප්‍රදර්ශන සංවිධානය සහ ප්‍රකට විදේශීය පොත් ප්‍රදර්ශන සඳහා සහභාගි වීමට ලේඛකයන් හා ප්‍රකාශකයන් දිරිමත් කිරීම.<br>▪ පාසල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඉලක්ක කරගත් සාහිත්‍ය රසවින්දන වැඩසටහන් සංවිධානය මගින් අලුත් පාඨක පිරිසක් ගොඩනැගීම.<br>▪ විශිෂ්ට විශ්ව සාහිත්‍ය කෘති සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම, දිරිමත් කිරීම සහ එවැනි පරිවර්තනවල යෙදෙන අයට සහයෝගය ලබාදීම.<br>▪ නවීන උසස් තාක්ෂණය ලබාදීම මඟින් ජාතික ලේඛනාගාරය නවීකරණය සහ ප්‍රතිසංවිධානය කිරීම.<br>▪ අධ්‍යාපන සහ පර්යේෂණ කේන්ද්‍රවලට අනුබද්ධිත වූ විද්‍යුත් ප්‍රකාශන හා පුස්තකාල සඳහා ඩිජිටල් කෝෂ්ඨාගාර පවත්වාගෙන යාම හා කළමනාකරණය දිරිමත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ක්‍රමානුකූලව පර්යේෂණ කටයුතු සඳහා සම්පත් ලබාදීම සහ වාර්ෂික පර්යේෂණ සැසි පවත්වාගෙන යාම සඳහා සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පර්යේෂණ අරමුදලක් පිහිටුවීම. |
| චිත්‍රපට හා ටෙලි නාට්‍ය | ඵලදායී හා කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම සහ සුදුසු ව්‍යුහාත්මක පියවරයන් තුළින් චිත්‍රපට සහ ටෙලි නාට්‍ය සංවර්ධනය සහතික කිරීම | ▪ ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රතිසංවිධානයකට යොමු කර ජාතික චිත්‍රපට ආයතනයක් බිහිකිරීම.<br>▪ විධිමත් සැලැස්මකට අනුව සිනමා ශාලා නවීකරණය කිරීම සහ සෑම දිස්ත්‍රික්කයක් සඳහාම සිනමා ශාලා 03 ක් ඇති කිරීම.<br>▪ චිත්‍රපට හා ටෙලි නාට්‍ය නිෂ්පාදනයට අවශ්‍ය ණය සහ වෙනත් සහන ආදිය ප්‍රමිතිගත කිරීම.<br>▪ විධිමත් වර්ගීකරණයට අනුව සෑම සිනමා කෘතියක්ම බෙදා හැරීමේදී සාධාරණ හා සංවිධානාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරීම.<br>▪ සිනමා හා රූපවාහිනී කෘති ප්‍රමිතිගත කිරීම සඳහා වර්ගීකරණ මණ්ඩලයක් ස්ථාපිත කිරීම.<br>▪ වාර්ෂික ජාත්‍යන්තර සිනමා උළෙලවල් පැවැත්වීමට සත්කාරකත්වය දැක්වීම සහ ඒ සඳහා ඉදිරිපත් කිරීම සඳහා සහයෝගය දැක්වීම.<br>▪ බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන උපයෝගී කරගනිමින් විශිෂ්ට සිනමා කෘති ප්‍රදර්ශනය කිරීම හා ඒ ඇසුරින් සිනමා - කලා සංවාද සංවිධානය කිරීම.<br>▪ නැගීඑන සිනමාකරුවන් වෙනුවෙන් ජාතික ටෙලි - සිනමා අධ්‍යයන ආයතනයක් සහ ජාතික සිනමා සංරක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම.<br>▪ දැනට පවතින පෞද්ගලික චිත්‍රපට ලේඛනාගාර ජාතික ලේඛනාගාර ජාලයට ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම.<br>▪ පාසල් මට්ටමින් රූපවාහිනී- සිනමා සමාජ ආරම්භ කිරීම.<br>▪ ටෙලි - සිනමා නිර්මාණවල බුද්ධිමය දේපළ සම්බන්ධ නෛතික රාමුව ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව යාවත්කාලීන කිරීම.<br>▪ ජාත්‍යන්තර සිනමා උළෙලවල් මඟින් දැනුම හා අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය පරිදි වාර්ෂිකව කෙටි හා ජංගම චිත්‍රපට වැඩසටහන් නිර්මාණය කිරීම. |
| වේදිකා නාට්‍ය | සුදුසු ප්‍රතිසංස්කරණ සහ ව්‍යුහාත්මක | ▪ සමකාලීන නාට්‍ය කලාව පිළිබඳ ජාතික පර්යේෂණ හා පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | ක්‍රියාමාර්ග හරහා සංස්කෘතික විවිධාංගීකරණය සහතික කිරීම | ▪ පැරණි හා නව නාට්‍ය නිෂ්පාදන හා සම්බන්ධ පිටපත්, රංග භාණ්ඩ, සිහිවටන හා පටිගත කිරීම් හැකිතාක් විධිමත් ලෙස ඒකරාශි කර සංරක්ෂණය කළ හැකි ජාතික නාට්‍ය සංරක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.<br>▪ නාට්‍ය නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන හා බදු සහන ලබා දීමට කටයුතු සංවිධානය කිරීම.<br>▪ බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය හරහා බිම් මට්ටමේ නාට්‍ය කලාව දියුණු කර එය ජාත්‍යන්තර තලයට රැගෙන යාමට අවශ්‍ය ව්‍යුහාත්මක සැලැස්මක් සැකසීම.<br>▪ සෑම ප්‍රධාන නගරයකම පූර්ණ පහසුකම් සහිත නවීන රංග ශාලා පද්ධතියක් බිහි කිරීම හා පවතින රංග ශාලා වැඩිදියුණු කොට එම ජාලයේ කොටසක් ලෙස එම ජාලයට ඇතුළත් කිරීම.<br>▪ නාට්‍ය කලාව සම්බන්ධ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව ප්‍රවර්ධනය කිරීම හා ප්‍රාදේශික හා ජාතික මට්ටමින් ඒවා පිරිනැමීමට කටයුතු කිරීම.<br>▪ නාට්‍ය කලා රසිකත්වය දියුණු කිරීම සඳහා වැඩසටහන් සහ එළිමහන් රංග පීඨ සංකල්පය ප්‍රවර්ධනය කිරීම.<br>▪ විකල්ප රංග ශාලා - අවස්ථා සඳහා පහසුකම් ලබාදීම. |
| නර්තනය | නර්තනයෙහි ගුණාත්මකභාවය සහතික කිරීම | ▪ නර්තන කලාව සම්බන්ධ ප්‍රතිසංස්කරණයන් සිදු කරන අවස්ථාවල දී සම්ප්‍රදායික නර්තනායතන නර්තන ගුරුවරුන් සහ ප්‍රවීණයන් සම්බන්ධ කර ගැනීම.<br>▪ නර්තනය සුරැකීම හා ප්‍රවර්ධනය මූලික කරගත් ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම සහ බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන සමඟ ද ඒකාබද්ධ කිරීම.<br>▪ ශ්‍රී ලාංකීය ජන නර්තන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ජාත්‍යන්තර අධ්‍යයනවලට පර්යේෂණ යොමු කිරීම.<br>▪ සම්ප්‍රදායික නර්තන ක්‍රමයන් දිරිමත් කිරීම.<br>▪ ලියාපදිංචි නර්තන කලායතන ජාලයක් ගොඩනැගීම.<br>▪ නර්තනය පිළිබඳ ජාත්‍යන්තර අධ්‍යයන ලබාදීම හා ශිෂ්‍යත්ව පිරිනැමීමට අවශ්‍ය පහසුකම් සැලසීම.<br>▪ ග්‍රාමීය මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා දක්ෂ නර්තන ශිල්පීන් හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.<br>▪ නර්තනය විෂය සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර දැනුම දිරිමත් කිරීම සඳහා එම විෂය සම්බන්ධිත ශාස්ත්‍රීය ග්‍රන්ථ ත්‍රෛභාෂාවෙන් මුද්‍රණය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ සමකාලීන හා සාම්ප්‍රදායික නර්තන කලාවන් සංරක්ෂණය සඳහා අධ්‍යාපන හා පර්යේෂණ පහසුකම් ප්‍රවර්ධනය කිරීම. |
| දෘශ්‍ය කලාව, මූර්ති සහ ඡායාරූප කලා | දෘශ්‍ය කලාව, මූර්ති සහ ඡයාරූප ශිල්පය සංරක්ෂණය වැඩිදියුණු කිරීම සහතික කිරීම | ▪ අතීත හා වර්තමාන දෘශ්‍ය කලාව හා ඡායාරූපකරණයට අදාළව සංරක්ෂණය කිරීම සහ වැඩිදුර අධ්‍යයනය හා ජාතික සහ ජාත්‍යන්තර තලයේ පර්යේෂණ කිරීමට ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම.<br>▪ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා කලාකරුවන් සහභාගී කරවීමට අවශ්‍ය පහසුකම් ලබාදීම.<br>▪ පළාත් කේන්ද්‍රීය පුහුණු ආයතන ස්ථාපිත කිරීම සහ එම අවකාශය වෘත්තීය අවස්ථා වෙත මඟපෙන්වීම.<br>▪ දෘශ්‍ය කලාව සංචාරක කර්මාන්තය සමග ඒකාබද්ධකර ජාතික හා ජාත්‍යන්තර වෙළඳපළක් ප්‍රවර්ධනය කිරීම.<br>▪ පාසල් මට්ටමින් කලා සංගම් ස්ථාපිත කර තරඟ සංවිධානය කිරීම. |
| සංගීත සහ ගීත නිර්මාණ ක්ෂේත්‍රය | සංගීතය සහ ගීත කර්මාන්තය නියාමනය කිරීම සහතික කිරීම | ▪ සංගීත සම්ප්‍රදායන් සුරැකීම හා ප්‍රවර්ධනය සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම.<br>▪ ශ්‍රී ලාංකේය ජන සංගීත පර්යේෂණ සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.<br>▪ පැරණි සංරක්ෂිත ඥානය නිසි ලෙස අධ්‍යයනයට, පර්යේෂණයට අවස්ථාව සැලසීම.<br>▪ ලියාපදිංචි සංගීත කලායතන ජාලයක් ගොඩනැංවීම.<br>▪ ගීත හා සංගීතය පිළිබඳ බුද්ධිමය දේපළ නීති නැවත සලකා බැලීම හා සංශෝධනය කිරීම.<br>▪ ජාත්‍යන්තර සංගීත අධ්‍යයනය හා පර්යේෂණය සඳහා අවකාශය සලසා දීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය විධිමත් කිරීම.<br>▪ පටිගත කෙරෙන සෑම ගීත සහ සංගීත නිර්මාණයකම මුල් පිටපත් සංරක්ෂණය කෙරෙන ඩිජිටල් තාක්ෂණික ඒකකයක් පවත්වාගෙන යාම.<br>▪ සංගීත ක්ෂේත්‍රයට අදාළව කතුවරුන්ගේ සහ ගීත රචකයින්ගේ බුද්ධිමය දේපළ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා සාමූහික කළමණාකාරීත්ව සංවිධානයක සාමාජිකත්වය ලබාදීම. |
| අස්පර්ශනීය සංස්කෘතික උරුමය හා සම්ප්‍රදායික කලා | සංස්කෘතික උරුමය අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කිරීම, සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා | ▪ දැනට පවතින උරුමය හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම සඳහා, අස්පර්ශනීය උරුමය හා සම්ප්‍රදායික කලා සම්බන්ධ ජාතික පර්යේෂණායතනයක් ඇති කිරීම.<br>▪ මෙවලම්, ගුරුකුල, සම්ප්‍රදායන් සහ මානව සම්පත් පිළිබඳව ඇති ප්‍රාදේශීය දැනුම ප්‍රතිසංස්කරණය සහ ප්‍රවර්ධනය තුළින් ප්‍රාදේශීය මට්ටමින් ජාතික තලයටත්, ඉන්පසු ජාත්‍යන්තර තලයටත් අඛණ්ඩව රැගෙන යාම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | **ප්‍රධාන ක්‍රියාකාරකම්** |
| --- | --- | --- |
| | අවශ්‍ය පියවර සහතික කිරීම | ▪ සංස්කෘතිය හා උරුමය සංචාරක කර්මාන්තයේ සුවිශේෂී අංගයක් වන බැවින්, සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සහතික කිරීමට ඒකාබද්ධ වැඩසටහනක් සකස් කිරීම<br>▪ අස්පර්ශනීය උරුමය හා බැඳුනු උප ක්ෂේත්‍රයක් වන දේශීය වෙදකම, පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය, විනෝදාස්වාද කර්මාන්තය සහ මානසික සුවතාව ප්‍රවර්ධනය කිරීම.<br>▪ මෙම විෂය හා බැඳුනු විදේශීය සරසවි, පර්යේෂණ ආයතන සමග සබඳතා දියුණු කිරීම හා පශ්චාත් උපාධි මට්ටමින් අධ්‍යයනයට මග සැලසීම.<br>▪ සම්ප්‍රදායික කලාකරුවන්, ගුරුකුල, ශිල්ප ආයතන හඳුනාගෙන ජාලගත කිරීම හා යාවත්කාලීන කිරීම. |

## 1.6 සංරක්ෂිත ඉතිහාසයක් - උරුම නව්‍යකරණයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සංස්කෘතික සම්පත්හි ආරක්ෂාව
- සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම්
- සමාජ නවෝත්පාදනය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| ඉතිහාසය, උරුමය හා සංස්කෘතියේ තිරසරත්වය | පර්යේෂණ, සහභාගිත්වය හා අධ්‍යාපනය තුළින් ඉතිහාසය, උරුමය හා සංස්කෘතියේ තිරසරත්වය සහතික කිරීම | ▪ සමාජ සහ ආර්ථික අංශ මත ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය මඟින් ඇති කර තිබෙන බලපෑම පිළිබඳ පර්යේෂණ කිරීම.<br>▪ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයන් ජාතික සංවර්ධන සැලසුම්වලට ඒකාබද්ධ කර තිබෙන වඩාත් සාර්ථක ජාත්‍යන්තර භාවිතයන් විශ්ලේෂණය කිරීම<br>▪ සමාජ නවෝත්පාදනය, ව්‍යවසායකත්වය, රැකියා උත්පාදනය, අධ්‍යාපනය සහ අන්තර් ජාතික සබඳතා වර්ධනය කිරීමට සිය රටේ උරුම වටිනාකම් ආයෝජනය කිරීමේ වැදගත්කම තක්සේරු කිරීම.<br>▪ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය යන ක්ෂේත්‍රවලට අදාළව රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ශාස්ත්‍රාලයීය ප්‍රජාව සහ ප්‍රාදේශීය ජනතාව අතර හවුල්කාරිත්වය වර්ධනය කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.<br>▪ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයට අදාළ පාර්ශවකරුවන් විසින් දැනට නියුක්තව සිටින සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීමේ සහ කළමනාකරණයට අදාළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම් පිළිබඳ ඔවුන් තුළ තිබෙන අවබෝධය වැඩි දියුණු කිරීම.<br>▪ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයේ වටිනාකම පිළිබඳව දැනුවත් කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම සහ උපදේශනාත්මක තොරතුරු අඩංගු ද්‍රව්‍ය ලබාදීම.<br>▪ පාසල් විෂය මාලාවට සහ ප්‍රජා අධ්‍යාපන වැඩසටහන් වලට ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය පිළිබඳ වූ මාතෘකා ඇතුළත් කිරීම. |

## 1.7 තිරසර ජෛව ලෝකයක් - සදාහරිත ජීවිතයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- පාරිසරික යුක්තිය සහ සාධාරණත්වය
- පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව
- තිරසර සම්පත් භාවිතය සහ පූර්වාරක්ෂක ක්‍රමවේදය
- පරිසර පද්ධතික ප්‍රවේශය
- ආයතනික සම්බන්ධීකරණය සහ මහජන සහභාගිත්වය
- දූෂකයා ප්‍රතිපූර්ණය (Polluter Pays Principle)
- පාරිසරික යහපාලනය
- ප්‍රජාව සවිබල ගැන්වීම
- පාරිසරික ආරක්ෂාව
- පිවිතුරු නිෂ්පාදන (Cleaner Production)

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| මනා භූමි භාවිතය | සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම තුළින් තිරසර හා සමතුලිත ඉඩම් පරිහරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම | ▪ සංවේදී පරිසර කලාප ස්ථාපිත කර / ප්‍රකාශයට පත්කර සුරක්ෂිත කිරීම.<br>▪ ස්වභාවික ආපදා අවදානම් භූමි හඳුනාගැනීම, කලමනාකරණය හා හානිය අවම කිරීම.<br>▪ කෘෂිකාර්මික, කාර්මික සහ නේවාසික ඉඩම් සඳහා විද්‍යානුකූල තිරසර භූමි (ඉඩම්) පරිහරණ සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.<br>▪ තිරසර ආර්ථික මෙහෙයුම් සඳහා ඛනිජ සම්පත් පිහිටි ප්‍රදේශ සංරක්ෂණය.<br>▪ පාංශු සංරක්ෂණය පිළිබඳව පවතින නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍යතා අනුව නව නිර්දේශ සකස් කිරීම. |
| සාගර සහ වෙරළ කලාපයේ තිරසර පැවැත්ම | ඒකාබද්ධ කළමනාකාරිත්වය සහ ප්‍රතිපත්ති හරහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධතිවල තිරසර බව ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම | ▪ වෙරළට සහ සාගරයට ඍජුව හෝ වක්‍රාකාරව අපද්‍රව්‍ය බැහැර කිරීම පූර්ණ ලෙස වැළැක්වීම.<br>▪ වෙරළ කලාපයේ සංවේදී පරිසර පද්ධති හඳුනාගෙන එම පරිසර පද්ධති සුරක්ෂිත කිරීම සහ ජල තත්ත්ව පරාමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීම.<br>▪ වෙරළ හා කලපු සංරක්ෂණ කලාප විද්‍යානුකූලව හඳුනා ගෙන සංරක්ෂණය කිරීම.<br>▪ සමුද්‍රීය පාරිසරික හානි අවමකර ගැනීම සඳහා අදාළ ආයතනවල මූලිකත්වයෙන් සහ ප්‍රජා සහභාගිත්වයෙන් හදිසි සූදානම් සැලැස්මක් ( Emergency Preparedness Plan) සකස් කිරීම.<br>▪ සාගර දූෂණය නිසා ඇතිවන පාරිසරික බලපෑම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සහ සිදුවන හානි ප්‍රතිපූරණයට අවශ්‍ය වන්දි ලබා ගැනීමේ නීති හා ක්‍රමවේද ගොඩනැගීම.<br>▪ මත්ස්‍ය සහ සාගර ජලය ආරක්ෂා කර ගැනීම ඇතුළත් සමුද්‍ර සම්පත් තිරසර ලෙස භාවිත කිරීම තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර නීති හා සම්මුතීන්ට අනුකූලව අදාළ පරිසර නීති ක්‍රියාත්මක කිරීම.<br>▪ සංස්කෘතිකමය වශයෙන් වැදගත් වෙරළබඩ ප්‍රදේශ සහ සංචාරක ආකර්ෂණ කලාප හඳුනාගෙන නවීන පන්නයේ සුන්දර පාරිසරික තීරයන් ලෙස සංවර්ධනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ සමුද්‍ර ජීවීන් ස්වභාවිකව බහුල ප්‍රදේශ හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ එහි ජල පරාමිතීන් සුරක්ෂිත කිරීම සහතික කිරීම. |
| පිරිසිදු වායුගෝලයක පැවැත්ම | තිරසර අනුවර්තනය වීම සහ අවම කිරීම හරහා සැමට පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න වාතය/ වායුගෝලයක් ලබා ගැනීම සහතික කිරීම | ▪ වායුගෝලයේ සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා සීඝ්‍ර වර්ධනයක් සහිත හා වගාවට යෝග්‍ය දැව වර්ග හඳුන්වා දීම.<br>▪ කාබන් තිර කිරීමට දායකවීම සඳහා ශාක වගා කිරීම, පරිභෝජනය හා නැවත වගා කිරීම.<br>▪ වායු දූෂණය අවම කිරීම සඳහා කර්මාන්ත හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ විකල්ප බලශක්ති භාවිතය ප්‍රවර්ධනය හා විධිමත් නියාමනය.<br>▪ දේශසීමා මායිම්හි වායු දූෂණය අවම කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම.<br>▪ වායු දූෂණය අවම කිරීම සඳහා මහජනයා දැනුවත් කිරීමට සහ ආකල්ප සංවර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| පරිසර සම්මුතීන් සහ නීති රීති සඳහා නෛතික හා සදාචාරාත්මක රාමුවක් | පවතින පාරිසරික නීති රීති සහ ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන් බලාත්මක කරන ශක්තිමත් නෛතික සහ සදාචාරාත්මක රාමුව ශක්තිමත් කිරීම | ▪ ජාත්‍යන්තර ගිවිසුම් හා දේශීය පරිසර නීති සමග අනුගත වෙමින් පරිසර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා දැනට පනවා ඇති අණපනත්වල දුර්වලකම්, අඩුපාඩු හා ඌනතාවන් සමාලෝචනය සහ නිවැරදි කිරීම.<br>▪ සංවර්ධන ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයේදී මහජන මත විමසීම් අනිවාර්ය කිරීම.<br>▪ ව්‍යාපෘති සඳහා පරිසර ඇගයීම් වාර්තා ලබා දීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කිරීම සඳහා එම වාර්තා සැකසීමේ නිර්ණායක යාවත්කාලීන කිරීම.<br>▪ උපාය මාර්ගික පාරිසරික තක්සේරුව (Strategic Environmental Assessments -SEAs) ක්‍රියාත්මක කිරීම.<br>▪ පරිසර ප්‍රතිපත්ති හා පරිසර නීති පිලිබඳ ජනතාව දැනුවත් කිරීම. |
| පරිසර පද්ධති සංරක්ෂණය | ඒකාබද්ධ සංරක්ෂණ උපාය මාර්ග, තිරසර සම්පත් කළමනාකරණය සහ ප්‍රජා සහභාගීත්වය හරහා විවිධ | **කඳුකර බිම්**<br>▪ කඳු වැටි/ බෑවුම් සහිත වනාන්තර කළමනාකරණය කිරීම.<br>▪ කඳුකර පරිසර පද්ධති වල පාරිසරික හා ආර්ථික වැදගත්කම අවධාරණය කිරීම සඳහා එම පරිසර පද්ධති සමාලෝචනය කර ඒකාබද්ධ දත්ත පද්ධතියක් සැකසීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම | ▪ කඳුකර ප්‍රදේශවල වතු නඩත්තු කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම තීරණය කිරීම සඳහා පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය සහ පාරිසරික ඇගයීම සිදු කිරීම. |
| | | **පහත් බිම්**<br>▪ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූලව සියලු ඉඩම් කළමනාකරණය හා සංරක්ෂණය.<br>▪ ප්‍රජා වන වගා, වැව්ලි වන වගා හා කෘෂි වන වගා ප්‍රවර්ධනය.<br>▪ ස්වාභාවික විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම සහ වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම. |
| | | **තෙත් බිම්**<br>▪ ශ්‍රී ලංකාවේ ඇති තෙත් බිම් හඳුනා ගැනීම, ලේඛන ගත කිරීම හා සුරක්ෂිත කිරීම.<br>▪ දැනට පවතින සහ අනාගත රැම්සා තෙත් බිම් සංරක්ෂණය කිරීම, සහතික කිරීම සහ ඒ මගින් සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම.<br>▪ බහුපාර්ශ්වීය හවුල්කරුවන් හා ප්‍රජා සහභාගිත්වය සහිතව හායනයට ලක් වූ තෙත් බිම් ප්‍රතිෂ්ඨාපනය.<br>▪ ඒකාබද්ධ තෙත්බිම් කළමනාකරණ කටයුතු සඳහා අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම. |
| | | **කඩොලාන**<br>▪ කඩොලාන පරිසර පද්ධති පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කර ක්‍රියාවට නැංවීම.<br>▪ කඩොලාන පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා නීතිමය පියවර ගැනීම. |
| | | **වනාන්තර හා වනජීවී**<br>▪ ඒකාබද්ධ වනාන්තර සහ වනජීවී සංරක්ෂණ කලාප හඳුනා ගැනීම සහ නව ආරක්ෂිත ප්‍රදේශ පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ අලි ඇතුන්ගේ ඇත් දළ, ගජ මුතු, කෙඳි හා වෙනත් සත්ව කොටස් සම්බන්ධ මිථ්‍යා විශ්වාස හා අනවශ්‍ය මූල්‍ය වටිනාකම් දුරු කිරීම සඳහා මහජනයා දැනුවත් කිරීම.<br>▪ වන සතුන් ගම්මානවලට ඇතුල්වීම අවම කිරීම සඳහා ආහාර සහ ජලය සැපයීම සඳහා ඔවුන්ගේ ස්වභාවික වාසස්ථාන වැඩිදියුණු කිරීම.<br>▪ වන අලි ගම්මානවලට ඇතුල්වීම වැලැක්වීම සඳහා විදුලි වැට හඳුන්වාදීම සහ නඩත්තු කිරීම.<br>▪ සුදුසු තාක්ෂණික ක්‍රම සහ මහජන සහභාගීත්වයෙන් මිනිස් - වනජීවී ගැටුම් අධ්‍යයනය කිරීම සහ අවම කිරීම.<br>▪ වඳුරන් සහ වල් ඌරන් වැනි හානිකර වන සතුන් පිළිබඳ අධ්‍යයනයන් පැවැත්වීම සහ අවශ්‍ය ජීව විද්‍යාත්මක පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම.<br>▪ ශාක හා සත්ත්ව විශේෂ විතැන් සංරක්ෂණය (Ex- situ conservation) සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම.<br>▪ ශාක හා සත්ත්ව විශේෂ ස්ථානීය සංරක්ෂණය (In- situ conservation) සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම.<br>▪ පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා ස්වභාවික වන ආවරණය කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම.<br>▪ ආක්‍රමණශීලී විශේෂ පැතිරීම පාලනය කිරීම සහ වැළැක්වීම. |
| ඝනසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | නව්‍ය විසඳුම් සහ තාක්ෂණය හරහා කාර්යක්ෂම, ඝනසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | ▪ ගෘහස්ථ, සේවා සම්පාදන, කෘෂිකාර්මික හා කාර්මික වැනි සියලු අංශයන්හි ජනනය වන ඝන අපද්‍රව්‍ය උචිත පරිදි ශුන්‍ය අපද්‍රව්‍ය සංකල්පය 3R (ජනනය අවම කිරීම, නැවත භාවිතාව, ප්‍රතිචක්‍රීකරණය) සහ චක්‍රීය ආර්ථික කළමනාකරණ සංකල්ප මත පදනම්ව, අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නීතිමය රාමු යාවත්කාලීන කිරීම සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.<br>▪ වත්මන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සමාලෝචනය කිරීම සහ ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ නිවස්න කලාප, මහල් නිවාස, සේවා, සහ කාර්මික ගොඩනැගිලි/ අංශ සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් අනුගත කිරීම සහ අනිවාර්ය කිරීම.<br>▪ ඒකාබද්ධ නිෂ්පාදක වගකීම් (Extended Producer Responsibilities) ක්‍රමවේද මගින් ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම.<br>▪ අනතුරුදායක සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි කළමනාකරණය සහ ආරක්ෂිතව බැහැර කිරීම.<br>▪ නවීන තාක්ෂණික ක්‍රම සහිත අවසන් කසළ බැහැර කිරීම, කසළ මගින් බලශක්ති උත්පාදනය සහ කසළ මගින් සම්පත් නිස්සාරණය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය.<br>▪ ශූන්‍ය අපද්‍රව්‍ය ක්‍රමය (Zero-waste method) අනුගමනය කිරීමට සහ හැකි සෑම විටම කර්මාන්ත කලාප තුළ සෑම කර්මාන්තයක්ම ස්ථානගත කිරීම සඳහා කර්මාන්ත දිරි ගැන්වීම |
| ගෙවතු ආශ්‍රිත සම්පත් කළමනාකරණය | ගෙවතු සම්පත් තිරසර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | ▪ නිවසක් ඉදිකිරිම සඳහා භූමිය සකස් කිරීමේදී අතිරේක පස් ඉවත් කිරීම, නිවසක අත්තිවාරම් පිරවීම සඳහා පස් ලබා ගැනීම වැනි වාණිජමය නොවන ක්‍රියාකාරකම් සඳහා අවසර ලබා දීම.<br>▪ ගෙවත්තක දැව අපේක්ෂාවෙන්ම වගා කළ ගස් සංරක්ෂණ ක්‍රියාමාර්ගවලට යටත්ව ඉවත් කිරීම සහ ප්‍රවාහනය සඳහා අවසර ලබා දීම.<br>▪ ගෘහ ආශ්‍රිතව සත්ව පාලනය සඳහා පරිසර අලංකරණ නිර්ණායක හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| පරිසර පද්ධති අතර සම්බන්ධකම් හා වටිනාකම් | පර්යේෂණ සහ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම මගින් පරිසර පද්ධති අතර අන්තර් සම්බන්ධිත සබඳතා හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම | ▪ පරිසර පද්ධති අතර අනුලෝම හා ප්‍රතිලෝම සම්බන්ධතා මෙන්ම මානව සම්බන්ධතා අනාවරණය කිරීමට අවශ්‍ය පර්යේෂණ හා අධ්‍යයන සිදුකිරීම.<br>▪ විධිමත් හා අවිධිමත් පරිසර අධ්‍යාපන ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම.<br>▪ පරිසර පද්ධති පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ පේටන්ට් බලපත්‍ර හිමිකම් ලබා ගැනීම සහ පරිසර පද්ධති පිළිබඳ ජාන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සහ ජාන මංකොල්ලය නැවැත්වීමට කටයුතු කිරීම.<br>▪ සංචාරක කර්මාන්තය සඳහා ආකර්ෂණීය පරිසර පද්ධති සුරක්ෂිත කිරීම. |
| වඩා ශක්ති සම්පන්න සමාජයක් සඳහා ආපදා අවදානම් අවම කිරීම සහ ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම | ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම, ආපදා අවදානම අවම කිරීම සඳහා ආයෝජනය කිරීම සහ ආපදා සූදානම ශක්තිමත් කිරීම තුළින් ඔරොත්තු දෙන සමාජයක් සහතික කිරීම | ▪ ස්වාභාවික ආපදාවලට ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම, කළමනාකරණය සහ අවදානම් අවම කිරීම.<br>▪ ගංවතුර කලාප සිතියම්ගත කිරීම හා හදිසි සහ දීර්ඝ කාලයක් පවතින ගංවතුර සිදුවීම් සඳහා මිනිසා විසින් සිදු කරන ලද සංවර්ධන කටයුතුවල සහසම්බන්ධතා විමර්ශනය කරමින්, දත්ත-පදනම් කරගත් පර්යේෂණ සිදු කිරීම හා සංවර්ධන විසඳුම් සැපයීම.<br>▪ මහජනතාවට ගංවතුර, සුනාමි, නායයාම් වැනි විවිධාකාරයේ ස්වාභාවික ආපදා පිළිබඳව පෙර දැනුම් දීමට හැකි වන අයුරින් අධි තාක්ෂණික කාලගුණ යෙදුම් සංවර්ධනය කිරීම.<br>▪ කෘෂිකාර්මික, කාර්මික සහ නේවාසික යන භාවිතයන් සඳහා විද්‍යාත්මකව සංවර්ධනය කරන ලද තිරසර ඉඩම් පරිහරණ සැලසුම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br>▪ ආර්ථික හා සමාජීය කටයුතු සඳහා කඳුකර වනාන්තර භාවිතයට ගැනීම නියාමනය.<br>▪ නායයාම් වැළැක්වීම සඳහා උස් හා දැඩි බෑවුම්වල සිදුවන භූමි භායනය පිළිබඳව සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම, සහ පසේ සාරවත්බව හා ව්‍යුහය වැඩිදියුණු කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.<br>▪ ස්වාභාවික ආපදා සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම, සහ වන්දි හා රක්ෂණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ කාර්මික හා පාරිසරික දූෂණය, ස්වාභාවික ආපදා, ගිනි ගැනීම් හා නියඟ වැනි ආපදාවන්ගෙන් සෞඛ්‍ය හා ආර්ථික බලපෑම් අවම කිරීමට සහ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ආපදා කළමනාකරණ ව්‍යුහය විධිමත් කිරීම.<br>▪ හානි අවම කිරීම සඳහා දේශගුණික වෙනස්කම් හේතුවෙන් ඇති වන ස්වාභාවික ආපදා පිළිබඳව අති නවීන තාක්ෂණික යෙදවුම් භාවිතයෙන් විමර්ශනය කිරීම.<br>▪ කර්මාන්ත හා පොදු සංසද සහභාගීත්වය සහිතව අපේක්ෂිත ආන්තික කාලගුණික සිදුවීම් සඳහා ඉදිරි දශකය සඳහා විශේෂයෙන් සකස් කරන ලද "ස්වාභාවික ආපදා කළමනාකරණ උපාය මාර්ගයක් " ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. මේ සඳහා රක්ෂණ යෝජනා ක්‍රම සහ ආපදා සූදානම හා ප්‍රතිචාර සඳහා විශේෂ අරමුදල් ද ඇතුළත් වේ. |
| සුරක්ෂිත ජල පරිභෝජනය | ජල සුරක්ෂිතතාව සහ ජල දූෂණය පාලනය සහතික කිරීම. | ▪ සියලුම ජල මූලාශ්‍ර වල රසායනික සහ භෞතික පරාමිතීන් පිළිබඳ දත්ත රැස්කොට විශ්ලේෂණය කිරීමෙන් මූලික ජල සිතියමක් සකස් කිරීම.<br>▪ ජල මූලාශ්‍රයන් දූෂණයට ලක්වන හේතු කාරක හඳුනා ගැනීම සහ ජල දූෂණය අවම කිරීමට පියවර ගැනීම.<br>▪ කෘෂිකාර්මික, කාර්මික, ගෘහස්ථ හා සේවාවන්ට අදාල ක්‍රියාකාරකම් මගින් නිකුත්වන අප ජලය පිරිපහදු කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම හඳුන්වා දීම සහ නියාමනය කිරීම. |
| | ජල මූලාශ්‍ර සංරක්ෂණය ශක්තිමත් කිරීම | ▪ ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනය කිරීම, සංවේදී ජල මූලාශ්‍ර පිළිබඳ තක්සේරු කිරීම සහ එම සංවේදී ජල මූලාශ්‍ර ගැසට් කර සංරක්ෂණය කිරීම. |

## 1.8 නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් - සමබර තොරතුරු සමාජයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සත්‍ය සහ නිවැරදි තොරතුරු දැනගැනීමට ජනතාවට ඇති අයිතිය
- මානවවාදී වගකීම් සහගත මාධ්‍ය කර්මාන්තයක්
- ජනමාධ්‍ය නිදහස සහ ස්වාධීනත්වය
- ජනමාධ්‍ය පොදු දේපළක් ලෙස

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ජනමාධ්‍ය නිදහස සහ සදාචාරාත්මක ප්‍රමිතීන් | ජනමාධ්‍ය නිදහස සහ සදාචාරාත්මක ප්‍රමිතීන් සහතික කිරීම | ▪ ප්‍රවෘත්ති සහ වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ජනප්‍රියත්වය මත පදනම්ව ජනමාධ්‍ය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය ක්‍රමවත් කිරීම සඳහා විශ්ව විද්‍යාල ජනමාධ්‍ය ඒකක සහ අනෙකුත් ශ්‍රේණිගත කිරීමේ ආයතන සඳහා පහසුකම් සැලසීම.<br>▪ ප්‍රකාශනයේ නිදහසට බාධා වන වගන්තීන් ඉවත්කොට 2024 අංක 09 දරණ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම.<br>▪ භාෂා භාවිතය, අන්තර් සංස්කෘතික සහ අන්තර් ජාතීන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය , අධ්‍යාපනය සහ විද්‍යාව ප්‍රවර්ධනය ඇතුළුව ශ්‍රේණිගත කිරීමේ නව නිර්ණායක හඳුන්වා දීම සහ මෙම ශ්‍රේණිගත කිරීම් ප්‍රසිද්ධ කිරීම.<br>▪ මාධ්‍ය නිදහස පිළිගනිමින් දැනට පවතින මාධ්‍ය නීති, රෙගුලාසි සම්මුතීන් හා ආචාර ධර්ම සමාලෝචනය කිරීම හා ප්‍රශස්ත මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම.<br>▪ මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ දේශීය සමාජ සන්දර්භයන්ට අනුකූල වන ආකාරයේ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම.<br>▪ ජනමාධ්‍ය අතර නිදහස් තරඟකාරිත්වය ප්‍රවර්ධනය කරමින් පුවත්පත්, ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා, මාධ්‍යවේදීන්, වැඩසටහන්, ලිපි, ඡායාරූප වැනි අංග ඇගයීමට ලක්කෙරෙන වැඩසටහන් හඳුන්වාදීම.<br>▪ සෑම අංශයකම මාධ්‍ය වෘත්තිකයන් ඇගයීම සඳහා සම්මාන උළෙලක් සංවිධානය කිරීම.<br>▪ කැමරා වැනි අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මාධ්‍යවේදීන්ට අඩු පොලී ණය පහසුකම් ලබා දීම.<br>▪ රාජ්‍ය මාධ්‍ය ආයතන උසස් මාධ්‍ය සදාචාරයේ සහ ප්‍රමිතියේ ආදර්ශයන් ලෙස මෙහෙයවීමට කටයුතු කිරීම.<br>▪ ජනමාධ්‍ය සංවර්ධනය, සන්නිවේදනය සහ අධ්‍යාපන වැඩසටහන් මහජනතාව අතර ප්‍රවර්ධනය කිරීම.<br>▪ සිනමාව, රූපවාහිනිය සහ සංගීතය වැනි ක්ෂේත්‍රවල ජාත්‍යන්තර වෙළඳපොළක් ලබා ගැනීම සඳහා කලාකරුවන් සහ නිෂ්පාදකයින් ඇගයීම හා දිරිගැන්වීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ උසස් තත්ත්වයේ වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය සහ ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීමට දේශීය සමාගම් සහ නිෂ්පාදකයින් දිරිමත් කිරීම.<br>▪ ජනමාධ්‍යයේ නිර්මාණකරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ නිර්මාණවල සුරක්ෂිතභාවය ඇති කිරීම සඳහා විධිමත් සංරක්ෂණ වැඩපිළිවෙලක් ඇති කිරීම.<br>▪ ප්‍රශස්ත ප්‍රේක්ෂක සමාජයක් ඇති කිරීම සඳහා මාධ්‍ය සාක්ෂරතා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.<br>▪ සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලියේ ප්‍රශස්ත ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාම සඳහා ස්වාධීන මාධ්‍ය කොමිසමක් පිහිටුවීම. |

## 2 වන පරිච්ඡේදය

## 2. ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්

### හැඳින්වීම: ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහ අසමානතාවය ආමන්ත්‍රණය කිරීම

ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් මිලියන 5.7 ක ජනතාවක් ජාතික දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන අතර, අඩකට වඩා ප්‍රමාණයක් බහුමාන දරිද්‍රතාවය අත්විඳිති. නිදහසින් පසු සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළද, අකාර්යක්ෂමතාව සහ දේශපාලන මැදිහත්වීම් ඒවායේ කාර්යක්ෂමතාව දුර්වල කර ඇත. ඒ අනුව ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ ආර්ථික සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා විශ්වීය සමාජ ආරක්ෂණ පද්ධතියක අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

බොහෝ විට, මිනිස් ශ්‍රමය අවතක්සේරු කරනු ලබන අතර, එමඟින් බොහෝ සේවකයින් අවම වැටුපට වඩා අඩු ආදායමක් උපයනු ලැබේ. කාන්තාවන් සම්පූර්ණ ආන්තිකකරණයට මුහුණ දෙන අතර, මෙම අසමානතාවයන් විසඳීමට සහ සියලුම ආන්තික කණ්ඩායම්වලට සහාය වීම සඳහා එකිනෙකට ඡේදනය වන ප්‍රවේශයක් අවශ්‍ය වේ.

වැඩිදියුණු කළ සම්පත් සහ නීති ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍යතාවය ඉස්මතු කරමින්, ප්‍රමාණවත් ආරක්ෂාවක් සහ අධ්‍යාපන අවස්ථා ඇතුළු සැලකිය යුතු අභියෝගවලට දරුවන් මුහුණ දෙයි. ජනගහනයෙන් 38% ක් වන තරුණයින් බොහෝ විට සීමිත අවස්ථාවන්ට මුහුණ දෙන අතර, ජාතික සංවර්ධනයට දායක වන්නන් ලෙස ඔවුන් බලගැන්වීමේ වැදගත්කම අවධාරණය කරයි.

ජනගහනයෙන් 17.2% ක් වන වැඩිහිටියන්ට ප්‍රමාණවත් සැලකිල්ලක් සහ සහයෝගයක් අවශ්‍ය වේ. තවද, ජනගහනයෙන් 8.7% ක් පමණ ආබාධ සහිත පුද්ගලයින්ගෙන් සමන්විත වන අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට සහ සමාජයට ඔවුන් අන්තර්කරණය කිරීම ප්‍රවර්ධනය කිරීමට උත්සාහයන් අවශ්‍ය වේ.

### ප්‍රතිපත්ති ප්‍රකාශනය

සුහසාධන ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ආර්ථිකයේ ක්‍රියාකාරී සහභාගිවන්නන් ලෙස කඩිනමින් සම්බන්ධ වීම සඳහා ඔවුන් බල ගැන්වීම.

## 2.1 සුරක්ෂිත සමාජයක් - සුපෝෂිත ජාතියක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සමාජ සහයෝගීතාවය
- සමාජ සවිබල ගැන්වීම
- අවශ්‍යතා ඇති අයට මූල්‍ය ප්‍රදාන
- අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය
- සැමට ජීවන චක්‍රය පදනම් කරගත් සමාජ ආරක්ෂාව
- සමාජ සාධාරණත්වය සහතික කිරීම සහ කිසිවෙකු අත් නොහැරීම
- ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රතිලාභීන්ගේ සහ අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ කාර්යක්ෂම හා අර්ථවත් සහභාගීත්වය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සමාජ ආරක්ෂණ සහ සුභසාධන වැඩසටහන් **"ප්‍රජාශක්ති"** අඩු ආදායම්ලාභීන් සඳහා වන දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන | විද්‍යාත්මක නිර්ණායක භාවිතා කරමින් සමාජ ආරක්ෂණ සහ සුභසාධන වැඩසටහන් සඳහා සුදුසුකම්ලත් පවුල් සහ පුද්ගලයින් තෝරා ගැනීම සහතික කිරීම. | ▪ අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු. 10,000 සිට ඉහළ සහනාධාර මුදලක් ලබා දීම.<br>▪ සහභාගීත්ව, විනිවිදභාවයෙන් යුතු සහ කාර්යක්ෂම ප්‍රතිලාභී තෝරා ගැනීමේ ක්‍රියාවලියක් හඳුන්වාදීම.<br>▪ පවත්නා පද්ධතිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම මඟින් ඩිජිටල් ප්‍රතිලාභ ලැබිය යුතු සියළුම ප්‍රතිලාභීන් නව නිර්ණායක භාවිතා කරමින් වසරක් ඇතුළත හඳුනා ගෙන සුදුසුකම් ලබන සියල්ලටම මූල්‍ය සහනාධාර ලබා දීම. |
| ප්‍රධාන දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන යටතේ සවිබලගැන්වීම | පූර්ණ සවිබල ගැන්වීම (Comprehensive Graduation)/ සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම. | ▪ අඩු ආදායම්ලාභී පවුල්වල දරිද්‍රතාවයට හේතු සහ පවුලේ සාමාජිකයන්ගේ විභවතාවයන් ආදිය පිළිබඳ පූර්ණ සහභාගීත්ව අධ්‍යයනයක් කිරීම.<br>▪ ප්‍රජා පාදක ව්‍යාපෘති හරහා ගෘහස්ථ මට්ටමින් දරිද්‍රතාවය සහ අවදානම් සඳහා පිළියම් හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ සංවර්ධනය කිරීම.<br>▪ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ සමුපකාර අංශයේ සහභාගීත්වය හරහා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.<br>▪ ආදායම් උත්පාදන සහ ජීවනෝපාය ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් සඳහා පුහුණු, තාක්ෂණික සහාය සහ මූල්‍ය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ දිළිඳු පවුල් සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි බැංකු පද්ධතිය සහ කාර්ය මණ්ඩලය කාර්යක්ෂමව භාවිතා කිරීම.<br>▪ ක්ෂේත්‍ර නිලධාරීන් යොදවා නිරන්තර පසුවිපරම සහ ප්‍රතිපෝෂණය කිරීම. |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් විශ්‍රාම ජීවිතයක් | රිදී ලාභාංශයේ (Silver Dividend) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආයු අපේක්ෂාවක් ප්‍රවර්ධනය කිරීම. | ▪ සහනාධාර අවශ්‍ය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් 5,000 ක මාසික දීමනාවක් ලබා දීම.<br>▪ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නව වැඩිහිටි සත්කාර මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ පෞද්ගලික සත්කාර මධ්‍යස්ථාන සඳහා රජයේ සහාය ලබා දෙමින් ඒවා නියාමනය.<br>▪ වැඩිහිටියන් රැකබලා ගන්නන් සඳහා වෘත්තීය පුහුණුව සහ ඒ සඳහා වන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා රජය මඟින් දිරිගැන්වීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ සේවක අර්ථසාධක අරමුදල වැනි විශ්‍රාම අරමුදල් ආරක්ෂිත සහ ඉහළ ප්‍රතිලාභ සහිත ආයෝජනවල ආයෝජනය කිරීම.<br>▪ විශ්‍රාම වැටුප් අරමුදල් වල සුරක්ෂිත බව සහ අඛණ්ඩ ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම සඳහා මූල්‍ය සහ රක්ෂණ සේවා දිරිගැන්වීම.<br>▪ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා වැඩි පොලී ප්‍රතිශතයක් හඳුන්වා දීම. |
| ආබාධ සහිත පුද්ගලයින් සඳහා අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් | ආබාධ සහිත පුද්ගලයින් සඳහා සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැඩි අවස්ථාවන් සහතික කිරීම. | ▪ ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතියක් විශේෂඥයින් විසින් සකස් කිරීම.<br>▪ අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා මසකට රුපියල් 10,000 ක මූල්‍යාධාරයක් ලබා දීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා අධ්‍යාපන, පුහුණු, රැකියා සහ ජීවනෝපාය අවස්ථා සඳහා පහසුකම් සැලසීම.<br>▪ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ආබාධ සහිත පුද්ගලයින් ආරක්ෂා කිරීම සහ බලගැන්වීම සඳහා පවතින නීති සංශෝධනය කිරීම සහ නව නීති පැනවීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ට නවීන තාක්ෂණය භාවිතා කිරීමට උපකාර කිරීම සඳහා දැනුවත් කිරීම, පුහුණුව ලබා දීම සහ සම්පත් හා අවස්ථා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම.<br>▪ අන්තර්කරණය තහවුරු කරමින් නිෂ්පාදන සංවර්ධනය කිරීමේදී ආබාධ සහිත පුද්ගලයින් සමඟ වැඩ කිරීමට තාක්ෂණික සමාගම් දිරිමත් කිරීම.<br>▪ ආබාධ සහිත සිසුන් සඳහා හිරිහැර කිරීම්වලින් තොර පාසල් පරිසරයක් ලබා දීම.<br>▪ ආබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා උපකාර කිරීමට සන්නිවේදන හා තොරතුරු තාක්ෂණයෙන් පාසල් සන්නද්ධ කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා, ව්‍යාපාර හිමිකාරිත්වය සහ ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීම.<br>▪ පුනරුත්ථාපනය සහ උපදේශනය සමඟින් ආබාධිතයන් කල්තියා හඳුනා ගැනීම, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර සඳහා ප්‍රවේශය සහතික කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ආධාරක උපාංග නිෂ්පාදනය කිරීම සහ ආනයනය කිරීම සඳහා රජයේ සහය ලබා දීම සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා දැරිය හැකි මිලකට සැපයීම. |
| කාන්තා මූලික පවුල්, තනි මාපිය පවුල් සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ හෝ සමීප සහකරුවන්ගේ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා සමාජ ආරක්ෂාව | කාන්තා මූලික පවුල්, තනි මාපිය පවුල් සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ හෝ සමීප සහකරු ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන්ගේ යහපැවැත්ම සහතික කිරීම | ▪ අවශ්‍යතා සහ ආදායම් මට්ටම් මත පදනම්ව එම කාණ්ඩවල බලපෑමට ලක් වූ පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර ලබා දීම.<br>▪ අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව නීති ආධාර සහ උපදේශන සේවා පිරිනැමීම.<br>▪ අවශ්‍ය විටෙක විකල්ප නිවාස සහ රැකියා සහාය ලබා දීම.<br>▪ ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනයෙන් පීඩාවට පත් කාන්තාවන් සඳහා සමාජීය සහ මානසික සහාය සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. |
| නිදන්ගත රෝග ඇති පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණය | නිදන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයින්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම | ▪ පිළිකා සහ වකුගඩු රෝග වැනි නිදන්ගත රෝග තත්ත්වයන් සහිත පුද්ගලයින්ගේ ඩිජිටල් දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම.<br>▪ අවශ්‍යතා පදනම මත නිදන්ගත රෝග ඇති පුද්ගලයින්ට අවම වශයෙන් මසකට රු. 10,000 ක මූල්‍යාධාර ලබා දීම.<br>▪ වෘත්තීය සහාය සහ සමාජ සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම. |
| පෝෂණයෙන් පිරි අනාගත පරපුරක් උදෙසා මන්දපෝෂණය අඩු කිරීම | දරුවන් අතර මන්දපෝෂණය අවම කිරීම සහතික කිරීම | ▪ මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම.<br>▪ මන්දපෝෂණය පිටුදැකීමේ ක්‍රියාමාර්ග පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම.<br>▪ ක්ෂණික අවශ්‍යතා ඇති පවුල් සඳහා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් හරහා පෝෂ්‍යදායී ආහාර සලාක ලබා ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම. |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන | ගැබිණි මව්වරුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම | ▪ ප්‍රජා සෞඛ්‍ය සේවා හරහා අමතර පෝෂණය අවශ්‍ය ගර්භනී මව්වරුන් හඳුනා ගැනීම.<br>▪ අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිණි මව්වරුන්ට තම ගර්භණී සමයේදී සහ දරු ප්‍රසූතියේ පළමු වසර තුළ පෝෂ්‍යදායී ආහාර පැකේජයක් සඳහා මූල්‍යාධාර සැපයීම.<br>▪ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් විසින් අඛණ්ඩව දැනුවත් කිරීම සහ අධීක්ෂණය කිරීම. |
| සුරක්ෂා: දැයේ දරුවන්ට ප්‍රමාණවත් රැකවරණය | දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම | ▪ රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම දායකත්වයෙන් අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ ළමා රැකවරණය සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත පවත්නා ආයතන ලියාපදිංචි කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අදාළ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම සහ ඒවා අධීක්ෂණය කිරීම.<br>▪ මෙම ආයතන වලට වෘත්තීය සේවා සැපයීම සඳහා සමාජ සේවා/සංවර්ධන නිලධාරීන් පත් කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ලෙස එවැනි සේවා සපයන පෞද්ගලික ආයතන දිරිමත් කිරීම. |
| සියලුම පුරවැසියන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් | සියලුම පුරවැසියන්ගේ සමාජ ආරක්ෂාව සහතික කිරීම | ▪ රටේ සියලුම අංශ වල ශ්‍රමිකයන්ට අදාළ වන පරිදි පුළුල් විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.<br>▪ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහ මහ බැංකුවේ අධීක්ෂණය යටතේ රජයේ සහතික කළ විශ්‍රාම වැටුප් අරමුදලක් ස්ථාපිත කිරීම.<br>▪ දැනට රාජ්‍ය අංශයේ හෝ විධිමත් ආයතනික අංශයේ රැකියාවක් නොකරන ගොවීන්, ධීවරයින් ඇතුළු සෑම පුරවැසියෙකුම විශ්‍රාම වැටුප් ක්‍රමයට සම්බන්ධ වීමට දිරිමත් කිරීම.<br>▪ හදිසි ආපදා/ආබාධිත අවස්ථාවන්හිදී විශ්‍රාම වැටුප් අරමුදල රක්ෂණ ක්‍රමයක් ලෙස භාවිතා කිරීම. |

## 2.2 කාර්යක්ෂම ශ්‍රම සම්පතක් - ගෞරවනීය වෘත්තීය ජීවිතයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ශ්‍රමයේ ගෞරවය සහ වටිනාකමෙහි ආරක්ෂාව
- ශ්‍රමයේ විවිධත්වය පිළිගනිමින් සමානව සැලකීම
- වෙනස්කම්වලට භාජනය නොවන සමාන අවස්ථා

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ශ්‍රමයේ ගෞරවය සහ ශ්‍රම වටිනාකමෙහි ආරක්ෂාව | පිළිගැනීම සහ සමාන අයිතිවාසිකම් තුළින් ශ්‍රම ගරුත්වය සහතික කිරීම | ▪ කම්කරු ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම<br>▪ සේවා ගිවිසුම් තුළ ඇති ගැටළු නිරාකරණය කිරීම සහ ඒ අනුව සංශෝධනය කිරීම.<br>▪ කාර්යක්ෂම ශ්‍රම බලකායක් සඳහා පවතින නීති සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම සහ නව නීති සහ රෙගුලාසි හඳුන්වා දීම.<br>▪ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලධර්මවලට අනුකූලව සාධාරණ සැලකීම, සාධාරණ වැටුප්, සහ සුරක්ෂිත සේවා කොන්දේසි ඇතුළු සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.<br>▪ සමාන රැකියා අවස්ථා සහතික කිරීම<br>▪ රැකියා අවස්ථා වලදී සාධාරණ තෝරාගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ සමාන අවස්ථා සහතික කිරීම.<br>▪ වැටුප් විෂමතා අවම කරන සහ සේවකයින් උනන්දු කරවන ජාතික වැටුප් ව්‍යුහයක් ස්ථාපිත කිරීම.<br>▪ මැන්පවර් සේවකයින් සඳහා සාධාරණ වැටුප් සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම.<br>▪ දේශපාලන මැදිහත්වීමකින් තොරව සුදුසුකම් සහ කුසලතා මත පදනම්ව රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරු කිරීම්. |
| සමාජ ආරක්ෂණය සහ ප්‍රතිලාභ | සුදුසු යාන්ත්‍රණ හරහා සමාජ ආරක්ෂණය සහතික කිරීම | • පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා සෞඛ්‍ය/ජීවිත රක්ෂණය ප්‍රවර්ධනය කිරීම.<br>• වත්මන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල විෂමතා ඉවත් කිරීම<br>• වයස අවුරුදු 5 ට අඩු දරුවන් රැකබලා ගන්නා අයට හෝ වයස අවුරුදු 80 ට වැඩි රෝගී දෙමාපියන් රැකබලා ගන්නා අයට මූලික වැටුපෙන් 25% ක් සහිත උපරිම වශයෙන් වසරක නිවාඩුවක් ලබා දීම.<br>• විශේෂ හේතූන් මත වැඩ කිරීමට නොහැකි අයට අතුරු දීමනා ලබා දීම.<br>• කලත්‍රයාගේ මරණය සඳහා සති දෙකක නිවාඩු ලබා දීම.<br>• උපයන විට ගෙවීමේ බද්ද සංශෝධනය කිරීම.<br>• පාරිතෝෂික රක්ෂණ (අග්‍රාහාර) ප්‍රතිලාභ ශක්තිමත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| වෙනස්කම් කිරීම්වලට ලක් නොවන සමාන අවස්ථා | ශ්‍රම බලකාය තුළ අන්තර්කරණය වැඩි දියුණු කිරීම තුළින් සමාන අවස්ථා සහතික කිරීම | • විධායක සහ කළමනාකරණ භූමිකාවන්හි ඵලදායී ලෙස නිරත වීමට කාන්තාවන්ට ඇති බාධක ඉවත් කිරීම.<br>• රැකියා වෙළඳපොළට ඇතුළුවීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙන හෝ උනන්දුවක් නොමැති කාන්තාවන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ මනාපයන් අනුව වැඩ කිරීමට අවස්ථා ලබා දීම. |
| ශ්‍රමයේ විවිධත්වය | ශ්‍රම වෙළඳපොළ තුළ අවස්ථා ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම තුළින් ශ්‍රම විවිධාංගීකරණය සහතික කිරීම | • නවීන තාක්ෂණයේ ආධාරයෙන් වැඩ කරන පැය ගණන ක්‍රමයෙන් අඩු කිරීම සහ නිවසේ සිට වැඩ කිරීමට වැඩි අවස්ථා නිර්මාණය කිරීම.<br>• නුපුහුණු සේවකයින් වෙනුවට පුහුණු සේවකයින් විදේශගත කිරීම.<br>• සුදුසු යාන්ත්‍රණයක් මත පදනම්ව රජයේ සේවයේ ගුරු වෘත්තිය, දේශීය ආදායම්, රේගු, විදේශ සේවා සහ සංචාරක කර්මාන්තය වැනි ක්ෂේත්‍රවල උපාධිධාරීන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම. |

## 2.3 නිදහස් ස්ත්‍රී පුරුෂ සමාජභාවයක් - සාධාරණ මිනිස් අනන්‍යතාවය

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය උදෙසා ආර්ථික සාධාරණත්වය.
- ජාතික ආර්ථිකය තුළ වැටුප් නොලබන ස්ත්‍රී ශ්‍රමය ආර්ථිකයට සිදු කරන දායකත්වය අගයන රාජ්‍ය ප්‍රතිපත්ති.
- සියලුම ආන්තික කණ්ඩායම් වලට සාධාරණ හා සමාන ලෙස සලකනු ලබන බව සහතික කිරීම සඳහා නීති සම්පාදනය.
- ස්ත්‍රීන්ගේ දේශපාලනික නියෝජනය, සහභාගීත්වය සහ සමාජ භූමිකාව වැඩි දියුණු කිරීම.
- ආයතනගත හිංසනය ඇතුළුව සෑම ස්ථානයකම, සියලුම ආකාරයේ හිංසනයන්ට එරෙහි වීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී ස්ත්‍රීන් මුහුණ දෙන පීඩනය තුරන් කිරීම සඳහා පොදු සේවාවන්ට ප්‍රමුඛත්වය ලබා දීම.
- තිරසර පාරිසරික සංරක්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනයේදී ස්ත්‍රී සහභාගීත්වය.
- සමාජ ආයතන සහ ක්‍රියාවලීන් විසින් ප්‍රතිනිෂ්පාදනය කර පවත්වාගෙන යනු ලබන අගතිගාමී ඒකාකෘතින්ගෙන් තොර සමාජයක්.
- ස්ත්‍රීන් ඇතුළු සියලුම අනන්‍යතා කණ්ඩායමවලට රාජ්‍ය සේවා, අයිතිවාසිකම් සහ යුක්තිය සඳහා සමාන ප්‍රවේශ වීමේ අයිතිය.
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ අන්තර්ජාතික සම්මුතියේ (CEDAW) සහ අන්තර්ජාතික ළමා අයිතිවාසිකම් සම්මුතියේ (CRC) සඳහන් ප්‍රමිතීන්ට අනුකූල දේශීය නීති.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | මනාලෙස ස්ථාපිත කරන ලද කාන්තා බලගැන්වීමේ යාන්ත්‍රණයක් තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා සාධාරණත්වය සහතික කිරීම | ▪ ශ්‍රම බලකාය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වැටුප් අතර පරතරය ඇති වන අවස්ථා හඳුනා ගනිමින් එය අවම කිරීම.<br>▪ කාන්තාවන්ගේ ඉඩම් අයිතිවාසිකම්වලට අහිතකර ලෙස බලපාන නීතිමය සහ ප්‍රායෝගික ගැටළු නිරාකරණය.<br>▪ වැඩ කරන කාන්තාවන් මුහුණ දෙන නිශ්චිත අභියෝගවලට මුහුණ දීම සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා පවතින කම්කරු නීති හා ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ නව නීති හඳුන්වා දීම.<br>▪ කාන්තාවන් පීඩාවට පත් කරන අධික පොලී අයකරන අයුක්ති සහගත ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් ඔවුන් නිදහස් කිරීමට පියවර ගැනීම.<br>▪ කාන්තා ව්‍යවසායකත්වයට සහාය වීම සඳහා බැංකු සහ මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම.<br>▪ කාන්තාවන් මුහුණ දෙන අභියෝග ලිහිල් කිරීම සඳහා අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රවාහනය සහ අනෙකුත් පොදු සේවාවන් වැඩිදියුණු කිරීම.<br>▪ ආරක්ෂිතව ගර්භණීභාවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2012 නීති කොමිසම මඟින් ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීම.<br>▪ ඒ ඒ වයස් කාණ්ඩවලට ගැලපෙන පරිදි පුළුල් ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුම හා ඒ හා සම්බන්ධ සේවාවන් ලබා දීම.<br>▪ ආර්ථව දරිද්‍රතාවයට (Period Poverty) එරෙහිව සටන් කිරීම වෙනුවෙන් .කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා බදු සහන, මූල්‍ය ආධාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය සම්පත් ලබා දීම.<br>▪ කාන්තාවන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩු කිරීම.<br>▪ දේශපාලන අධ්‍යාපනය සහ සංවිධානය කිරීම තුළින් දේශපාලනයේ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම.<br>▪ දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රී නියෝජනය ක්‍රමිකව 50% ක් දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති හඳුන්වා දීම.<br>▪ ළමාරක්ෂණ, වැඩිහිටි සත්කාර සහ ආබාධ සහිත පුද්ගලයින් රැක බලාගැනීම ඇතුළුව වැටුප් නොගෙවූ සත්කාර කටයුතු හඳුනාගෙන ඒවා ගිණුම්ගත කිරීම සඳහා ජාතික ශ්‍රම බලකා සමීක්ෂණ ආයතනගත කිරීම.<br>▪ සේවා ස්ථානයේ, පොදු ප්‍රවාහනයේ ඇතුළු සියළු තැන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පදනමෙන් සිදුවන ප්‍රචණ්ඩත්වය සහ හිරිහැරවලින් ආරක්ෂාව සහතික කිරීම සඳහා නීති සහ ක්‍රියා පටිපාටි සංශෝධනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ කාන්තාවන්, ළමයින් සහ අනෙකුත් ආන්තික කණ්ඩායම් පීඩාවට පත් කරන දණ්ඩන නීති සංග්‍රයේ 365 සහ 365 (අ) නීති සංශෝධනය කිරීම.<br>▪ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත වෙනස් කොට නොසලකනබවට තහවුරු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දෙන ආරක්ෂාව පුළුල් කිරීම.<br>▪ ආන්තික ප්‍රජාවන් සඳහා සෞඛ්‍ය සේවා, නීති ආධාර, සමාජ ආරක්ෂාව සහ යුක්තිය වැඩිදියුණු කිරීම මගින් සේවා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම.<br>▪ ආන්තික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් අධීක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ආයතනයක් නිර්මාණය කරමින් ඒ සඳහා කැපවූ ලේකම් කාර්යාලයක් හඳුන්වා දීම. |

## 2.4 සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- දරුවන්ගේ නිදහස සහ ආරක්ෂාව සපයන එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය වැනි ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව සකස් කරන ලද නීති පද්ධතියක්.
- දරුවන් රැකබලා ගැනීම සහ පෝෂණය.
- සියලුම දරුවන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය.
- දරුවන්ට එරෙහි අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාව.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| දරුවන්ට ආරක්ෂිත ලෝකයක් | සුදුසු ප්‍රතිසංස්කරණ සහ ළමාහිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම තුළින් දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම | ▪ ළමා හා තරුණ පුද්ගලයින්ගේ ආඥා පනත, ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥා පනත, අයාල ආඥා පනත සහ අනාථ නිවාස ආඥා පනත වැනි යල් පැන ගිය නීති සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම.<br>▪ ළමුන් සම්බන්ධ නඩු හැසිරවීම සඳහා පමණක් කැප වූ විශේෂිත මහාධිකරණ පිහිටුවීම.<br>▪ ළමා වින්දිතයින්ගේ සාක්ෂි විමසීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා දැනට පවතින විමර්ශන ක්‍රමය වැඩිදියුණු කිරීම මඟින් ඔවුන් නැවත වින්දිතයන් වීම අවම කිරිම.<br>▪ සුළු වැරදි සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින දරුවන් අධිකරණ පද්ධතිය වෙනුවට මැදිහත්වීම් සහ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් වෙත යොමු කිරීම.<br>▪ අවදානම් සහිත දරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ පවුල්වලින් අනවශ්‍ය ලෙස වෙන්වීම වැළැක්වීම සඳහා සහය වීම සහ එම ළමුන් සඳහා පවුල තුළම රැකවරණය ලබා දීම.<br>▪ නීතිමය කටයුතු සඳහා දරුවන් ප්‍රවාහනයේදී ආරක්ෂිත සහ ගෞරවනීය ප්‍රවාහනය සහතික කිරීම සඳහා ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.<br>▪ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමා ආරක්ෂක සේවා වැනි ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම සහ එම ආයතනවල ධාරිතා වර්ධනය.<br>▪ ළමා අපචාර සිද්ධීන් වාර්තා කිරීම සහ නිසි පසුවිපරමක් සහතික කිරීම සඳහා කාර්යක්ෂම සහ ප්‍රතිචාරාත්මක සේවාවක් ස්ථාපිත කිරීම.<br>▪ ආන්තික සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය ළමා සුභසාධන අංශ ඇතුළු තීරණාත්මක ක්ෂේත්‍ර සඳහා අයවැය ප්‍රතිපාදන වැඩි කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| | | ▪ පෝෂ්‍යදායී ආහාර සැපයීම ඇතුළුව සමස්ත ළමා සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර සහ දේශීය සංවිධානවල සහාය ඇතිව ප්‍රජාව, පවුල සහ පාසල පදනම් කරගත් සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා කටයුතුවලට අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම සහ අවදානමට ලක්ව ඇති දරුවන් සිටින පවුල්වලට සෘජු සේවා සැපයීමට ඔවුන් යොමු කිරීම.<br>▪ ආබාධ සහිත දරුවන්, වීදි දරුවන් සහ පාසල් නොයන දරුවන් ඇතුළු අවදානම් සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීමට සහ ඔවුන් වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ ළමා හිතකාමී අධ්‍යාපනික පරිසරයක් තුළ ජීවන කුසලතා සහ දැනුම පෝෂණය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ.<br>▪ විකල්ප රැකවරණයක් අවශ්‍ය සෑම දරුවෙකුටම පවුල පදනම් වූ පරිසරයන් තුළ රැකවරණය සහ ස්ථාවරත්වය ලැබෙන බව සහතික කිරීම සඳහා කැපකරු සත්කාර ක්‍රමයේ පුළුල් ප්‍රතිසංස්කරණ.<br>▪ ළමුන්ගේ මනෝ සමාජීය හා මානසික සෞඛ්‍ය ගැටළු කල්තියා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා පාසල් සහ ප්‍රජා මූලික වැඩසටහන්. |

## 2.5 තෘප්තිමත් තාරුණ්‍යයක් - සංස්කෘතිකවත් නිවහල් චින්තනයක්

### ප්‍රතිපත්ති මූලධර්ම

- තරුණ ප්‍රජාව ආර්ථික ක්‍රියාවලියේ සක්‍රීය පංගුකරුවන් වීම.
- පීඩනයන්, සූරාකෑම සහ වෙනස් කොට සැලකීම්වලින් තොරවීම
- සමාජ අභිවෘද්ධියට දායකත්වය
- විද්‍යාවේ සහ නවීන තාක්‍ෂණයේ දියුණුව, සමාජයීය අභියෝග ජයගැනීමේ අභිලාෂය
- දේශපාලන, සමාජීය සහ ආර්ථික ක්‍රියාවලියට නායකත්වය සැපයිය හැකි තරුණ ප්‍රජාවක්
- සංස්කෘතික ජීවිතය සහ නිදහස් චින්තනය
- ජාතික සහ ජාත්‍යන්තර නායකත්වය දැරීමට සමත් කුසලතා සහිත තරුණ ප්‍රජාවක්
- සමාජ අසාධාරණය පිටුදකින තරුණ ප්‍රජාවක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සමෘද්ධිමත් තාරුණ්‍යයක් | සුදුසු රැකියා සහ ව්‍යවසායකත්ව අවස්ථා සුරක්ෂිත කිරීම | ▪ රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තරුණ රැකියා සඳහා මාර්ගගත ක්‍රමයක් හරහා රැකියා ස්ථානගත කිරීම් කළමනාකරණය කිරීම සඳහා රැකියා බැංකුවක් පිහිටුවීම.<br>▪ රජයේ රැකියා සඳහා තෝරාගැනීමේ ක්‍රියාවලිය සහ තරඟ විභාග යාවත්කාලීන කිරීම.<br>▪ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ තරුණ තරුණියන් සඳහා වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම.<br>▪ යෝජිත සංවර්ධන බැංකු මගින් තරුණ ව්‍යවසායකයින්ට මූල්‍ය සහය ලබා දීම.<br>▪ විශේෂ කුසලතා සහිත රැකියා විරහිත තරුණ තරුණියන්ට ව්‍යවසායකත්ව අවස්ථා ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනය සහ සුදුසු වෙළඳපොලවල් සොයා ගැනීම සඳහා පහසුකම් ලබා දීම.<br>▪ තරුණ නවෝත්පාදකයින්ගේ නව අදහස් සහ සංකල්ප අලෙවි කළ හැකි නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට "පුනරුදය සඳහා අපි (V4R)" ඩිජිටල් වේදිකාව භාවිතා කිරීම.<br>▪ තරුණ තරුණියන්ට ගෝලීය මාර්ගගත රැකියා වෙළඳපොළට ප්‍රවේශ වීමට අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ සම්පත් වලින් සන්නද්ධ කිරීම සහ අන්තර්ජාලය හරහා විදේශ විනිමය උපයන තරුණ නිදහස් සේවකයින් සඳහා ඇති බාධක ඉවත් කිරීම.<br>▪ විදේශයන්හි සිට ආපසු පැමිණෙන තරුණ තරුණියන්ට ඔවුන් කැමති විවිධ ආයෝජන ව්‍යාපෘතිවල නියැලීමට මගපෙන්වීම සහ සහය ලබා දීම. |
| අනාගතය සඳහා අපේක්ෂාවන් (අධ්‍යාපනය, විද්‍යාව සහ තාක්ෂණය, සහ නවෝත්පාදන) | තාරුණ්‍යය නවීන අධ්‍යාපනයෙන් සහ තාක්ෂණික කුසලතාවලින් සන්නද්ධ වීමට අවස්ථා සහතික කිරීම | ▪ කාර්මික හා තාක්ෂණික පාඨමාලා උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම දක්වා සංශෝධනය කිරීම.<br>▪ V4R ඩිජිටල් වේදිකාව හරහා නව අධ්‍යාපනික සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සෘජුවම රජයට යෝජනා ඉදිරිපත් කිරීමට තරුණ තරුණියන්ට ඉඩ සැලසීම.<br>▪ තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි වැඩසටහන් හරහා තාක්ෂණික කුසලතා ප්‍රවර්ධනය කිරීම<br>▪ යෞවනයන් සඳහා කුසලතා සංවර්ධනය සඳහා බහු-ආකෘති මධ්‍යස්ථාන (MMC) නිර්මාණය කිරීම.<br>▪ විවිධ ජාතීන් සහ ආගම් අතර අවබෝධය වර්ධනය කිරීම සඳහා තරුණ හුවමාරු වැඩසටහන් නිර්මාණය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සංවේදී තාරුණ්‍යයක් (කලාව, සංස්කෘතිය සහ විවේකය) | නිර්මාණශීලීත්වය සහ කලාත්මක ප්‍රකාශනය සහතික කිරීම | ▪ පාසලේ සිට ජාතික මට්ටම දක්වා තරුණ කලා කුසලතා ඇගයීමට ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ නිර්මාණාත්මක ව්‍යාපෘති සඳහා මූල්‍ය ආධාර සැපයීම.<br>▪ තරුණ නිර්මාණකරුවන් සඳහා වාර්ෂික සම්මාන උළෙලක් සංවිධානය කිරීම. |
| සෞඛ්‍ය සම්පන්න තාරුණ්‍යයක් (කායික හා මානසික යහපැවැත්ම, විෂ මත්ද්‍රව්‍ය භාවිතය, ලිංගික අධ්‍යාපනය). | සෞඛ්‍යය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම මගින් සෞඛ්‍යමත් තාරුණ්‍යයක් සහතික කිරීම | ▪ මත්ද්‍රව්‍ය භාවිතයේ අහිසි විපාක පිළිබඳව තරුණයින් දැනුවත් කිරීම.<br>▪ පුනරුත්ථාපන වැඩසටහන් වැඩිදියුණු කිරීම.<br>▪ පැය 24 පුරා රහස්‍ය උපදේශනය සහ මානසික සෞඛ්‍ය සහාය සඳහා "Youth App" යෙදුම ස්ථාපිත කිරීම. |
| ලෝකය හා සම්බන්ධිත තාරුණ්‍යයක් (සයිබර් අවකාශය සහ තොරතුරු තාක්ෂණය) | තොරතුරු සඳහා ප්‍රවේශය සහ තාක්ෂණික දියුණුව මගින් ඩිජිටල් සාක්ෂරතාවය සහතික කිරීම | ▪ දත්ත නිදහස සහ දත්ත පෞද්ගලිකත්වය සහතික කිරීම.<br>▪ සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, පාසල් සහ පුස්තකාල තුළ නොමිලේ අන්තර්ජාල ප්‍රවේශය ලබා දීම.<br>▪ දේශීය පුස්තකාල ගෝලීය විද්‍යුත් පුස්තකාල ජාල වෙත සම්බන්ධ කිරීම.<br>▪ අධ්‍යාපනය, ආර්ථිකය සහ දෛනික ජීවිතය සඳහා මෘදුකාංග සහ යෙදුම් සංවර්ධනය සඳහා සහය වීම. |
| නායකත්වයේ අනාගතය | ප්‍රමාණවත් කුසලතා සහ ධාරිතාවන් වැඩිදියුණු කිරීම තුළින් නව්‍ය තරුණ නායකයින් සහතික කිරීම | ▪ සුදුසු කෝටාවන් හරහා දේශපාලන ආයතනවල තරුණ නියෝජනය වැඩි කිරීම.<br>▪ කුසලතා සහිත තරුණ නායකයින් ගොඩනැගීම සඳහා ජාතික තරුණ සේවා සභාව සහ ඒ ආශ්‍රිත ආයතන ප්‍රතිසංවිධානය කිරීම.<br>▪ ප්‍රාදේශීය මට්ටමින් තරුණ කව පිහිටුවීම.<br>▪ අමාත්‍ය උපදේශක සභාවල තරුණ නියෝජනයක් ඇති කිරීම.<br>▪ ජාතික දේශපාලන අධ්‍යාපන ඇකඩමියක් පිහිටුවීම.<br>▪ 2022 අරගලයට අදාළව නොවිසඳුණු සහ නඩු නොපවත්වන ලද සිදුවීම් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේද සමඟ නීතිමය කටයුතු කඩිනම් කිරීම. |
| සොබාදහම සමඟ එක් වූ තාරුණ්‍යයක් | දැනුම සහ ප්‍රායෝගික ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම තුළින් පරිසර සංවේදී තාරුණ්‍යයක් සහතික කිරීම | ▪ ජාතික පාරිසරික ක්‍රියාකාරී මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම සහ ප්‍රාදේශීය තරුණ පරිසර කමිටු පිහිටුවීම.<br>▪ හානියට පත් පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහය වීම සඳහා දක්ෂ ස්වේච්ඡා කණ්ඩායමක් නිර්මාණය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ දැනුම සහ අත්දැකීම් හුවමාරුව සඳහා ජාත්‍යන්තර පාරිසරික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.<br>▪ මිනිස් - වනජීවී ගැටුම් කළමනාකරණයට තරුණයින් සම්බන්ධ කර ගැනීම. |
| ලිංගික අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය (වෙනස්, නමුත් සමාන ) | සියලුම ලිංග අනන්‍යතා සහ ලිංගික දිශානතිය සඳහා සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම | ▪ ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය සම්බන්ධ හානිකර ඒකාකෘති සංජානන ඉවත් කිරීම. |

## 2.6 ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක් | පහසුකම් වැඩිදියුණු කිරීම සහ වැඩිහිටි ආරක්ෂණ යාන්ත්‍රණය තුළින් වැඩිහිටි පුරවැසියන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් සහතික කිරීම | ▪ නිවාස තුළ වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැපයීම.<br>▪ වැඩිහිටියන්ගේ සෞඛ්‍ය කටයුතු සොයා බැලීම සඳහා සෞඛ්‍ය කණ්ඩායම් යෙදවීම.<br>▪ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම.<br>▪ යහපත් මානසික තත්ත්වයක් පවත්වාගෙන යාම සහ සමාජ සම්භාෂණය ඇති කිරීම සඳහා වැඩිහිටි අය නිර්මාණාත්මක ආර්ථික ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම.<br>▪ ගොවීන් සහ ධීවරයින් ඇතුළු පෞද්ගලික සහ අවිධිමත් අංශවල සේවය කරන අය සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ සියලුම වැඩිහිටියන්ට රැකවරණය ලැබෙන රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම.<br>▪ වැඩිහිටියන්ගේ එදිනෙදා ජීවිතය නිදහස් පරිසරයක් තුළ සතුටින් ගත කිරීම සඳහා ඇවිදින මංතීරු, ආගමික සිද්ධස්ථාන අසල නිවාඩු නිකේතන ඇති කිරීම දිරි ගැන්වීම.<br>▪ පොදු සේවා සපයන ස්ථානවල වැඩිහිටි අය වෙනුවෙන් ප්‍රමුඛතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන වැඩිහිටි පුද්ගලයින්ට මූල්‍ය ආධාර ලබා දීම. |

## 2.7 නිර්බාධිත සමාජ ජීවිතයක් - යුක්තිසහගත සම ප්‍රවේශයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ප්‍රශස්ත සේවා සම්පාදනය
- අන්තර්කරණ අධ්‍යාපනය
- ආර්ථික ස්වාධීනත්වය
- ආරක්ෂාව සහ අයිතිවාසිකම්
- සෞඛ්‍ය සහ යහපැවැත්ම
- ඒකාබද්ධ පොදු සේවාවන් සහ සම ප්‍රවේශ්‍යතාව

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ප්‍රශස්ත සේවා කළමනාකරණය සහ පාලනය | ආබාධ සහිත පුද්ගලයින්ට ආර්ථික හා සමාජීය වශයෙන් සමානව සලකන ඒකාබද්ධ සමාජයක් සහතික කිරීම. | ▪ ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් පවතින නීති සංශෝධනය කිරීම, අවශ්‍ය නව නීති හඳුන්වා දීම සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ඇතුළු සම්මුතීන් බලාත්මක කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ජාතික සැලැස්මක් සකස් කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන්හි ඵලදායීතාවය මැනීම සඳහා ඇගයීම් රාමුවක් ස්ථාපිත කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ගේ පවුල්වලට රජයේ ප්‍රතිපත්ති පිළිබඳ සම්පත් සහ තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ගගත තොරතුරු මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම.<br>▪ නවීන තාක්ෂණය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයින් සඳහා දැනුවත්භාවය, පුහුණුව සහ සහාය වැඩි කිරීම. |
| අධ්‍යාපනය | | ▪ උසස් තත්ත්වයේ, දැරිය හැකි, අන්තර්කරණය සහ පහසු ප්‍රවේශ්‍යතාවය සහිත මුල් ළමාවිය අධ්‍යාපනය ලබා දීම.<br>▪ ආබාධ සහිත පාසල් සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සහතික කිරීම.<br>▪ පාසල් ගුරුවරුන්, රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් සහ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගේ සංගෘහිත අධ්‍යාපනය පිළිබඳ දැනුම අවබෝධය පුළුල් කිරීම.<br>▪ සංඥා භාෂා පුහුණුව ලත් ගුරුවරු පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීමට පහසුකම් සැලසීම.<br>▪ සංඥා භාෂා පරිවර්තකයින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා යොමු කිරීමට පහසුකම් සැපයීම.<br>▪ සෑම අධ්‍යාපන කලාපයකම විශේෂ අධ්‍යාපන සහ ළමා සංවර්ධන සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.<br>▪ ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ ඇතුළු පහසුකම් සැපයීම.<br>▪ ආබාධ සහිත සිසුන් සඳහා පළාත් සහ ජාතික මට්ටමින් ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.<br>▪ ලාභ නොලබන, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන සත්කාර ආයතනවලට බදු සහන ලබා දීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන සේවා සැපයීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ආර්ථික ස්වාධීනත්වය | | ▪ රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල රැකියා වලින් ආබාධිත ප්‍රජාව සඳහා 3% ක් වෙන් කිරීම බලාත්මක කිරීම සහ මෙම පංගුව ක්‍රමයෙන් 5% දක්වා වැඩි කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා, ව්‍යාපාර හිමිකාරිත්වය සහ සංවර්ධනය, ස්වයං රැකියා සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම.<br>▪ ආබාධ සහිත වූවන්ට ආවේණික ගැටලු ගැන සන්නිවේදනය කිරීමට තමන් පිළිබඳ සංජානනය වෙනස් කර ගැනීමට හා අන්තර්කරණය දිරිමත් කිරීමට සේවා ස්ථාන වල ආබාධ සහිත පුද්ගල ජාල ශක්තිමත් කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහා ස්වයං රැකියාවක නිරත වීම සඳහා මූල්‍ය ආධාර පුළුල් කිරීම. |
| සෞඛ්‍යය සහ යහපැවැත්ම | | ▪ ආබාධ සහිත පුද්ගලයින්ගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ වෘත්තීය කුසලතා සහ ආකල්ප ප්‍රවර්ධනය.<br>▪ පොදු ස්ථාන සහ සේවාවන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම.<br>▪ ඔටිසම් සහ අනෙකුත් සංවර්ධන ආබාධ කල්තියා හඳුනා ගැනීම සඳහා සෞඛ්‍ය පහසුකම් හඳුන්වා දීම සහ ඔටිසම් සහිත ජනගහනයේ වර්ධනය අවම කිරීමට මැදිහත් වීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් හඳුනා ගැනීම සහ සේවාවන් වෙත ප්‍රවේශ වීම පහසු කිරීම සඳහා ප්‍රමුඛතා කාඩ්පත් ලබා දීම.<br>▪ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පුනරුත්ථාපන රෝහල් හරහා ප්‍රජා පාදක පුනරුත්ථාපන සේවා ප්‍රවර්ධනය කිරීම. |
| ආරක්ෂාව, අයිතිවාසිකම් සහ යුක්තිය | | ▪ ආබාධ සහිත පුද්ගලයින්ට රජයේ තනතුරු සඳහා අයදුම් කිරීමට සහය වීම.<br>▪ පොදු ප්‍රවාහනයේදී ආබාධ සහිත පුද්ගලයින් කෙරෙහි ප්‍රවාහන කාර්ය මණ්ඩලය සහ මහජනතාව අතර ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීම.<br>▪ නීතිමය සහාය ලබා දීම සහ උසාවි වෙත ප්‍රවේශය සහතික කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| මහජන සේවා සහ ප්‍රජා සහයෝගය | | ▪ පොදු ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ආබාධ සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ ප්‍රවේශ්‍යතාව සහතික කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ට සමාජ, ආගමික, සංස්කෘතික ක්‍රියාකාරකම් සහ විනෝදාත්මක ක්‍රීඩා සඳහා සහභාගී වීමට ඇති අවස්ථා පුළුල් කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා පොදු සහ පෞද්ගලික ප්‍රවාහන භාවිතය පහසු කිරීම සඳහා ප්‍රමිතීන් බලාත්මක කිරීම සහ විශේෂිත ප්‍රවාහන සේවා සැපයීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාර්ගගත සේවාවන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ට අදාළ නවෝත්පාදනයන් දිරිමත් කිරීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින් භාවිතා කරන සහායක උපාංග ආනයනය කිරීම සඳහා බදු සහන ලබා දීම.<br>▪ ශ්‍රවණාබාධ සහිත පුද්ගලයින් සඳහා සන්නිවේදන භාෂාව ලෙස සංඥා භාෂාව හඳුනා ගැනීම.<br>▪ ආබාධ සහිත පුද්ගලයින්ගේ කලාත්මක හා සංස්කෘතික සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා අන්තර්කරණ රංග ශාලා සහ ක්‍රීඩා පහසුකම් නිර්මාණය කිරීම. |

## 3 වන පරිච්ඡේදය

## 3. නවීන ජීවිතයක් - පොහොසත් රටක්

### හැඳින්වීම: ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග සහ ප්‍රතිසංස්කරණ උපාය මාර්ග

නිදහසින් පසු මුහුණ දුන් ගැඹුරුම හා සංකීර්ණම සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදය හේතුවෙන්, වර්තමානයේදී මෙරට ආර්ථික වර්ධනය පහල මට්ටමක පවතින අතර මූලික අවශ්‍යතාවයන්වත් සපුරා ගැනීමට නොහැකි පරිදි ජනතාවගේ මූර්ත ආදායම පහළ වැටී ඇත. දුර්වල විදේශීය සංචිත භාවිතය සහ විදේශ විනිමය අනුපාත කළමනාකරණය, රටේ ණය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩ ලෙස පහත වැටීම හා විදේශීය ආයෝජන අඩු මට්ටමක පැවතීම, ඉහළ යන ආනයන වියදම් හා වර්ධනය නොවන අපනයන ආදායම හේතුවෙන් ආර්ථිකයේ විදේශීය අංශය දිනෙන් දිනම දුර්වල වෙමින් පවතී. අකාර්යක්ෂමතාවය, වංචා දූෂණය හා බදු පැහැර හැරීම් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ බදු ආදායම ශීඝ්‍ර ලෙස පහත වැටී ඇත. දුර්වල රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හේතුවෙන් 1990 දී රුපියල් බිලියන 310 ක් වූ ජාතික ණය බර 2024 වන විට රුපියල් ට්‍රිලියන 28 කට වඩා වැඩි වී ඇත. මෙරට ආර්ථික ප්‍රතිලාභ බෙදීයාමේ දැඩි විෂමතාවයක්ද දක්නට ලැබේ. ජාතික අදායමෙන් 50ක ප්‍රතිශතය බුක්ති විඳිනුයේ ජනගහනයෙන් ඉහලම ආදායම්ලාභී සියයට 20 ක ප්‍රතිශතයක් වන අතර ජනගහනයෙන් 26% ක දරිද්‍රතාවයෙන් පෙළේ.

මෙරට කෘෂිකාර්මික අංශය යල් පැන ගිය පිළිවෙත් හා ප්‍රතිපත්ති හේතුවෙන් විවිධ අභියෝගයන්ට මුහුණපා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන පිරිවැය ඉහළ යාමත් ගොවීන්ගේ ආදායම අඩු වීමත් සිදුව ඇත. නව ප්‍රතිපත්ති මගින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ තිරසරභාවය ඇති කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම, ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය වුවද, පශු සම්පත් අංශයද, සත්ත්ව ආහාරවල පවතින හිඟකම, රෝග සහ ප්‍රමාණවත් නොවන ව්‍යාප්ත සේවාවන් වැනි ප්‍රධාන අභියෝගයන්ට මුහුණපා ඇත.

දළ දේශීය නිෂ්පාදිතය සඳහා ධීවර අංශයේ දායකත්වය හා රටෙහි මත්ස්‍ය පරිභෝජනය පහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකරව බලපා ඇත. ඉහළ පිරිවැය හා නීතිවිරෝධීව මසුන් ඇල්ලීම අංශයේ තිරසරභාවය උදෙසා ගනු ලබන ප්‍රයත්නයන් තවදුරටත් අභියෝගයට ලක්කර ඇත.

තොරතුරු තාක්ෂණය අංශයේ, නිපුණ ශ්‍රම බලකායක් සිටියද, කුසලතා පරතරය (skills gap )සහ පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සීමිත වැවින් වර්ධනය අවම වේ.

ශ්‍රී ලංකාව එහි නවෝත්පාදන හැකියාව සීමා කරමින්, සංසන්දනාත්මක රටවලට වඩා බෙහෙවින් පහළින් පර්යේෂණ සහ සංවර්ධන සඳහා ආයෝජනය කරන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.12%ක් පමණි. කාර්මික වර්ධනය බංග්ලාදේශය සහ වියට්නාමය වැනි ජාතීන්ට වඩා පසුගාමී වන අතර, දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සැලැස්මක් අවශ්‍ය වේ.

ප්‍රයෝජනයට නොගත් ඛනිජ සම්පත් සහ මැණික් කර්මාන්තයේ යල් පැන ගිය රෙගුලාසි නිසා සංවර්ධනය සඳහා මගහැරී ගිය අවස්ථා තිබේ.

බලශක්ති අංශයේ අධික පිරිවැය මූලික වශයෙන් තෙල් මත යැපීම නිසා පිරිසිදු බලශක්තිය වෙත මාරුවීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි.

ප්‍රවාහනයේ ඇති අකාර්යක්ෂමතා මාර්ග අනතුරු ප්‍රතිශතය ඉහළ යැමට දායක වන බව දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ උපායමාර්ගික සමුද්‍රීය පිහිටීම, ප්‍රධාන වරායන් සංවර්ධනය කිරීම සඳහා විභවයක් ලබා දෙයි. යටත් විජිත නීති මත පදනම් වූ ඉඩම් කළමනාකරණ ගැටලු සමාජ-ආර්ථික විෂමතා පවත්වාගෙන යාමට හේතු වේ. ඉදිකිරීම් කර්මාන්තය මුහුණදෙන අකාර්යක්ෂමතා සහ දූෂණයන් පිටු දැකීමට මෙන්ම මෙම  ක්ෂේත්‍රයන්හි ආර්ථික වර්ධනයක් ලබා කර ගැනීමට පුළුල් ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වේ.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් නගා සිටුවීම සඳහා සඳහා දැරිය හැකි , අන්තර්කරණය වූ  සහ තිරසර ආර්ථිකයක් නිර්මාණය කිරීම

## 3.1 ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක් - පොහොසත් රටක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- මනුෂ්‍යත්වයට ප්‍රමුඛතාවය
- ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය
- මහජන සහභාගීත්වය හා අන්තර් ග්‍රාහිත සමාජයක්
- ආහාර සුරක්ෂිතතාවය
- සාධාරණ ආර්ථික ප්‍රතිලාභ
- තිරසර සම්පත් භාවිතය
- වාණිජකරණය නොවූ මහජන සේවයක් සහ සමාජ ආරක්ෂණය
- ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සාමූහිකත්වය
- ගෙවීම් නොලබන ජනතා ශ්‍රම දායකත්වය සුරැකුම් ආර්ථිකය ලෙස පිළිගැනීම
- ප්‍රගතිශීලී සහ සාධාරණ බදුකරණය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| රාජ්‍ය මූල්‍ය අංශය | බදු එකතු කිරීමේ සහ පරිපාලනයේ කාර්යක්ෂමතාව හා සාධාරණභාවය වැඩි දියුණු කිරීම | • බදු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ අංශයක් සහිතව නව ඒකකයක් පිහිටුවීම.<br>• බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම.<br>• දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණුව සහ ධාරිතා සංවර්ධනය කිරීම<br>• හිඟ බදු කඩිනමින් එකතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම<br>• සාධාරණ පදනමක් මත බදු අනුපාත සහ බදු කාණ්ඩ සංශෝධනය කිරීම<br>• එකතු කළ අගය මත බද්දට අදාළ භාණ්ඩ වර්ගීකරණය කොට ඒ ඒ කාණ්ඩය සඳහා වෙනස් බදු අනුපාත හඳුන්වා දීම.<br>• යෙදවුම් සඳහා වන එකතු කළ අගය මත බදු (Input VAT) මත වන අපනයන සංවර්ධන බදු අපනයනකරුවන්ට කඩිනමින් ආපසු ලබාදීම.<br>• දැනට ක්‍රියාත්මක අභිමත බදු විගණනය වෙනුවට අවදානම් පාදක විගණන වලට මාරු වීම.<br>• ආනයන හා අපනයන වෙළඳ පහසුකම් සැලසීමට අනෙකුත් රාජ්‍ය ආයතන සහ ශ්‍රී ලංකා රේගුව ඒකාබද්ධ කරමින් තනි සේවා කවුළුවක් පිහිටුවීම.<br>• සාධාරණ ලෙස රේගු බදු ආදායම වැඩි කර ගැනීම සඳහා පවතින සංකීර්ණ තීරුබදු අනුපාත ව්‍යුහය සරල කිරීම.<br>• ආනයන සහ අපනයනකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා අඩු පිරිවැය සේවාවන් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ කටයුතු විමධ්‍යගත කිරීම.<br>• ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (MSMEs) සඳහා අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන ක්‍රමය යටතේ (TIEP) අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර ආනයනය සඳහා පහසුකම් සැලසීම.<br>• ජාත්‍යන්තර ගිවිසුම් වලට අනුකූලව සහ අදාළ මාර්ගෝපදේශ අනුව ජාත්‍යන්තර ගනුදෙනු මත අවම ගෝලීය බද්දක් ( Minimal global taxation) පැනවීම.<br>• බදු අය කිරීමේ කාර්යක්ෂමතාව සහ සාධාරණ බව සහතික කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ජාලගත කිරීම.<br>• එකතු කළ අගය මත බදු එකතු කිරීම විධිමත් හා කාර්යක්ෂම කිරීම සඳහා පොයින්ට් ඔෆ් සේල්ස් (POS) යන්ත්‍ර සහ ඩිජිටල් ඉන්වොයිසින් ක්‍රම හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | • බදු තක්සේරු කිරීම, බදු වාර්තා ගොනු කිරීම, බදු ගෙවීම සහ අතිරික්ත බදු ආපසු ගෙවීම සඳහා ජංගම දුරකථන මඟින් ගෙවීමේ පහසුකම්ද සහිත මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>• ජාත්‍යන්තර ගනුදෙනු සහ හුවමාරු මිල (Transfer Pricing) මත සිදුවන බදු කාන්දුවීම්, බදු පැහැර හැරීම්, ඌන ඉන්වොයිසින් හා අධි ඉන්වොයිසින් වැලැක්වීමට රටවල් අතර ස්වයංක්‍රීය තොරතුරු හුවමාරුව (AEoI) වැනි ක්‍රියාමාර්ග හඳුන්වාදීම. |
| | රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂමතාව, විනිවිදභාවය, නිසි පාලනය, වගවීම හා මූල්‍ය විනය වැඩිදියුණු කිරීම. | • විනිවිදභාවය සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ව්‍යාපාරවල මෙහෙයුම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමට මහජනතාවට පහසුකම් සැලසීම. උපාය මාර්ගික වැදගත්කම, ආර්ථික වර්ධනයේ විභවතාවය, නිෂ්පාදන ආර්ථිකය උත්තේජනය කිරීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වයට ඇති බලපෑම සහ ජාතික ආරක්ෂාවට ඇති අදාළත්වය සලකා බලමින් එක් එක් රාජ්‍ය ව්‍යවසාය ව්‍යාපාර සම්බන්ධයෙන් ගත හැකි නිසි ක්‍රියාමාර්ග ගැනීම.<br>• විනිවිධභාවය සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ව්‍යාපාරවල මෙහෙයුම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමට මහජනතාවට පහසුකම් සැලසීම.<br>• ණය තිරසරභාවය පවත්වා ගැනීම සහ දරාගත හැකි මට්ටමක ණය පොලිය තබා ගැනීම අරමුණු කරගත්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිතා කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් (DSA) සකස් කිරීම.<br>• රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය සහ ආණ්ඩුවේ වගවීම සහතික කිරීමට සහ ණය අයථා ලෙස පරිහරණය කළ අයට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා රජයන් විසින් ලබාගත් විදේශ ණය සම්බන්ධයෙන් සවිස්තරාත්මක ණය විගණනයක් ( Debt Audit) කඩිනමින් සිදුකිරීම.<br>• රටේ සහ බැංකු පද්ධතියේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය විනය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම.<br>• විද්‍යුත් ප්‍රසම්පාදනය ව්‍යාප්ත කිරීම. |
| මූල්‍ය අංශය | මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | • ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආර්ථික කටයුතු යථාතත්ත්වයට පත් කිරීම සහ හිඟ ණය සඳහා සහන සැලසීමට නව "සහන බැංකුවක්" ස්ථාපිත කිරීම.<br>• ව්‍යවසායකයින් සඳහා දිගුකාලීන මූල්‍යකරණය, නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ පවතින ව්‍යාපාර ප්‍රසාරණය කිරීම සඳහා, නව "ජාතික සංවර්ධන බැංකුවක්" ස්ථාපිත කිරීම.<br>• කුඩා පරිමාණ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | • විදේශ විනිමය වෙළෙඳපොළ ඇතුළු මූල්‍ය වෙළෙඳපොළවල ස්ථාවරත්වය සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික ස්ථායි කිරීම.<br>• බැංකු මුදල් සහ ඉතුරුම් නිෂ්පාදන ආර්ථික ක්‍රියාකාරකම්වල විධිමත් ආයෝජනය කිරීමට නව මූල්‍ය යෝජනා ක්‍රම හඳුන්වා දීම.<br>• ස්ථාවරත්වය සහ කාර්යක්ෂමව වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය බැංකු ප්‍රති-ප්‍රාග්ධනීකරණය කිරීම. |
| | වඩා හොඳ සේවා සැපයීමක් සහතික කිරීමට, ක්ෂුද්‍ර මූල්‍ය මෙහෙයුම් අධීක්ෂණය සහ ප්‍රමිතිකරණය වැඩිදියුණු කිරීම සහතික කිරීම. | • නීතිමය විධිවිධාන සහ මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් ලබා දී ඇති ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳ සමාලෝචනය කොට අගතියට පත් පාර්ශවයන්ට සහන සැලසීම.<br>• ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කිරීම දිරිගැන්වීම සහ එම කටයුතු අධීක්ෂණය විධිමත් කිරීම. |
| | මූල්‍ය අපරාධ අනාවරණය කර ගැනීමේ සහ වැළැක්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | • රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) ශක්තිමත් කිරීම. |
| විදේශීය අංශය | ජාතික ප්‍රමුඛතා, ගෝලීය තිරසර න්‍යාය පත්‍රය සමඟ අනුගත කරමින් දිගුකාලීන ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම. | • විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා නව විගමණික බැඳුම්කර (Expatriate Bonds) ඇතුළු ඉතුරුම් සහ ආයෝජන සැලසුම් හඳුන්වා දීම.<br>• තිරසර සංවර්ධන ඉලක්ක සහිත ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට නව සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම.<br>• තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෝලීය නීල හරිත අරමුදල් වෙත ප්‍රවේශ වීමට බැඳුම්කර නිකුත් කිරීම.<br>• ජාතික ප්‍රමුඛතා සහ සංවර්ධන ක්‍රමෝපායන් සමඟ ගැළපෙන යෝජිත සහ දැනට අතරමැද නතර වී ඇති සෘජු විදේශ ආයෝජන (FDIs) කඩිනම් කිරීම.<br>• අපනයන විවිධාංගීකරණය මඟින් විදේශ වෙළඳ කොටස වැඩි කිරීම සඳහා පවත්නා වෙළඳ ගිවිසුම් නැවත සළකා බැලීම සහ නව ගිවිසුම්වලට එළඹීම.<br>• සංචාරක කර්මාන්තයෙන් හා තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් විදේශ විනිමය ඉපැයීම් වර්ධනයට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.<br>• අපනයන ඉපැයීම් වලට සාපේක්ෂව විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීම හා මෙහෙයුම් කාර්යක්ෂම කිරීම සඳහා විදේශ විනිමය පනත සංශෝධනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ආයෝජන ප්‍රවර්ධන | ආයෝජන සඳහා ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහිත හිතකර පරිසරයක් නිර්මාණය කිරීම. | • ආයෝජන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධීකරණය කරනු ලබන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයද ඇතුළත් දැනට ක්‍රියාත්මක රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් බලගන්වන ලද තනි ආයතනයක් ස්ථාපිත කිරීම.<br>• ආයෝජන කැඳවීම හා පවත්වාගෙන යාමේදී විනිවිදභාවය සහ සාධාරණ බව සහතික කිරීමට ජාත්‍යන්තරව පිළිගත් මූලධර්මවලට හා ක්‍රමවේදයන්ට අනුකූලව නීති පද්ධතියක් හඳුන්වා දීම.<br>• නව ව්‍යාපාරවලට පිවිසීමේ පහසුව, ආයෝජන අවස්ථා සොයා ගැනීමේ සම අවස්ථා , උපයෝගිතා පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව, අවශ්‍ය දක්ෂ ශ්‍රමය, කාර්යක්ෂම මූල්‍ය සේවා, ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීමේ හැකියාව කාර්යක්ෂම ගැටුම් නිරාකරණය සහ බේරුම්කරණ යාන්ත්‍රණය සහ වෙළඳපල තරඟකාරිත්වය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.<br>• ඒකාබද්ධ යාන්ත්‍රණයක් යටතේ ව්‍යාපාර ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, සහතික කිරීම්, ඉඩම් භාවිතය සඳහා අවසර ලබා දීම, විදුලිය, ජලය, සන්නිවේදන සේවා ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීම සඳහා තනි කවුළුවක් ස්ථාපිත කිරීම.<br>• ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ගෝලීය තරඟකාරීත්ව දර්ශකයෙන් (Global Competitive Index) ශ්‍රී ලංකාව ඉහලට එසවීමට කටයුතු කිරීම.<br>• නව ආයෝජන අවස්ථා සඳහා ප්‍රාග්ධන අරමුදල් (Venture Capital Funds) දිරි ගැන්වීම.<br>• ප්‍රාග්ධන වෙළඳපොළ කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වා ගැනීම, ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කිරීම සහ නීති විරෝධී ගනුදෙනු සහ අල්ලස් නැවැත්වීම සඳහා රාජ්‍ය ආයතන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම.<br>• උපායමාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් රාජ්‍ය, පෞද්ගලික හා මහජන හවුල්කාරිත්වය (PPPP) යටතේ දිගුකාලීන විදේශ ආයෝජන දිරිගැන්වීම.<br>• විදේශගත ශ්‍රමිකයින්ට ඔවුන්ගේ ඉපැයීම් ආයෝජනය කිරීම සඳහා විශේෂ ප්‍රතිලාභ සහිත ආයෝජන යෝජනා ක්‍රම හඳුන්වා දීම.<br>• ප්‍රාග්ධනය සම්පාදනය සඳහා මූලික කොටස් නිකුත් කිරීමේදී (IPO) උචිත බදු සහන ලබා දීම<br>• සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් ලැයිස්තුගත කිරීම පහසුකරවීම, වගකිවයුතු තොරතුරු වාර්තාකරණය, විනිවිදභාවය සහ විධිමත් පාලනය පහසුකරන කාර්යක්ෂම හා දියුණු සුරැකුම් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රසාරණය කිරීම හා වැඩිදියුණු කිරීම.<br>• ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලධර්මවලට අනුකූලව සාධාරණ සැලකීම, සාධාරණ වේතන, ආරක්ෂිත සේවා කොන්දේසි ඇතුළු කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | • එකඟතා හා සහයෝගීතා තුළින් කම්කරුවන් සවිබල ගැන්වෙන, නිෂපාදන ඵලදායිතාව වැඩි කරන හා එකිනෙක පාර්ශවයන්ට ප්‍රජාතන්ත්‍රවාදීව වගකීම් පැවරෙන සාමූහික මැදිහත් වීම් තුළින් කම්කරු සබඳතා වැඩි දියුණු කිරීමට පියවර ගැනීම.<br>• පාර්ශ්වකරුවන්ගේ මැදිහත් වීම් මඟින් කාර්මික ආරවුල් සහ ගැටලු ප්‍රජාතන්ත්‍රවාදීව විසඳීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම. |
| දේශීය වෙළඳාම | විවිධාංගීකරණය වූ ප්‍රවේශයන් හරහා මහජනතාවට උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම සහතික කිරීම. | • මහා පරිමාණ ආර්ථික හා භූවමාරු මධ්‍යස්ථාන දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීම.<br>• භාණ්ඩ හා සේවා වෙළඳාම අඛණ්ඩව සාධාරණව සහ උසස් තත්වයෙන් පවත්වාගෙන ගැනීම, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වෙළඳාමට අදාළ තොරතුරු වල විනිවිදභාවය සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් සහ මාර්ගගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>• වෙළඳාම සහ බෙදාහැරීමේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය, බැංකු, ප්‍රවාහන, රක්ෂණ, සන්නිවේදන, ඇසුරුම්කරණය සහ ගබඩා කිරීම් වැනි උපකාරක සේවා කාර්යක්ෂමව ලබාගත හැකි සේවා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>• නිෂ්පාදනය සහ පරිභෝජනය අතර ක්‍රියාකාරකම්වලදී වටිනාකම් නිර්මාණය නොවන අනවශ්‍ය මැදිහත්වීම් ඉවත් කිරීම සහ අතරමැදියන් සක්‍රීයව වටිනාකම් නිර්මාණය කරන්නන් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම.<br>• වෙළඳපොළ පවතින තොරතුරු අසමමිතිය ඉවත් කිරීම සඳහා අවශ්‍ය නීති වෙනස් කිරීම සහ නව නීති හඳුන්වා දීම.<br>• මැණික්, ස්වර්ණාභරණ, වටිනා ගල් වර්ග, ඇඟලුම් හස්ත කර්මාන්ත ඇතුළු විභවයන් ඇති වෙනත් නිෂ්පාදන සඳහා විදේශීය ගැනුම්කරුවන් ඉලක්ක කර ගනිමින් වෙළඳපොළ ස්ථාන ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම.<br>• ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව මුහුණ දෙන වෙළඳපොළට ප්‍රවිශ්ය වීම ඇතුළු වෙළඳාමට අදාළ ගැටලු විමර්ශනය කරමින් සහ විසඳුම් ලබා දීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>• අත්තනෝමතික ලෙස මිල ඉහළ දැමීම (Price Gouging) නැවැත්වීම සහ වෙළඳපොළ තුළ භාණ්ඩ හිගයන් නිර්මාණය කිරීම වැළැක්වීම සහ වෙළඳපොළ ඒකාධිකාරීත්වය, කතිපයාධිකාරීත්වය හා කාටල බිහිවීම වැළැක්වීම.<br>• මධ්‍යගත තොරතුරු පද්ධතියක් මගින් රාජ්‍ය සේවා සැපයීමේ ගුණාත්මකභාවය සහතික කිරීමට, නියාමනය කිරීමට සහ පරිපාලනය කිරීමට ඒකාබද්ධ සුහුරු පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| විදේශ වෙළඳාම | භාණ්ඩ හා සේවා අපනයනය විවිධාංගීකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සහ එයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම. | • අපනයන භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම.<br>• අපනයන මූල්‍ය පහසුකම්, සහතික කිරීම් සේවා, රක්ෂණ, වෙළඳපළ හා භාණ්ඩ ඉල්ලුම පිළිබද ප්‍රවණතා, නව වෙළඳපළ සොයා ගැනීම් නිෂ්පාදන සහ ගෝලිය වටිනාකම් දාමයන් පිළිබද තොරතුරු ලබා දෙමින් නිෂ්පාදකයින්ට හා අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයීම.<br>• ඉන්දියාව, චීනය, උප සහරා අප්‍රිකාව, මැදපෙරදිග සහ යුරෝපය ඉලක්ක කර ගනිමින් සහ විශේෂයෙන් ගෝලීය සැපයුම් දාමයන් සහ අගය දාමයන් සදහා භාණ්ඩ හා සේවා වෙළඳාම ප්‍රවර්ධනය කිරීම.<br>• බොරතෙල්, ඉන්ධන, ගෑස්, ඛනිජ නිෂ්පාදන සහ කුළුබඩු ඇතුළු භාණ්ඩ වෙළඳාම සඳහා පිරිවැය අඩු කරන සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් බිහිකිරීම.<br>• සාම්ප්‍රදායික නොවන සහ අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය සහ අපනයනය ප්‍රවර්ධනය කිරීම.<br>• දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩවලට ප්‍රමුඛත්වය දීම සහ ආනයන සඳහා තරඟකාරී පිවිසීම යන කරුණු මූලික කොට ආනයන ප්‍රතිපත්ති සංශෝධනය කිරීම.<br>• ප්‍රපාතන විරෝධී (Anti-Dumping) නීතිරීති ශක්තිමත් කිරීම සහ සාධාරණ වෙළඳාම (Fair Trading) පිලිබදව නව නීති හඳුන්වා දීම සහ පවතින නීති යාවත්කාලීන කිරීම.<br>• ශ්‍රී ලංකාවේ සන්නාම අනන්‍යතාවයට සහ ප්‍රතිරූපයට හානි නොවන පරිදි අගය එකතු කළ ප්‍රති අපනයන සහ අන්තරාල (Enterpot) වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා අවශ්‍ය පහසුකම් ලබාදීම.<br>• තත්ත්ව සහතික කිරීම සහ තත්ත්ව පරීක්ෂණ මගින් ආනයන භාණ්ඩවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.<br>• වෙළඳ ගිවිසුම්, අපනයන ප්‍රවර්ධන මුලපිරීම් සහ ජාලකරණය හරහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම. |

## ප්‍රතිපත්ති මූලධර්මයන්

- ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව
- කෘෂිකාර්මික පද්ධතීන්හී ඉහළ නිෂ්පාදනය සහ ඵලදායිතාවය
- සවිමත් ව්‍යවසායකත්වය සහ ස්ථායි වෙළඳපොළ
- නිවැරදි ඉඩම් කළමණාකරණය
- නිවැරදි කෘෂි පිළිවෙත් කළමනාකරණය
- පරිසර හිතකාමී කෘෂි මෙහෙයුම්
- කෘෂි නිෂ්පාදකයා සවිබල ගැන්වීම
- දේශගුණික සහ අනෙකුත් අවදානම් කළමණාකරණය
- කෘෂිකාර්මික පර්යේෂණ, ව්‍යාප්ති සහ දැනුම කළමනාකරණය
- මනා කෘෂි මෙහෙයුම් කළමනාකරණය සහ පාලනය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ජාතික ආහාර සුරක්ෂිතතාව | ආහාර පද්ධතිවල ඵලදායිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ දැමීම සහ නිෂ්පාදන සැපයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | ▪ දේශීයව නිෂ්පාදනය කල හැකි සියලුම ආහාර ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය දිරිමත් කිරීම සහ ආනයනික බෝග සඳහා සුදුසු ආදේශක බෝග දේශීයව වගා කිරීම.<br>▪ දේශීය ආහාර තොග සඳහා තත්‍ය කාලීන දත්ත ගබඩාවක් පවත්වා ගැනීම සහ අවම වශයෙන් මාස තුනක කාලයක් සඳහා ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම.<br>▪ රාජ්‍ය - පෞද්ගලික - ජනතා හවුල්කාරීත්වය යටතේ ආහාර සහ කෘෂි නිෂ්පාදන ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සැකසුම්කරණයේ දී ශීත දාම කළමනාකරණ තාක්ෂණය යොදා ගැනීම. |
| කෘෂිකාර්මික පද්ධතීන්හී ඉහළ නිෂ්පාදනය හා ඵලදායිතාව | කෘෂිකාර්මික භාවිතයන් නිසි ලෙස කළමනාකරණය කිරීම තුලින් කෘෂිකාර්මික පද්ධතීන්හී ඉහළ නිෂ්පාදනය හා ඵලදායිතාව සඳහා අවශ්‍ය හිතකර පරිසරයක් ඇති කිරීම | ▪ යාවත්කාලීන සහ තත්‍ය කාලීන ජාතික කෘෂිකාර්මික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ ඉඩම් හිමිකාරිත්වය එලෙසම පවත්වා ගනිමින්, කුඩා පරිමාණ වගා ඒකක මනා කෘෂි කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරන, ගොවි සමාගම් / සමුපකාර ලෙස මධ්‍ය හා විශාල පරිමාණ වගා ඒකක බවට පරිවර්තනය දිරිමත් කිරීම.<br>▪ වන සතුන්ගෙන් වන වගා හානි අවම කිරීම උදෙසා විසඳුම්<br>▪ වැව්, ඇළ මාර්ග සහ ගංගා හැරවුම් ඇතුළු ප්‍රධාන වාරි පද්ධති කාලීනව ප්‍රතිසංස්කරණය කිරීම.<br>▪ එල්ලංගා පද්ධති නැවත පන ගැන්විය හැකි ගංගා ද්‍රෝණි සක්‍රීය කිරීම සහ පුරාණ වාරි ශිෂ්ටාචාරය විදහා දැක්වෙන වාරි කෞතුකාගාරයක් නිර්මාණය කිරීම.<br>▪ තාක්ෂණික සහ මුල්‍ය පහසුකම් ලබාදීම හරහා වැසි ජල සංරක්ෂණය සහ ක්ෂුද්‍ර ජල සම්පාදනය වැනි ජල සංරක්ෂණ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම.<br>▪ වසර තුනක් ඇතුළත තේ නිෂ්පාදනය දෙගුණ කිරීමට තාක්ෂණික, මුල්‍ය සහ අනෙකුත් පහසුකම් සැපයීම.<br>▪ කන්තලේ සීනි කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කිරීම සහ උක් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම.<br>▪ කෘෂි නිෂ්පාදන සැකසීම සහ ප්‍රවාහනය සඳහා තාක්ෂණික සහ මුල්‍ය පහසුකම් සැපයීම.<br>▪ සංසන්දනාත්මක සහ තරඟකාරී වාසි මත පදනම්ව සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල පොල්, රබර්, කුරුඳු වැනි වාණිජ බෝග ක්‍රමානුකූලව වගා කිරීමට ගොවීන් යොමු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ දේශීයව සුලබ ස්වභාවික අමුද්‍රව්‍ය සහ නිෂ්පාදිත අපද්‍රව්‍ය භාවිතයෙන් පරිසර හිතකාමී ලෙස කෘතිම පොහොර, කාබනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන නිෂ්පාදන දිරිමත් කිරීම.<br>▪ බීජ හා රෝපණ ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම, නිෂ්පාදන ප්‍රවර්ධනය, සැකසීම සහ අලෙවිය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ දිරිමත් කිරීම<br>▪ ගොවීන්ට කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහන පදනම මත ලබා ගැනීම සඳහා ගොවිජන බල ප්‍රදේශ මට්ටමින් කෘෂි යන්ත්‍රෝපකරණ සැපයුම් මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ පොහොර ඇතුළු කෘෂි යෙදවුම් සාධාරණ මිලකට ලබා ගැනීමට පහසුකම් සැලසීම. |
| | තිරසර කෘෂිකාර්මික නිෂ්පාදනයක් සඳහා ප්‍රශස්ත ඉඩම් කළමනාකරණය | ▪ නිවැරදි ඉඩම් පරිහරණය සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් කෘෂිකාර්මික දත්ත පද්ධතියක් සහිත ඩිජිටල් භූමි සිතියම්කරණය.<br>▪ ඉඩම් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා බෝග-සත්ත්ව වගා පද්ධති ලෙස ඒකාබද්ධ ගොවිතැන ප්‍රවර්ධනය කිරීම.<br>▪ නව තාක්‍ෂණය යොදා ගනිමින් ඌන භාවිත සහ ආන්තික ඉඩම් කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා යොදා ගැනීම.<br>▪ සාරවත් ඉඩම් කෘෂිකාර්මික නොවන අරමුණු සඳහා භාවිතා කිරීම සීමා කිරීම. |
| කෘෂි ව්‍යවසායකත්වය සංවර්ධනය | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සහ තිරසර වෙළෙඳපොළ දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම | ▪ නිෂ්පාදන සහ වෙළෙඳපොළ බලවේග නියාමනය මඟින් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීම.<br>▪ කෘෂි ව්‍යවසායකයින් 50,000ක් වසර පහක් ඇතුළත ස්ථාපිත කිරීමට මූල්‍ය සහාය.<br>▪ සංවිධිත ගොවි සංවිධාන, පෞද්ගලික අංශයේ දායකත්වය ද සහිතව කෘෂි කාර්මික කලාප සංවර්ධනය කිරීම.<br>▪ කෘෂිකර්මාන්තය මත පදනම් වූ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායයන් සඳහා අවස්ථා පුළුල් කිරීම.<br>▪ අපනයන කෘෂි බෝග ආශ්‍රිතව වටිනාකම එකතු කළ නිෂ්පාදන කර්මාන්ත සන්නාමගත අපනයන නිෂ්පාදන බවට ප්‍රවර්ධනය කිරීම.<br>▪ කුඩා හා මධ්‍යම පරිමාණයේ කෘෂිකාර්මික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහ මූල්‍ය පහසුකම් සමඟින් වෙළඳපල අවස්ථා තවදුරටත් පුළුල් කිරීම.<br>▪ කෘෂිකර්මාන්තය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට පහසුකම් සැලසීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ශ්‍රී ලාංකේය සන්නාම (සිලෝන් ටී, සිලෝන් සිනමන් ආදිය) වැඩිදියුණු කිරීමට සහ වැවිලි නිෂ්පාදන අගය ඉහළ වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට රාජ්‍ය මැදිහත්වීම.<br>▪ අපනයන කෘෂි ගම්මාන 1,000ක් පිහිටුවීම. |
| පරිසර හිතකාමී කෘෂි මෙහෙයුම් | තිරසර ආහාර නිෂ්පාදනය සඳහා පරිසර හිතකාමී මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම | ▪ ස්ථානීය (site specific) නිර්දේශ මත පදනම්ව පොහොර සහ අනෙකුත් යෙදවුම් යෙදීමට ගොවීන් දිරිමත් කිරීම.<br>▪ සහතිකලත් කාබනික වගාවන් ප්‍රවර්ධනය තුළින් එම භූමි ප්‍රමාණය වැඩි කිරීම.<br>▪ ආහාර බෝග නිෂ්පාදන ඒකකයන් ක්‍රමිකව "යහපත් කෘෂිකාර්මික පිළිවෙත්" අනුගමනය කරනු ලබන ගොවිපළ බවට පත්කිරීම<br>▪ යහපත් කෘෂි පිළිවෙත් මත පදනම්ව රසායනික හා කාබනික පොහොර සහ අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම. |
| දේශගුණික අවදානම් කළමනාකරණය | අඛණ්ඩ ආහාර නිෂ්පාදනයක් සහතික කිරීම අරමුණු කර ගනිමින් දේශගුණික අවදානම් කළමනාකරණය සහ ඊට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම | ▪ දේශගුණික විපර්යාසයන්ට අනුගත බෝග ප්‍රභේද, වගා හා වාරි තාක්ෂණික ක්‍රම සැලසුම් කිරීම, ජනනය කිරීම සහ යොදා ගැනීම.<br>▪ කෘෂි බෝග නිෂ්පාදනය සහ මනා ජල කළමණාකරණයට මඟ පෙන්වීම සඳහා වැඩි දියුණු කළ කාලගුණ පුරෝකථන පද්ධතියක් ස්ථාපිත කිරීම. |
| කෘෂි නිෂ්පාදකයින් සවිබල ගැන්වීම | ඉහළ ජීවන තත්ත්වයක් සඳහා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම | ▪ ගොවීන් විසින් කළමණාකරණය කරන්නා වූ සමුපකාර සහ ගොවි සමාගම් ප්‍රවර්ධනය කිරීම.<br>▪ තේ,රබර්,පොල් වැනි බහු වාර්ෂික බෝග වගාවන් හී අතුරුබෝග වගාව සහ බෝග විවිධාංගීකරණය සඳහා තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් පහසුකම් ලබාදීම.<br>▪ රබර් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දැනට කිරි කැපීමට භාවිත නොකරන රබර් ඉඩම් හඳුනාගෙන ඒවා රබර් කිරි කැපීම සඳහා යොමු කරවීම සහ වැහි ආවරණ භාවිතය දිරිමත් කිරීමට මූල්‍ය පහසුකම් ලබාදීම.<br>▪ ක්ෂුද්‍ර ජල සම්පාදනය යටතේ ඉහළ අස්වැන්නක් ලබා දෙන අර්ධ වාර්ෂික හෝ බහු වාර්ෂික බෝග ප්‍රභේද වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් මිලියනයක් බැගින් වන ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම.<br>▪ ගොවීන් සඳහා විධිමත් කෘෂි රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.<br>▪ වැඩි ප්‍රතිලාභ සහිත වඩාත් ශක්තිමත් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| පර්යේෂණ සහ සංවර්ධනය | කෘෂි නිෂ්පාදන වල ඵලදායිතාවය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වඩාත් ඵලදායී ව්‍යාප්ති / උපදේශන සේවාවක් සමඟින් කෘෂිකාර්මික පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ දැනුම කළමනාකරණය | ▪ ඵලදායි ව්‍යාප්ති සේවා සැපයීම සඳහා දැනුම සහ අවශ්‍ය සම්පත් සමඟ ව්‍යාප්ති නිලධාරීන් සන්නද්ධ කිරීම.<br>▪ කාර්යක්ෂම කෘෂි ව්‍යාප්ති සේවයක් සැපයීම සඳහා දළ වශයෙන් ගොවි පවුල් 350ක් පමණ ආවරණය වන පරිදි එක් ව්‍යාප්ති නිලධාරියෙකු යෙදවීම.<br>▪ ඉලක්කගත කණ්ඩායම්/පවුල් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ සහ ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ඔවුන් සුදුසු රැකියා වෙත යොමු කිරීම.<br>▪ කෘෂි ව්‍යාප්ති නිලධාරීන් සඳහා කාර්ය සාධනය මත පදනම්ව දිරි දීමනා ලබා දීම.<br>▪ කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන අරමුදල් වැඩි කිරීම<br>▪ කෘෂිකර්මාන්තය වඩාත් ගෞරවනීය හා ආකර්ශනීය වෘත්තියක් බවට පත් කිරීම සඳහා කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන් හට විධිමත් වෘත්තීය අධ්‍යාපන අවස්ථා ලබා දීම. |
| කෘෂි මෙහෙයුම් කළමනාකරණය සහ පාලනය | කෘෂිකාර්මික මෙහෙයුම් ඵලදායී ලෙස කළමනාකරණය සහ ඒවායේ පාලනය ප්‍රමිතිගත කිරීම | ▪ අදාළ සියලුම රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශ සහ විශ්වවිද්‍යාල නියෝජනය ද සහිතව ජාතික කෘෂිකාර්මික සංවර්ධන සභාවක් පිහිටුවීම.<br>▪ සියලුම කෘෂිකාර්මික ව්‍යාපෘති අදාළ රේඛීය අමාත්‍යාංශ (කෘෂිකර්ම, වැවිලි, ධීවර, ඉඩම්, වාරිමාර්ග ආදී) මගින් ඍජුවම නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම. |

## 3.3 ගුණාත්මක පශු නිෂ්පාදනයක් - ව්‍යවසායකත්ව ප්‍රවේශයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ගුණාත්මක සහ  සෞඛ්‍යාරක්ෂිත සත්ත්ව නිෂ්පාදන
- සාධාරණ හා මිල ස්ථායි වෙළෙඳපොළ
- ආයෝජන දිරිගැන්වීම
- පශු සම්පත් ව්‍යවසායකත්වය සඳහා තරුණ හා කාන්තා සහභාගීත්වය
- පශු සම්පත් සංවර්ධනය සඳහා රාජ්‍ය, මහජන සහ පෞද්ගලික හවුල්කාරිත්වය
- පශු කර්මාන්තයේ නිරත පාර්ශවකරුවන්ගේ උසස් ජීවන තත්ත්වය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| නවීන සහ තිරසර පශු සම්පත් නිෂ්පාදනය | හිතකර පරිසරයක් නිර්මාණය කිරීම තුළින් පශු නිෂ්පාදන ක්ෂේත්‍රයේ තිරසර බව නැංවීම | ▪ ගොවිපළ නවීකරණය කිරීම තුළින් නිෂ්පාදන ධාරිතාව ඉහළ දැමීම.<br>▪ ක්ෂේත්‍රයේ සැලසුම් සහ සංවර්ධනය සඳහා ගොවිපළ හිමියන් සෘජුවම සම්බන්ධ කර ගත හැකි වනසේ පශු සම්පත් සංවර්ධන සමිති පිහිටුවීම.<br>▪ සත්ත්ව පෝෂණය, අභිජනනය සහ සෞඛ්‍ය අංශ සඳහා විශේෂ මෙහෙයුම් ඒකක පිහිටුවීම.<br>▪ බහුලව පැතිර යන සත්ත්ව රෝග පාලනය සහ වැළැක්වීම සඳහා ජාතික වැඩ පිළිවෙලක් ඇති කිරීම.<br>▪ සතුන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණය වන රෝග පාලනය කිරීමට මෙන්ම සත්ත්ව නිෂ්පාදනවල සුරක්ෂිතතාව තහවුරු කිරීමට ඒ සඳහා වෙන් වූ මහජන සෞඛ්‍ය අංශයක් පිහිටුවීම.<br>▪ පශු සම්පත් අංශයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම.<br>▪ පශු සම්පත් පර්යේෂණ ආයතන සහ දිස්ත්‍රික් පශු වෛද්‍ය පර්යේෂණ ආයතන නවීකරණය කිරීම |
| කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම | දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි ගොවිපළවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම | ▪ ගොවිපල යාන්ත්‍රීකරණය කිරීම හරහා සුළු පරිමාණ නිෂ්පාදන ඒකක උපරිම ආර්ථික වාසි ලබන මධ්‍ය පරිමාණ වාණිජ ඒකක බවට පරිවර්තනය කිරීම.<br>▪ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා මහා පරිමාණ කිරි ගොවිපළ පද්ධති සංවර්ධනය කිරීම.<br>▪ අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කිරි නිෂ්පාදන ගොවිපළ 7,500ක් පිහිටුවීම.<br>▪ තරුණ ව්‍යවසාය සවි බල ගැන්වීම අරමුණු කර ගනිමින් කිරි නිෂ්පාදන ගොවිපළ 7,500ක් පිහිටුවීම.<br>▪ දැනට පවතින කෘත්‍රිම සිංචන අනුපාතය දෙගුණ කිරීම සහ විවිධ තාක්ෂණයන් හරහා කිරි නිෂ්පාදනයට අවශ්‍ය දෙනුන් සංඛ්‍යාව වැඩි කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාශ මූලිකත්වයෙන් කිරි ගොවිපළ පද්ධතීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම.<br>▪ ප්‍රධාන වසංගත රෝග තුරන් කිරීම සඳහා ප්‍රශස්ත එන්නත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ ලියාපදිංචි කිරි ගොවිපල සතුන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දීම. |
| කිරි නිෂ්පාදන අලෙවිකරණය පද්ධතිගත කිරීම | පද්ධතිගත අලෙවි ජාලය හරහා කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම | ▪ පැස්ටරීකරණය කළ සහ නැවුම් දියර කිරි බෙදාහැරීම සඳහා පුළුල් ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන ජාලයක් ඇති කිරීම.<br>▪ නිසි ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය මත පදනම්ව කිරි ගොවීන් සඳහා ගෙවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ ඉලක්කගත කිරි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් හරහා දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම. |
| අපනයන කේන්ද්‍රීය කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය | ගුණාත්මක බවින් ඉහළ කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | ▪ සාධාරණ මිලකට බිත්තර සහ කුකුළු මස් ලබා දීම සඳහා සත්ත්ව ආහාර ඇතුළු අනෙකුත් නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා බදු සහන ලබා දීම.<br>▪ බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදන අපනයන ක්‍රියාදාමය ශක්තිමත් කිරීම.<br>▪ අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් සුළු පරිමාණ කුකුළු ගොවිපල 5,000ක් ඇති කිරීම. |

## 3.4 තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව
- සහභාගීත්ව ප්‍රවේශය සහ තිරසර කළමනාකරණය
- අන්තර්ජාතික ගිවිසුම් සහ  සම්මතයන්ට අනුකූල ශක්තිමත් නීතිමය රාමුවක්
- ප්‍රමිතිකරණය හා දිරිගැන්වීම් මඟින් ආරක්ෂිත සහ තිරසර භාවිතයන්
- පරිසර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රීය ආරක්ෂාව
- මත්ස්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන සඳහා සාධාරණ වෙළෙඳපොළ ප්‍රවේශය
- ධීවර ප්‍රජාවගේ උසස් ජීවන තත්ත්වය හා සමාජ ආරක්ෂණය
- වෘත්තීය ධීවර ප්‍රජාවක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| තිරසර සංවර්ධනය සහ කළමනාකරණය | තිරසර හා පරිසර හිතකාමී අයුරින් මත්ස්‍ය හා ජලජ සම්පත් සංවර්ධනය කිරීම සහ කළමනාකරණය. | ▪ ධීවර ක්ෂේත්‍රයට අදාළ සියලු දත්ත සහ තොරතුරු රැස් කිරීම, ගබඩා කිරීම, විශ්ලේෂණය සහ බෙදා හැරීම සඳහා තත්‍යකාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.<br>▪ ධීවර ක්ෂේත්‍රයට අදාළ අවසර හා බලපත්‍ර ලබා ගැනීම සහ ලියාපදිංචි කිරීම් සඳහා ඵලදායී මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වාදීම.<br>▪ ධීවර හා ජලජීවී වගා කටයුතු කළමනාකරණය කිරීම සඳහා උපදේශන සභාවක් පිහිටුවීම.<br>▪ කර්මාන්තයට බාධා පමුණුවන නීති, රෙගුලාසි සහ ක්‍රියාවලීන්, ජාත්‍යන්තර සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූලව සංශෝධනය කිරීම.<br>▪ සාගර මත්ස්‍ය සම්පත සහ කරදිය හා මිරිදිය ජලජ පද්ධතිවල උපරිම ධාරිතාවන් තක්සේරු කිරීම සහ එවැනි තක්සේරු කිරීම් මත පදනම්ව කර්මාන්තය සංවර්ධනය කිරීම.<br>▪ මත්ස්‍ය අභිජනන ප්‍රදේශ හඳුනාගැනීම, මත්ස්‍ය ගහන ව්‍යාප්තිය වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ජලජ විශේෂවල අභිජනන ප්‍රදේශ හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.<br>▪ උසස්, පරිසර හිතකාමී සහ ආරක්ෂිත නිෂ්පාදනයන් සඳහා ධීවර ප්‍රජාව දිරිමත් කිරීම.<br>▪ පුනර්ජනනීය සහ දෙමුහුන් බලශක්ති භාවිතය සහ එවැනි නිෂ්පාදන අලෙවිය සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම.<br>▪ නීති විරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සමුද්‍රීය දූෂණය අවම කිරීම සහ හදිසි ප්‍රතිචාර දැක්වීම හා සමුද්‍රීය ආපදා අවම කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ ධීවර පර්යේෂණ සංවර්ධනය හා වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීම.<br>▪ කරදිය මත්ස්‍ය සම්පත් තොග ඇස්තමේන්තු කිරීම, පුරෝකථන ආකෘති සංවර්ධනය හා භාවිතය අඛණ්ඩව සිදු කිරීම සහ මිරිදිය හා කිවුල්දිය පද්ධතිවල ධාරිතාව නිවැරදිව ඇස්තමේන්තු කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| කරදිය ධීවර කර්මාන්තය | කරදිය ධීවර සම්පත් තිරසර සංවර්ධනය සහ කළමනාකරණය | ▪ විවිධ උෂ්ණත්වයන් හා ගැඹුරු මට්ටම් යටතේ මත්ස්‍ය සම්පත් නෙළා ගැනීම සඳහා ධීවර ජනතාවට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.<br>▪ මසුන් ඇල්ලීම සහ අභිජනනය පහසු කිරීම සඳහා කෘත්‍රිම වාසස්ථාන සහ මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) වැනි ක්‍රමවේද පුළුල් කිරීම.<br>▪ ධීවර වරායන් සහ මාදැල් වරායන් ඇතුළු සාම්ප්‍රදායික ධීවර බිම්වල හිමිකාරිත්වය සහ ප්‍රවේශය සහතික කිරීම සහ ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>▪ වර්තමානයේදී විශාල පසුබෑමකට මුහුණ දී ඇති සමුද්‍රීය ධීවර කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම.<br>▪ නිෂ්පාදන පිරිවැය අඩුකිරීම තුළින් බිඳ වැටී ඇති ධීවර කර්මාන්තය නඟා සිටුවීම සඳහා ධීවර ප්‍රජාවට ඉන්ධන සහනාධාරයක් ලබා දීම.<br>▪ යාත්‍රා නිරීක්ෂණ සහ හඳුනාගැනීමේ පද්ධති, ඉලෙක්ට්‍රොනික සටහන් පොත් සහ ඩ්‍රෝන සහ චන්ද්‍රිකා හරහා මත්ස්‍ය බිම් හඳුනාගැනීම, මව් යාත්‍රා සහ දෙමුහුන් යාත්‍රා සහ ස්මාර්ට් අලෙවිය වැනි නව, පරිසර හිතකාමී සහ ඵලදායී ධීවර තාක්ෂණයන් හඳුන්වාදීම.<br>▪ දේශීය ධීවර යාත්‍රා වෙනත් රටවල මුහුදු සීමාවට ඇතුළුවීම වැළැක්වීම සඳහා GPS පාදක අනතුරු ඇඟවීමේ පද්ධතියක් හඳුන්වාදීම.<br>▪ හදිසි අපදා තත්ත්වයන්හිදී ධීවර කාර්ය මණ්ඩල හා යාත්‍රා විදේශීය මුහුදු සීමාවන්හිදී මුහුණ දෙන ගැටලුවලදී කාර්යක්ෂම හා ක්‍රමානුකූල රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් සහතික කිරීම. |
| කරදිය සහ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදන | කරදිය සහ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | ▪ ඉහළ වෙළෙඳපොළ වටිනාකමක් සහිත මුහුදු කූඩැල්ලා, කකුළුවා, මෝදා, බෙල්ලා, ඉස්සා, පොකිරිස්සා සහ ජලජ පැළෑටි විශේෂ වගාකිරීම හා අභිජනනය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය සැපයීම.<br>▪ කරදිය හා කිවුල්දිය ජලජීවී වගාව සඳහා සුදුසු නව මත්ස්‍ය බිම් සහ විශේෂ හඳුනාගැනීමෙන් පරිසර හිතකාමී ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම.<br>▪ ඉස්සන් ගොවිපොළ ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීමෙන් විදේශීය වෙළෙඳපොළ ඉහළ වටිනාකම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ තාක්ෂණය ඇතුළු අවශ්‍ය පහසුකම් ලබා දීමෙන් වාර්ෂික ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීම.<br>▪ ඉස්සන් කර්මාන්තයේ රෝග වැළැක්වීම සහ පාලනය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.<br>▪ ඉහළ ඉල්ලුමක් සහ ඌන උපයෝගී මුහුදු පැළෑටි නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම සහ මෙම නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ හඳුන්වාදීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම.<br>▪ මුහුදු පැළෑටි හා ජලජ සම්පත් භාවිතා කර සිදුකරන ගෘහස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මගින් කාන්තා සහභාගීත්වය වැඩි කිරීම. |
| මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව | මිරිදිය ධීවර හා ජලජීවී වගාව තිරසර ලෙස සංවර්ධනය කිරීම | ▪ දියුණු කළමනාකරණ සැලැස්මකට අනුව මිරිදිය වැව් ආශ්‍රිත ජලජීවී වගාව, මත්ස්‍ය පැටවුන් ඇති කිරීම හා අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම නිසි ලෙස සම්බන්ධ කරමින් මිරිදිය ධීවර මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම.<br>▪ විවිධ ජලජීවී වගා ක්‍රම හරහා නිත්‍ය ජලාශ, කාලීන ජලාශ, වතු ජලාශ සහ පොකුණු වල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම සඳහා සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>▪ දේශීය හෝ නව විශේෂිත අභිජනන ක්‍රම හඳුන්වාදීම සහ අභිජනන මධ්‍යස්ථානවල මානව සම්පත්, තාක්ෂණය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>▪ නිසි ධාරිතාව පවත්වා ගැනීම සඳහා නිත්‍ය ජලාශවල, කාලීන ජලාශවල සහ වතු ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම.<br>▪ නිත්‍ය ජලාශ ආශ්‍රිතව පරිභෝජනය සඳහා කුඩු තුළ මසුන් වගා කිරීම.<br>▪ වාණිජ මිරිදිය මත්ස්‍ය වගාව සඳහා නවීන තාක්ෂණයෙන් යුත් මහා පරිමාණ ගොවිපොළවල් පිහිටුවීමට ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා මූල්‍ය සහාය ලබා දීම. |
| විසිතුරු මත්ස්‍ය හා විසිතුරු ජලජ පැළෑටි කර්මාන්තය | විසිතුරු මත්ස්‍ය හා විසිතුරු ජලජ පැළෑටි කර්මාන්තයේ සංවර්ධනය සහතික කිරීම | ▪ විසිතුරු මත්ස්‍ය සහ ජලජ පැළෑටි අපනයනයෙන් ලැබෙන ආදායම වැඩි කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ලාංකීය සන්නාමයක් ගොඩනැගීම.<br>▪ විසිතුරු මත්ස්‍ය වගාව දිරිමත් කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම.<br>▪ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අවම විකුණුම් මිල තීරණය කිරීමට විනිවිද යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ මත්ස්‍ය ලෙඩ රෝග සහ වසංගත හඳුනාගැනීම, වැළැක්වීම සහ ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම සඳහා ප්‍රාදේශීය පශු වෛද්‍ය මධ්‍යස්ථාන සහ රසායනාගාර වැනි ආයතන ඒකාබද්ධ කෙරෙන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>▪ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ පටක රෝපණය, හරිතාගාර, සිරස් වගාව සහ නිර්පාංශු වගාව වැනි විසිතුරු ජලජ පැළෑටි නිෂ්පාදන ක්‍රම සඳහා තාක්ෂණික සහ මූල්‍ය පහසුකම් ලබා දීම.<br>▪ වාර්ෂිකව ජාත්‍යන්තර මට්ටමේ විසිතුරු මත්ස්‍ය හා පැළෑටි ප්‍රදර්ශන සංවිධානය කිරීම.<br>▪ පරිසරය ආරක්ෂා වන පරිදි මිය ගිය ශාක, මුල් සහ පාෂාණ කොටස් වැනි අජීවී ද්‍රව්‍ය යොදා විසිතුරු ජලජ උපාංග නිෂ්පාදනය සඳහා සහ නවීන ශිල්පීය ක්‍රම භාවිතා කරමින් දේශීය විසිතුරු මත්ස්‍යයන් අභිජනනය සඳහා පහසුකම් සැපයීම.<br>▪ කිමිදුම් ශිල්පීය ක්‍රම භාවිතා කරමින් විසිතුරු මත්ස්‍යයන් එකතු කරන කාර්මිකයින් සඳහා කිමිදුම් උපකරණ භාවිතය, තිරසර අස්වනු නෙලීමේ ක්‍රම, පසු අස්වනු හානි අවම කිරීම සහ ප්‍රථමාධාර පිළිබඳව දැනුවත් කිරීම සහ විකල්ප ජීවනෝපායන් ලෙස මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීමට හා කිමිදුම් මාර්ගෝපදේශකයින් වීම වැනි අවස්ථා සඳහා ප්‍රවේශ වීමට පහසුකම් ස්ථාපිත කිරීම.<br>▪ ඉලක්කගත වෙළෙඳපොළ කොටසක් ලෙස විසිතුරු ජලජ සම්පත් හරහා තිරසර ආදායම් උත්පාදනය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරඟකාරිත්වය සහතික කිරීම හා තිරසරභාවය පවත්වා ගැනීම සඳහා පර්යේෂණ කිරීම. |
| ධීවර ප්‍රජාව සඳහා සමාජ සුබසාධනය | ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම සහතික කිරීම | ▪ ධීවර පවුල්වල සාමාජිකයින්, කර්මාන්තයේ භාවිතා කරන උපකරණ සහ යෙදවුම් ආවරණය වන පරිදි ධීවර ප්‍රජාව සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.<br>▪ කිමිදුම්කරුවන් මුහුණ දෙන අවපීඩන තත්ත්වයන් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත සක්‍රීය කිරීම.<br>▪ වෘත්තීය ධීවර හා නාවික ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් තරුණ ධීවර ප්‍රජාව සඳහා පුහුණුව සහ තාක්ෂණික මගපෙන්වීම ලබා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් බිහි කිරීම සඳහා සාගර විශ්ව විද්‍යාලය, පීඨ සහ කාර්මික විද්‍යාලවල පුළුල් දායකත්වයක් ලබා ගැනීම.<br>▪ ධීවර ප්‍රජාවගේ සෞඛ්‍ය සේවා, නිවාස, ඔවුන්ගේ දරුවන් සහ වැඩිහිටියන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ සංස්කෘතික උත්සව වැනි අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් පහසුකම් ලබා දීම.<br>▪ ධීවර ගම්මාන සහ ධීවර වරායන් වටා පිහිටි ප්‍රජා මූලික සංවිධාන ලෙස සමූපකාර සහ බැංකු ගොඩනැගීමට පහසුකම් සැලසීම.<br>▪ ධීවර කාර්මිකයින් සහ ජලජීවී වගාකරුවන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීමට මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා තාක්ෂණික උපදේශන සේවා, විදේශ සංචාර සහ පුහුණු වැඩසටහන් සැපයීම සඳහා විධිමත් ක්‍රියාවලියක් නිර්මාණය කිරීම.<br>▪ ධීවර කාන්තාවන් සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි පවුල් සාමාජිකයින් සඳහා ජීවනෝපාය සංවර්ධනය සහ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාවට නැංවීම. |
| යෙදවුම් සහ උපකරණ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | ධීවර කර්මාන්තයේ නව තාක්ෂණය භාවිතය සහ නවෝත්පාදන සහතික කිරීම | ▪ ජීවී හා අජීවී ආහාර, යාත්‍රා, දැල්, ජලජීවී වගාවන් සඳහා අවශ්‍ය කුඩු උපකරණ සහ යන්ත්‍රෝපකරණ ඇතුළුව ධීවර කර්මාන්තයේ භාවිතා වන යෙදවුම් නිෂ්පාදනය කිරීමට පහසුකම් සැලසීම.<br>▪ ප්‍රමාණවත් දේශීය නිෂ්පාදනයක් ඇති වන තෙක් ආනයනික යෙදවුම් සඳහා බදු සහන ලබා දීම. |
| පසු අස්වනු කළමනාකරණය සහ අගය එකතු කළ නිෂ්පාදන | පසු අස්වනු හානි අවම කිරීම සහතික කිරීම සහ අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම | ▪ පසු අස්වනු හානිය අවම වන ලෙස මසුන් ඇල්ලීම, හැසිරවීම, ගබඩා කිරීම සහ අලෙවිය පිළිබඳ දැනුවත් කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ තාක්ෂණික සහාය ලබා දීම.<br>▪ ඉවතලන මත්ස්‍ය කොටස් භාවිතා කරමින් මාළු කුඩු, මාළු ආහාර, දියර පොහොර සහ වෙනත් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.<br>▪ විධිමත් බෙදාහැරීමේ ක්‍රමවේදයක් මගින් ජනතාවට සාධාරණ මිලකට ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදන මිලදී ගැනීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ ධීවර යාත්‍රා අලුත්වැඩියා කිරීම, ප්‍රමිතියෙන් යුත් අයිස් නිෂ්පාදනය කිරීම, සංවෘත බහාලුම් භාවිතා කිරීම සහ අලෙවිය සඳහා මාර්ගගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හරහා පසු අස්වනු හානිය අවම කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| අපනයන විභවතාවය සහ විදේශ විනිමය ඉපයීම | අපනයන වෙළෙඳපොළ සහ නිෂ්පාදන විවිධාංගීකරණය සහ අපනයන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | ▪ ඉදිරියේදී විවෘත වන විදේශීය වෙළෙඳපොළ හඳුනාගනිමින් නිෂ්පාදන අපනයනය කිරීමට පියවර ගැනීම.<br>▪ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ තානාපති කාර්යාල ඇතුළු අදාළ ආයතන සමඟ ඒකාබද්ධව අපනයන දිරිගැන්වීම සහ වෙළෙඳපොළ ප්‍රවර්ධනය.<br>▪ ආනයනය සීමා කිරීමෙන් විදේශ විනිමය ඉතිරි කිරීම සහ උසස් තත්ත්වයේ දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.<br>▪ ඉහළ අපනයන විභවයක් සහිත නිෂ්පාදන අංශවල ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයින් දිරිමත් කිරීම.<br>▪ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීමේදී ඇතිවන බාධා ඉවත් කිරීම සඳහා කාර්යක්ෂම හා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම. |
| ධීවර වරායන් ආශ්‍රිත මූල්‍ය අදායම් හා ධීවර වරාය සංවර්ධනය | ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ▪ ධීවර වරායන් ආශ්‍රිතව යාත්‍රා රැඳවීමට සේවා පදනම් කරගත් කලාප වෙන් කිරීම.<br>▪ ධීවර වරායන් ආශ්‍රිතව ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීම සම්බන්ධ ගැටළු විසඳීම.<br>▪ ප්‍රමුඛතා සැලැස්මක් මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සියලුම ප්‍රධාන ධීවර වරායන් වැඩිදියුණු කිරීම.<br>▪ උතුරු සහ නැගෙනහිර පළාත් ආශ්‍රිතව බහුදින ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වරායන් පුළුල් කිරීම සහ පහසුකම් වැඩි දියුණු කිරීම.<br>▪ හරිත වරාය සංකල්පය මත පදනම්ව ධීවර වරායන් සංවර්ධනය සහ කළමනාකරණය.<br>▪ මසුන් බහුල ප්‍රදේශ හඳුනාගැනීමට භාවිතා කරන ක්‍රමවේදවල නිරවද්‍යතාවය වැඩි කිරීම, සූර්ය බලශක්තිය සහ LNG බලයෙන් ක්‍රියාත්මක වන යාත්‍රා භාවිතය, ගබඩා පහසුකම් සහිත විශාල යාත්‍රා සුලබ කිරීම හා යාත්‍රා සහ ධීවර උපකරණ නවීකරණය කිරීම.<br>▪ තාක්ෂණය මත පදනම් වූ ධීවර ක්‍රම, ධීවර උපකරණ සහ යාත්‍රා නිෂ්පාදනය ඒකාබද්ධ කිරීමෙන්, ධීවර අංශය උසස් කිරීම සඳහා නිසි සම්බන්ධීකරණ ප්‍රවේශයක් සකස් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| නීල ආර්ථිකය | සාගර සම්පත් තිරසර ලෙස භාවිතය සඳහා පියවර ගැනීම | ▪ නීල ආර්ථික ප්‍රවේශයක් හරහා ජීවී හා අජීවී සාගර සම්පත් තිරසර ලෙස භාවිතය සහ නව සමුද්‍රීය කර්මාන්ත ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම.<br>▪ නීල කාබන් මූලාශ්‍ර ක්ෂේත්‍රයට පිවිසීම සඳහා ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ ජලජ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

## 3.5 ඩිජිටල් රාජ්‍යකරණයක් - ජාත්‍යන්තර හවුල්කාරිත්වයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- නවෝත්පාදනය මත පදනම් වූ තිරසර වර්ධනයක්
- ඩිජිටල් රාජ්‍යකරණ පරිවර්තනය
- ශ්‍රී ලංකා වෙළඳ අනන්‍යතාවය නැවත සන්නාමකරණය කිරීම
- ඩිජිටල් ආර්ථිකයේ ප්‍රතිලාභ උපයෝගී කර ගැනීම
- උසස් තාක්ෂණයන්, හොඳම භාවිතයන් සහ නව වෙළඳපල වෙත ප්‍රවේශ වීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| රාජ්‍ය ඩිජිටල්කරණය | රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම තුළින් විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම පාලනයකට අනුගත වීම | ▪ ඉහළ වටිනාකමක් ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිෂ්පාදන සහ විසඳුම් සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස, ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම.<br>▪ පරිගණක සහ දේශීයව වශයෙන් නිපදවනලද මෘදුකාංග ඇතුළු තොරතුරු තාක්ෂණයට අදාළ උපකරණ සඳහා ශුන්‍ය වැට් බදු අනුපාතයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ විදේශ සේවාලාභීන් තොරතුරු තාක්ෂණ කර්මාන්තය සක්‍රියව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ දූත සේවය යොදා ගැනීම සහ එක් එක් දූත සේවාවන් සඳහා නිශ්චිත ඉලක්ක ලබා දීම<br>▪ තොරතුරු තාක්ෂණ අංශයේ දේශීය නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා නව ව්‍යාපාර ආරම්භ කිරීම, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අරමුදලක් පිහිටුවීම.<br>▪ පුරවැසියන්ට විනිවිද භාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහි කිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම.<br>▪ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සෘජු විදේශ ආයෝජන(FDIs), ආකර්ෂණය කර ගැනීම සඳහා, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, දත්ත රහස්‍යභාවය, කම්කරු නීති සහ බංකොලොත්බාවය ඇතුළු තොරතුරු හා සන්නිවේදන අංශයේ ප්‍රධාන ක්ෂේත්‍ර ඉලක්ක කරමින් නීතිමය පද්ධතියක් හඳුන්වා දීම.<br>▪ සදාචාරාත්මක AI භාවිතය, දත්ත රහස්‍ය භාවය සහ රාජ්‍ය අංශයේ AI තාක්ෂණයන් ඒකාබද්ධ කිරීමට හැකිවන පරිදි ඕනෑම භාෂාවකින් රාජ්‍ය සේවය ලබා ගැනීමට හැකිවන පරිදි නව ජාතික AI ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| ඩිජිටල් කර්මාන්ත | ඩිජිටල් කර්මාන්තය සහ ඩිජිටල් සේවා කර්මාන්තය දියුණු කිරීම | ▪ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වයේ තිරසර ආයෝජන මගින් ගෝලීය වශයෙන් පිළිගත් සමාගම් නිර්මාණය කරමින් තොරතුරු තාක්ෂණ (ICT) යුනිකෝන් සංවර්ධනය කිරීම.<br>▪ ශ්‍රී ලංකාවට උසස් තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් ගෙන ඒම සඳහා ගෝලීය සමාගම් සහ පර්යේෂණ ආයතන සමඟ හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ඩිජිටල් හැකියා | ඩිජිටල් දක්ෂතා සංචිතයක් පිහිටුවීම | ▪ 2030 වන විට ICT ශ්‍රම බලකාය 200,000 ඉහළ නැංවීම සඳහා පුහුණු සහ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ විදේශීය විශේෂඥ සහය ලබා ගනිමින් ඉංජිනේරුවන් සඳහා විශේෂිත පුහුණු ලබා දීම.<br>▪ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයෝජන සහ වෘත්තීය අවස්ථා සඳහා ශ්‍රී ලංකාව ආකර්ශනීය ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා එම සමාගම්වල සහයෝගීතා ව්‍යාපෘති සඳහා බදු සහන, ප්‍රදාන සහ වෙනත් දිරිගැන්වීම් ලබාදීම. |
| වෙනත් ආර්ථික අංශ ඩිජිටල්කරණය | තිරසර සංවර්ධනයට සහාය වන ශක්තිමත් ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීම | ▪ කලාපීය සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා බස්නාහිර, උතුරු, නැගෙනහිර සහ දකුණු පළාත්වල පර්යේෂණ හා සංවර්ධන(R&D) මධ්‍යස්ථාන සහ තොරතුරු තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම.<br>▪ බස්නාහිර, උතුරු, නැගෙනහිර සහ දකුණු පළාත්වල පිහිටි ප්‍රධාන විශ්වවිද්‍යාල හතරක නවීන තාක්ෂණයෙන් සහ දක්ෂ කාර්ය මණ්ඩලයකින් සමන්විත තොරතුරු තාක්ෂණ පර්යේෂණ හා සංවර්ධන(R&D) මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ කර්මාන්ත වර්ධනයට සහ තරඟකාරීත්වයට සහාය වීම සඳහා, අධිවේගී අන්තර්ජාලය, දත්ත මධ්‍යස්ථාන, විශ්වාසනීය සහ දැරිය හැකි බලශක්ති සැපයුම, පොදු ප්‍රවාහනය සහ ස්මාර්ට් නගර වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම.<br>▪ උසස් ඩිජිටල් තාක්ෂණය සහ ස්වයංක්‍රීයකරණය සමග කර්මාන්ත 4.0/ 5.0 කර්මාන්ත දක්වා පරිවර්තනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය විධිමත් කිරීම. |

## 3.6 පර්යේෂණ සහ සංවර්ධන ප්‍රවේශයක් - විදුහුරු සමාජයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- නිෂ්පාදන ආර්ථිකයක් සඳහා පර්යේෂණ සහ සංවර්ධනවල ඍජු දායකත්වය.
- පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිලාභ මහජනතාව අතර සාධාරණ ලෙස බෙදා හැරීම.
- පර්යේෂණ ස්වාධීනත්වය සහතික කිරීම, නිසි අධීක්ෂණය සහ නියාමනය ක්‍රියාත්මක කිරීම.
- විනිවිදභාවය, කාර්යක්ෂමතාව, සමානාත්මතාවය, විවිධත්වය සහ ඇතුළත් කිරීම.
- අරමුදල් සඳහා පාරදෘශ්‍ය සහ අපක්ෂපාතීත්වය සහ සාධාරණ අවස්ථා.
- ජාතික සහ ජාත්‍යන්තරව පිළිගත් ආචාර ධර්ම, පිළිවෙත් සහ අදාළ ගිවිසුම්වලට අනුකූල පර්යේෂණ.
- නවෝත්පාදක සහ සේවා ආරක්ෂා කිරීම සහ නව නිෂ්පාදකයින් නිසි ඇගයීම (පේටන්ට් බලපත්‍ර හරහා).
- පර්යේෂණ සඳහා රාජ්‍ය, පුද්ගලික සහ මහජන හවුල්කාරීත්වය.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| කෘෂිකර්ම, ධීවර, පශු සම්පත්, ආහාර සුරක්ෂිතතා සහ ආරක්ෂක අංශ | කෘෂිකාර්මික ඵලදායිතාව සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික වර්ධනය සහතික කිරීම | ▪ සම්පත් හඳුනා ගැනීම සහ ප්‍රශස්ත භාවිතය, කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය සහ තිරසර අලෙවිකරණ උපාය මාර්ගික විසඳුම් සෙවීම සඳහා සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.<br>▪ දේශගුණික විපර්යාස සඳහා බෝග ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, ප්‍රධාන බෝගවල තිරසර බව සහ ආර්ථික විභවයන් වැඩිදියුණු කිරීම, වැඩි ආර්ථික ප්‍රතිලාභ සඳහා ආහාර සංරක්ෂණය ප්‍රශස්ත කිරීම සහ අගය එකතු කළ නිෂ්පාදන නිර්මාණය කිරීම.<br>▪ විසිතුරු ජලජ සම්පත්, විසිතුරු උද්‍යාන බෝග සහ කාබනික කෘෂිකර්මාන්තය සුවිශේෂී වෙළඳපොලක් ලෙස ජාත්‍යන්තර වෙළඳපල තුළ තිරසර ආදායමක් උත්පාදනය කිරීම සහ තරඟකාරිත්වය සහතික කිරීම සහ තිරසර බව සහතික කිරීම සඳහා විසඳුම් සෙවීම පිළිබඳව පර්යේෂණ කිරීම.<br>▪ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා දේශීය හා අපනයන බෝග සහ පශු සම්පත් අංශය පිළිබඳ නව පර්යේෂණ පැවැත්වීම.<br>▪ බෝග විවිධාංගීකරණය, වැඩිදියුණු කළ කළමනාකරණ පිළිවෙත්, ඒකාබද්ධ දේශීය-නවීන තාක්ෂණය (ජාන ඉංජිනේරු සහ ජෛව සුරක්ෂිතතා සහතිකය), කාර්යක්ෂම කෘෂිකාර්මික යෙදවුම් (ජලය, කාබනික සහ අකාබනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍ය වැනි) සහ සුදුසු ස්ථානවල/ප්‍රදේශවල හරිතාගාර සහ සිරස් වගාව පිළිබඳ පර්යේෂණ.<br>▪ ඉහළ අස්වැන්නක් ලබා දෙන සත්ත්ව අභිජනනය සංවර්ධනය කිරීම, උසස් තත්ත්වයේ ආහාර නිෂ්පාදනය කිරීම, අඩු වියදම් විකල්ප නිවාස සහ ඒවායේ කළමනාකරණය විමර්ශනය කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් ගොවිපළ (කිරි, කුකුල් මස් සහ ඌරු මස්) සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීම/භාවිත කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම.<br>▪ ඉහළ අස්වැන්නක් ලබා දෙන සහ ආතතියට ඔරොත්තු දෙන බෝග සහ ආහාර වර්ග (දේශගුණික-ස්මාර්ට් කෘෂිකර්මය) හඳුනා ගැනීම පිළිබඳ පර්යේෂණ කිරීම, දේශීය කෘෂිකාර්මික කළමනාකරණය සංවර්ධනය කිරීම<br>▪ පහසුවෙන් ලබා ගත හැකි සහ අඩු මිලට බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා සුදුසු බෝග සහ ආහාර වර්ග තෝරා ඒකාබද්ධ කිරීම මගින් නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි කිරීම.<br>▪ විකුණුම්, නවීන වෙළඳපොලවල් සහ ඒවායේ අනාවැකි, සමාජ සුභසාධනය සහ ව්‍යාප්ති සේවා සහ අවශ්‍යතා සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ මත්ස්‍ය බහුල ප්‍රදේශ හඳුනා ගැනීම, සූර්ය බලය සහ LNG බලයෙන් ක්‍රියා කරන යාත්‍රා භාවිතා කිරීම, විශාල යාත්‍රා සඳහා ගබඩා පහසුකම් සැපයීම සහ යාත්‍රා සහ ධීවර උපකරණ නවීකරණය කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවල නිරවද්‍යතාවය වැඩි කිරීම.<br>▪ සාගර මත්ස්‍ය සම්පත් තොග ඇස්තමේන්තු කිරීම, පුරෝකථන ආකෘති සංවර්ධනය සහ භාවිතය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ මිරිදිය සහ කිවුල් ජල පද්ධතිවල ගෙන යා හැකි ධාරිතාව නිවැරදිව තක්සේරු කිරීම සඳහා පර්යේෂණ කිරීම. |
| සෞඛ්‍යය, අධ්‍යාපනය සහ විද්‍යාව | විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධනය තුළින් ජාතික සෞඛ්‍ය, අධ්‍යාපනය සහ තාක්ෂණික නවෝත්පාදනයන් ඉදිරියට ගෙන යාම | ▪ ඩෙංගු, වකුගඩු රෝග, බෝවන රෝග සහ ශ්‍රී ලංකාවට අදාළ වෙනත් විශේෂ සෞඛ්‍ය ගැටලු සඳහා විසඳීම සෙවීම සඳහා ජාන විද්‍යාව, ජෛව රසායනය, නැනෝ තාක්‍ෂණය, පරිවෘත්තීය, ප්‍රෝටියෝමික්ස්, සහ කෘතිම බුද්ධිය වැනි නවීන විද්‍යාත්මක ක්‍රම යොදා ගැනීම.<br>▪ පර්යේෂණ හා සංවර්ධනය තුළින් රටට අවශ්‍ය ඖෂධ දේශීයව නිෂ්පාදනය කිරීම.<br>▪ දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා දේශීයව ලබා ගත හැකි ආහාර අතිරේක නිපදවීම.<br>▪ පිළිකා, දියවැඩියාව, හෘදයාබාධ වැනි රෝග කල්තියා හඳුනා ගැනීමට නවීන තාක්ෂණික පර්යේෂණ සිදු කිරීම.<br>▪ දීප ව්‍යාප්ත පර්යේෂණ සහ සමීක්ෂණ මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක තත්ත්වය හා සම්පත් විෂමතා හඳුනාගෙන, එම දත්ත පදනම් කරගත් විසඳුම් ලබා දීම.<br>▪ පාසල් අධ්‍යාපනය තුළ විමර්ශන පදනම් කරගත් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම.<br>▪ ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා නව්‍ය, කෘත්‍රිම බුද්ධියෙන් සමන්විත යෙදුම් සහ අතථ්‍ය පුහුණු වැඩසටහන් වැඩි දියුණුකිරීම.<br>▪ රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වයෙන් උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂණ හා සංවර්ධන ඒකක පුළුල් කිරීම.<br>▪ දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන නිසි පරිදි සිදු කිරීම සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම.<br>▪ ඖෂධීය ශාක වගාව දිරිමත් කිරීම, පටක රෝපණ සහ ජාන ඉංජිනේරු මධ්‍යස්ථාන සහ රසායනාගාර ස්ථාපිත කිරීම මගින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවයන් සපුරාලන උසස් තත්ත්වයේ දේශීය ඖෂධ, පෝෂක ඖෂධ, ආහාර අතිරේක, රූපලාවන්‍ය සහ සුවඳ විලවුන් වර්ග වැනි අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ නැනෝ තාක්‍ෂණය පදනම් කරගත් පර්යේෂණ මගින් සූර්යකෝෂ තාක්‍ෂණය, ඉලෙක්ට්‍රොනික උපකරණ, ඖෂධ, බලශක්ති කාර්යක්ෂම නව නිපැයුම්, පාරිසරික ප්‍රතිකර්ම සංරචක සහ අනාගත මෝටර් රථ සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සඳහා අමතර කොටස් නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණ කිරීම. |
| තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, ඉංජිනේරු, බලශක්ති, නාවික, ප්‍රවාහන සහ වෙනත් තාක්ෂණය හා සම්බන්ධ අංශ | තිරසර සේවා සැපයීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය උත්තේජනය කිරීම | ▪ ශ්‍රී ලංකාවේ විවිධ ජනවාර්ගික කණ්ඩායම් අතර භාෂා බාධක අවම කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ පොදු ස්ථානවල කෘත්‍රිම බුද්ධිය (AI) මගින් බල ගැන්වෙන බහුභාෂා සන්නිවේදන පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳ පර්යේෂණ කිරීම.<br>▪ ස්වභාවික විපත්වලට (උදාහරණයක් ලෙස ගංවතුර, ලැව්ගිනි සහ නායයෑම්) එරෙහිව අනතුරු ඇඟවීම සඳහා ක්‍රියාශීලී සහ තත්‍ය කාලීන අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනය කිරීම.<br>▪ ප්‍රමාදයන් අවම කිරීම සහ මගී ආරක්ෂාව සහ සුවපහසුව වැඩිදියුණු කිරීම සඳහා IoT සහ GPS තාක්ෂණය භාවිතයෙන් කාර්යක්ෂම පොදු ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් (බස් සහ දුම්රිය) ස්ථාපිත කිරීම පිළිබඳව පර්යේෂණ කිරීම.<br>▪ වායු දූෂණය අවම කිරීම සහ වාහන විමෝචනය සහ කාර්මික විමෝචනය පාලනය කිරීම සඳහා ප්‍රධාන නගරවල වායු දූෂණ නිරීක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.<br>▪ සම්පත් භාවිතය උපරිම කිරීමට සහ නාස්තිය අවම කිරීමට නේවාසික නිවාස, ගොඩනැගිලි සහ පොදු ස්ථානවල Smart Meter පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. උදාහරණ: විදුලි මීටර, වාහන නැවැත්වීමේ මීටර සහ ජල මීටර ස්ථාපිත කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය<br>▪ නිවැරදිව කාලගුණික අනාවැකි ප්‍රකාශ කිරීමට සහ බලශක්ති අවශ්‍යතාවන් ගණනය කිරීමට හැකි යාන්ත්‍ර සහ චන්ද්‍රිකා දත්ත භාවිතා කිරීම තුළින් ජල විදුලිය, සුළං සහ සූර්ය බලශක්ති සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම.<br>▪ විද්‍යුත් අපද්‍රව්‍ය මගින් පරිසර දූෂණය අවම කිරීම සහ ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ බඳුන් සහ පහසුකම් යෙදවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ දේශීයව නිෂ්පාදනය කරන ලද වහලය මත සූර්ය පද්ධති, උපකරණ සහ සම්බන්ධක උපාංග ජාතික විදුලිබල පද්ධතියට ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම.<br>▪ අපේ රටට අවශ්‍ය නවීන අඩු වියදම් යන්ත්‍රෝපකරණ සහ මෙවලම් තැනීම සඳහා දේශීය නිෂ්පාදකයින්ට පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සහ අවශ්‍ය කුසලතා ලබා දීම.<br>▪ ඉදිකිරීම් පිරිවැය සහ සම්පත් නාස්තිය අවම කිරීම සහ තිරසර ඉංජිනේරු භාවිතයන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් පස, වැලි, ගල්, ගඩොල්, තාර සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා දේශීය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම/යාවත්කාලීන කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම.<br>▪ ඉදිකිරීම් කර්මාන්තය සඳහා මුහුදු වැලි කාර්යක්ෂමව පිරිසිදු කිරීම සහ භාවිතය පිළිබඳ පර්යේෂණ කටයුතු කඩිනම් කිරීම.<br>▪ පුනර්ජනනීය බලශක්තිය (ජල විදුලිය, සූර්ය සහ සුළං) පිළිබඳ පර්යේෂණ පුළුල් කිරීම සහ පොසිල ඉන්ධන පරිභෝජනය මත යැපීම අවම කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක කරා ළඟාවීම සඳහා අක්වෙරල සුළං බල ව්‍යාපෘතියට ප්‍රමුඛත්වය දීම.<br>▪ දේශීය හා ජාතික අවශ්‍යතා සඳහා තාක්ෂණික විසඳුම් ගොඩනැගීම සඳහා දේශීය නවෝත්පාදකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවල “තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථාන” පිහිටුවීම.<br>▪ පාරිභෝගික ද්‍රව්‍ය, කාර්යාල සැපයුම්, රෝහල් සැපයුම්, සහ උපකරණ (ඇඳන්, පුටු, සිරින්ජ, ආදිය) තැනීමට දේශීය කුසලතා, නිෂ්පාදකයින් සහ නවෝත්පාදකයින් උත්තේජනය කිරීම.<br>▪ තේ, රබර්, පොල් සහ වී වැනි කෘෂිකාර්මික නිෂ්පාදනවල ඵලදායිතාව ඉහළ නැංවීමට සහ කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා දේශීයව අනුගමනය කරන ලද තාක්ෂණික විසඳුම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ පර්යේෂණ කිරීම.<br>▪ වැඩිහිටි ප්‍රජාව සහ ආබාධ සහිත පුද්ගලයින් ජාතික ශ්‍රම බලකායට ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පද්ධති, යාන්ත්‍රණ සහ මෙවලම් ස්ථාපිත කිරීම.<br>▪ දේශීය ව්‍යවසායකයින් සහ නවෝත්පාදකයින් විශ්ලේෂණය කිරීමට සහ ඔවුන් වෙත ප්‍රවේශ වීමට සහ දේශීයව ව්‍යාපාර ආරම්භ කිරීමට ඔවුන් දිරිමත් කිරීමට තොරතුරු තාක්ෂණය (IT), |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | Big Data, Machine Learning, AI, Communication & Networking, සහ සමාජ මාධ්‍ය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති තාක්ෂණික කාර්ය සාධක බලකායක් පිහිටුවීම.<br>▪ හදිසි ආපදා ප්‍රතිචාර ඇතුළු සමුද්‍රීය ප්‍රදේශයේ ධාරිතා හිඩැස් හඳුනා ගැනීමට පර්යේෂණ පැවැත්වීම සහ අනාගත දැක්මට ප්‍රමුඛත්වය දීම.<br>▪ අගය එකතු කළ අවස්ථා හඳුනා ගැනීමට පර්යේෂණ කිරීම සහ සංචාරක කර්මාන්තයේ තිරසර වර්ධනය සඳහා දේශීය සම්පත් උපයෝගී කර ගැනීම. |
| ස්වභාවික සම්පත් | ඵලදායී තාක්‍ෂණික දියුණුව තුළින් රාජ්‍ය සහ පෞද්ගලික අංශවල තිරසර කළමනාකරණය නගා සිටුවීම | ▪ පර්යේෂණ සහ සංවර්ධනය පදනම් කරගත් නියමු ව්‍යාපෘති මගින් හඳුනාගෙන ඇති මානව-සත්ව ගැටුම් අවම කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රම ක්‍රියාත්මක කිරීම.<br>▪ ආරක්ෂාව අවශ්‍ය ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව 'උණුසුම් ස්ථාන'('hot spots') සංලක්ෂිත කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය ශක්තිමත් කිරීම. ජල පෝෂක සහ වෘක්ෂලතා සිතියම්ගත කිරීම සහ ඉඩම් පරිහරණ තර්ජන මත පදනම්ව වාසස්ථාන වර්ගීකරණය මෙයට ඇතුළත් වේ.<br>▪ කෘෂිකාර්මික, සමුද්‍රීය සහ මිරිදිය සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ පසු අස්වනු හානි අවම කිරීමට සහ නිෂ්පාදන විවිධාංගීකරණය වැඩි කිරීමට අවශ්‍ය තාක්ෂණයන් හඳුන්වා දීම.<br>▪ සමුද්‍ර හා ජලජ සම්පත් යොදා ගනිමින් ඖෂධ, රූපලාවන්‍ය ද්‍රව්‍ය සහ පෝෂණ අතිරේක වැනි අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කිරීම.<br>▪ දුර්ලභ ඛනිජ (උදා: බේරුවල මොනසයිට්), ඉල්මනයිට් භාවිතයෙන් ටයිටේනියම් ඩයොක්සයිඩ් සංවර්ධනය, සේරුවිල යපස් නිධිය භාවිතයෙන් තඹ සහ රත්‍රන් නිෂ්පාදනය වැනි ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්වල විභවයන් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ ගවේෂණය කිරීම.<br>▪ කඩොලාන සහ වෙරළබඩ පාරිසරික පද්ධති සුරැකීමට සහ වෙරළ ඛාදනය අඩුකිරීම සඳහා නවීන ඉංජිනේරු තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම |
| මානව සංවර්ධනය, කලාව, ඉතිහාසය, සංස්කෘතිය සහ දේශීය උරුමයන් | අධ්‍යාපනය, තාක්ෂණය සහ සංස්කෘතික සංරක්ෂණය දියුණු කිරීම | ▪ පර්යේෂණ සහ සංවර්ධන දත්ත මත පදනම්ව නිර්මාණය කර ඇති නායකත්වය, සහයෝගීතාවය සහ සන්නිවේදන කුසලතා සංවර්ධන සැලසුම් ඇතුළු උසස් අධ්‍යාපන උපාධි වැඩසටහන් යාවත්කාලීන කිරීම.<br>▪ පර්යේෂණ සහ සංවර්ධනය පදනම් කරගත් නවෝත්පාදන සහ නව දැනුම මෙන්ම සමාජයට ප්‍රයෝජනවත් වන කලාත්මක හා දාර්ශනික දෘෂ්ටිවාද ප්‍රවර්ධනයන් බෙදා ගැනීමට ප්‍රජා අධ්‍යාපනික වැඩසටහන් ආරම්භ කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ගෘහආශ්‍රිතව රොබෝ වැඩසටහන් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන පැවැත්වීම හෝ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට සහ වැඩිහිටි ප්‍රජාවට උපකාර කිරීම සඳහා දැනටමත් පවතින මානවරූපී රොබෝ වේදිකා අභිරුචිකරණය කිරීම.<br>▪ නවීන ඉලෙක්ට්‍රොනික ආධාරක උපාංග, ඖෂධ මතක් කිරීමේ පද්ධති, කාර්යක්ෂම පෙති බෙදාහරින්නන් සහ ටෙලිහෙල්ත් පද්ධති සංවර්ධනය කිරීමෙන් විශ්‍රාමික හෝ වැඩිහිටි පරම්පරාවට සහාය වීම සහ දෘශ්‍ය සහ සන්නිවේදන ආධාරක මෙන්ම මතක ආධාරක ආදිය සංවර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ස්වාධීනත්වය සහ සුවපහසුව වැඩි දියුණු කිරීම.<br>▪ ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් විවිධ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන සංගීත භාණ්ඩ සහ නර්තන ඇඳුම් නිෂ්පාදනය සඳහා පර්යේෂණ සහ සංවර්ධනය.<br>▪ පර්යේෂණ සහ සංවර්ධන පාදක නව කලාත්මක නිර්මාණ නිෂ්පාදනය කිරීම සඳහා සංගීතය, ගායනය, නැටුම්, රංග ශාලාව, ඔපෙරා සහ සිනමාව වැනි ප්‍රාසාංගික කලාවන් වෙත නවීන තාක්ෂණික දියුණුව ඒකාබද්ධ කිරීම.<br>▪ කාර්යක්ෂම ලේඛනාගාර පද්ධතියක් සහ පොදු වාර්තා කළමනාකරණයක් ස්ථාපිත කිරීම සඳහා බ්ලොක් චේන්, ක්ලවුඩ් සහ AI වැනි නවීන තාක්ෂණයන් භාවිතා කරමින් ජාතික ලේඛනාගාරයේ ධාරිතාව සහ ප්‍රවේශ්‍යතාව වැඩි කිරීම.<br>▪ පෞරාණික උරුමයන්, විශ්වාසයන්, චාරිත්‍ර වාරිත්‍ර, සංස්කෘතීන් සහ ජීවන රටා විස්තර කරන පුස්කොළ පොත් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කිරීම සහ නවීන අවශ්‍යතා සඳහා ප්‍රයෝජනවත් විය හැකි පැරණි තාක්ෂණික දියුණුව සහ භාවිතයන් හඳුනා ගැනීම සඳහා ජාතික මට්ටමේ පර්යේෂණ ආරම්භ කිරීම.<br>▪ සම්මත විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළු ජන මාධ්‍ය සන්නිවේදන ප්‍රභවයන් සඳහා සුදුසු අන්තර්ගත විශ්ලේෂණය, සමීක්ෂණ, ඉලක්කගත කණ්ඩායම් අත්හදා බැලීම් සහ සහභාගිවන්නන්ගේ නිරීක්ෂණ පැවැත්වීම සහ ඒවායේ සන්නිවේදන ප්‍රමිතීන් සහ සමස්ත කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම. |

## 3.7 නව්‍ය සංචාරක කර්මාන්තයක් - ආකර්ශනීය ගමනාන්තයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- දූරදර්ශී නායකත්වය, උපාය මාර්ගික ප්‍රවේශය සහ සාකල්‍ය ආර්ථික සංවර්ධනය
- ස්වභාවික හා සංස්කෘතික සම්පත් තිරසර භාවිතය
- සංචාරක කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය
- නව්‍ය සංචාරක නිෂ්පාදන සංවර්ධනය සහ ප්‍රමිතිකරණය
- උපාය මාර්ගික ගමනාන්ත අලෙවිකරණය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| දූරදර්ශී නායකත්වය, උපායමාර්ගික කළමනාකරණය සහ සාකල්‍ය ආර්ථික සංවර්ධනය. | සංචාරක ව්‍යාපාරයේ ශක්තිමත් පාලනයක් සහ උපාය මාර්ගික දිශානතියක් සහතික කිරීම. | ▪ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ කළමනාකරණය සඳහා ජාතික සංචාරක සභාව (NTC) පිහිටුවීම සහ කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති සැකසීම සඳහා සංචාරක ප්‍රතිපත්ති සම්පාදන කවුන්සිලය (TPFC) පිහිටුවීම.<br>▪ සංචාරක සංවර්ධන හා ප්‍රවර්ධනය සඳහා කේන්ද්‍රීය ආයතනය ලෙස ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය පිහිටුවීම.<br>▪ සංචාරක ක්ෂේත්‍රයේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව සංචාරක පනතක් ක්‍රියාත්මක කිරීම<br>▪ පර්යේෂණ හරහා නව ගමනාන්ත සහ නිෂ්පාදන හඳුනා ගැනීම.<br>▪ සංචාරක කර්මාන්තයේ අපරාධ සහ නීතිවිරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීම.<br>▪ ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් සමඟ කාර්යක්ෂම හා සෘජු ගුවන් සම්බන්ධතා ඇති කර ගැනීම සහ ගෘහස්ථ ගුවන් සේවා හඳුන්වා දීම .<br>▪ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීම් සහ පහසුකම් සැපයීම.<br>▪ සංචාරක සේවාවන්හි සියලුම අංශ සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>▪ අවිධිමත් අංශයේ සංචාරක ක්‍රියාකරුවන් විධිමත් අංශයට පරිවර්තනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම.<br>▪ දේශීය සංචාරක ව්‍යාපාරයේ දියුණුව සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ මෙම කාර්යය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීම.<br>▪ රාජ්‍ය නොවන සංවිධාන, පරිත්‍යාගශීලී සංවිධාන සහ ආයතන සමඟ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම සහ සංචාරක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ ප්‍රධාන ප්‍රවේශයක් ලෙස තාක්ෂණික, මූල්‍ය ආධාර සහ දැනුම ලබා ගැනීම.<br>▪ සංචාරක කර්මාන්තයේ ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන් දිරිමත් කිරීම සහ ඇගයීම සඳහා වාර්ෂික ජාතික සංචාරක සම්මාන උළෙලක් සංවිධානය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සම්පත් තිරසර භාවිතය | ස්වභාවික හා සංස්කෘතික සම්පත් තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම. | ▪ සංචාරක ව්‍යාපාරය සඳහා සම්පත් උපයෝජන සැලසුම් සකස් කිරීම<br>▪ සංචාරක අංශයේ ඉඩම් බැංකුවක් හරහා ඩිජිටල් ඉඩම් පරිහරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම<br>▪ විද්‍යාත්මක ක්‍රම භාවිතා කරමින් රඳවා තබා ගැනීමේ ධාරිතා පර්යේෂණ මත පදනම්ව සංචාරක ආකර්ෂණ ස්ථාන ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම.<br>▪ ක්‍රියාකාරකම් පදනම් කරගත් විකල්ප සංචාරක ගමනාන්ත සිතියම් සංවර්ධනය කිරීම සහ සාගර පරිසරයන්, භෞමික හා ජලජ ජෛව විවිධත්වය සහ සම්පත්වල සෞන්දර්යාත්මක අගයන් උපයෝගී කර ගනිමින් තිරසර පරිසර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම. |
| මානව සම්පත් සංවර්ධනය | සංචාරක හා සත්කාරක අංශවල මානව ප්‍රාග්ධනය සහ පර්යේෂණ වැඩිදියුණු කිරීම | ▪ සංචාරක සහ සත්කාරක අංශ සඳහා ජාතික මානව සම්පත් සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීම.<br>▪ සංචාරක කර්මාන්තයේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම පුහුණු සහ අධ්‍යාපන ආයතන සඳහා සංචාරක පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කිරීම.<br>▪ සංචාරක කර්මාන්තයට අදාළ උපාධි පිරිනමන විශ්වවිද්‍යාලවලට පහසුකම් සැලසීම.<br>▪ උපාධිධාරීන්ට සංචාරක කර්මාන්තය තුල අවස්ථා ලබාදීම සඳහා ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබාදීම<br>▪ ගෝලීය ප්‍රවණතාවලට ගැලපෙන පරිදි සංචාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්වල විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම.<br>▪ සංචාරක සේවා සපයන්නන් සහ සංචාරක කර්මාන්තයේ ආශ්‍රිත සේවකයින් ඇතුළු පුද්ගලික, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශවල පුද්ගලයන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා විශේෂ සමාජ ආරක්ෂණ වැඩසටහනක් ස්ථාපිත කිරීම.<br>▪ සංචාරක ක්ෂේත්‍රයේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සඳහා පුහුණුව ලබා දීම.<br>▪ රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවය ලෙස සංචාරක පර්යේෂණ ආයතනයක් පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| නව සංචාරක නිෂ්පාදන සංවර්ධනය සහ ප්‍රමිතිකරණය | සංචාරක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම | ▪ ප්‍රධාන ගමනාන්තවල තීරණාත්මක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>▪ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා නවා සංචාරක නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා විශේෂ අංශයක් /කණ්ඩායමක් පිහිටුවීම.<br>▪ අඩු සංචාරක සමය තුළ ඇති පරතරය පියවා ගැනීම සඳහා තෝරාගත් වෙළෙඳපොළ සඳහා විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.<br>▪ MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන) සහ ක්‍රීඩා සංචාරක ප්‍රවර්ධනය<br>▪ කෲස් නැව් සංචාරක (cruise tourism) ව්‍යාපාරය ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ සැපයීමට පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වීම.<br>▪ වරාය යටිතල පහසුකම් සංවර්ධනය සහ අනෙකුත් සේවාවන් සංචාරක ක්ෂේත්‍රය සමඟ ඒකාබද්ධ කිරීම.<br>▪ වැඩිහිටි සහ ආබාධිත සංචාරකයින් වෙත සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය කිරීම. |
| උපාය මාර්ගික ගමනාන්ත අලෙවිකරණය | ඉලක්කගත අලෙවිකරණය සහ ඩිජිටල් නවෝත්පාදනය තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක සන්නාමය පුනර්ජීවනය කිරීම | ▪ සංචාරක අරමුණු සමග පෙලගැසීම සඳහා වත්මන් ගමනාන්ත අලෙවිකරණ උත්සාහයන් සංශෝධනය කිරීම.<br>▪ සියලුම අදාළ පාර්ශවකරුවන් සමඟ දිගුකාලීන ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම.<br>▪ දිවයිනට ඇතුළු වන ස්ථානවල සහ විදේශයන්හි ප්‍රධාන සංචාරක වෙළඳපොලවල ප්‍රදර්ශනය සඳහා ආකර්ෂණීය ප්‍රවර්ධන ද්‍රව්‍ය නිර්මාණය කිරීම.<br>▪ ගමනාන්තය පිළිබඳ වැදගත් සංචාරක තොරතුරු සැපයීම සඳහා ඩිජිටල් ප්‍රවේශයන් අනුගමනය කිරීම.<br>▪ ශ්‍රී ලංකාව අව්‍යාජ, සංචාරක හිතකාමී හරිත ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.<br>▪ ගුවන් තොටුපල හරහා ගමන් කරන නිදහස් ස්වාධීන සංචාරකයින් (FITs) සහ සංක්‍රමණ (Transit) මගීන් ආකර්ෂණය කර ගැනීම සඳහා අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ඩිජිටල් නාමිකයන් ඉලක්ක කර ගනිමින් ප්‍රවර්ධන ව්‍යාපාරයක් සහ සංචාරකයින්ට සහ සංචාරක කර්මාන්තයට විශේෂ Wi-Fi පැකේජ හඳුන්වා දීම.<br>▪ විද්‍යාත්මක පර්යේෂණ මත පදනම්ව නැගී එන සහ නවීන වෙළඳපල කෙරෙහි අවධානය යොමු කරමින් විශේෂ අලෙවිකරණ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ විදේශ දූත මණ්ඩල සහ තානාපති කාර්යාල ශ්‍රී ලංකාවේ ගමනාන්ත අලෙවිකරණ වැඩසටහන සඳහා ඵලදායීව සහ කාර්යක්ෂමව භාවිතා කිරීම. |

## 3.8 ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක් - ජීවධරණී ප්‍රවේශයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ජාතික ප්‍රතිපත්ති රාමුවක් මගින් කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය ආයතනික, ප්‍රාග්ධන, තාක්ෂණ සහ වෙළඳපල සහයෝගය සැපයීමේ ප්‍රවේශය
- නව දේශීය හා විදේශීය ආයෝජන හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය
- පිරිවැය අවම බලශක්තිය, ප්‍රවාහනය, විදුලි සංදේශ, මූල්‍යකරණය හා අනෙකුත් යටිතල පහසුකම් සම්පාදනය
- සැපයුම් ජාලයන්හි වෙළඳපොළ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය
- දේශීය කර්මාන්ත ශක්තිමත් කරමින් විදේශ විනිමය අභිමුඛ සේවා කර්මාන්ත ප්‍රවර්ධනය
- පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිඵල මත භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය
- තිරසර පරිසර හිතකාමී ප්‍රවේශය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ජාතික සැලසුම්කරණය හා රාජ්‍ය මැදිහත්වීම් | ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව කර්මාන්ත අංශය විධිමත් කිරීමට රාජ්‍ය මැදිහත්වීම සහතික කිරීම | ▪ උපායමාර්ගික සැලසුම් සහ දූරදර්ශී විශ්ලේෂණය සඳහා ජාතික කර්මාන්ත සැලසුම් බුද්ධි මණ්ඩලයක් ස්ථාපිත කිරීම (National Industrial Think Tank).<br>▪ ජාතික ආර්ථිකයට සහ සමස්ත ස්ථාවරත්වයට, තිරසරභාවය සහ එක් එක් කර්මාන්ත අංශයේ සුවිශේෂී වැදගත්කම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් ප්‍රධාන කර්මාන්ත දියුණු කිරීම සඳහා ඍජු මැදිහත්වීම. |
| බදු, නීතිය සහ ඵලදායීතා වර්ධනය | තිරසර වර්ධනයක් සඳහා කාර්මික පාලනය ශක්තිමත් කිරීම සහ ව්‍යාපාරික පරිසරය සක්‍රීය කිරීම | ▪ එක් එක් අංශයට ආවේණික වූ විශේෂිත අවදානම්, පුළුල් අරමුණු සහ රජය විසින් සකස් කර ඇති ප්‍රමුඛතා මත පදනම්ව විවිධ කාර්මික වර්ගීකරණයන් සඳහා වන බදුකරණ ව්‍යුහයන් සැකසීම.<br>▪ ජාතික අවශ්‍යතා වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවන අලාභ අවම කිරීමට ආයෝජන ආරක්ෂණ නීති ශක්තිමත් කිරීම.<br>▪ වෙළඳපොළ බලවේගවල අහිසි බලපෑම්වලින් සුළු පරිමාණ නිෂ්පාදකයන් ආරක්ෂා කරගැනීමට අවශ්‍ය නීති සම්පාදනය කිරීම.<br>▪ වාණිජමය සම්බන්ධ නඩු සහ බේරුම්කරණය වේගවත් කිරීම සඳහා ආරවුල් විසඳීමේ පනත ශක්තිමත් කිරීම.<br>▪ ඵලදායීතාව, ගුණාත්මකභාවය සහ පිරිවැය අරමුණු සපුරාලීම සහතික කිරීම සඳහා පුළුල් තාක්ෂණික සහය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.<br>▪ පවතින නීතිය සාධාරණව සහ කාර්යක්ෂමව ඉටුකිරීම මඟින් ව්‍යාපාරවලට ආරක්ෂාවත්, ව්‍යාපාර කරගෙන යාම සඳහා අවශ්‍ය සම බිමක් සකස් කිරීම. |
| ජාත්‍යන්තර හා දේශීය වෙළඳපොළ පුළුල් කිරීම සහ කාර්යක්ෂමතාවය | ගෝලීය වෙළඳපොළ ඒකාබද්ධතාවය සහ අපනයන තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම | ▪ දේශීය වෙළඳපොළ කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය වෙනස්කම් සිදුකිරීම.<br>▪ රාජ්‍යතාන්ත්‍රික සේවාවන් මගින් ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම හා නිශ්චිත නිර්ණායකයන් මත වෙළඳපොළ අත්පත් කරගැනීමට කටයුතු මෙහෙයවීම.<br>▪ පවතින නිදහස් වෙළඳ ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට ප්‍රවේශවීම.<br>▪ වරාය, ගුවන් තොටුපළ සහ වරාය නගර සැපයුම් දාම කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කරමින් කර්මාන්තවලට විදේශ වෙළඳපොළට ප්‍රවිශ්ට වීමට පහසුකම් සැලසීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ආරම්භක ව්‍යාපාර සඳහා වෙළඳ සහතික ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ නව අපනයන කර්මාන්ත සඳහා සහතිකකරණයට අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම.<br>▪ අවශ්‍ය මූල්‍ය සේවා, ණය පහසුකම් හා අපනයන ඒකාබද්ධ කිරීමේ (Export Consolidation) සේවා මගින් ක්ෂුද්‍ර,කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට (MSMEs) සහාය වීම.<br>▪ ඩිජිටල් තාක්ෂණයන් සහ ඊ වාණිජ වේදිකා භාවිතා කිරීමෙන් ජාත්‍යන්තර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම. |
| කර්මාන්තපුර සහ යටිතල පහසුකම් | ප්‍රශස්ත කලාප සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් කාර්මික වර්ධනය ශක්තිමත් කිරීම | ▪ උපයෝගී කර නොගත් සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවතින කර්මාන්තපුර සංවර්ධනය කිරීම.<br>▪ හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර, මෙම කලාපවල නවෝත්පාදන සහ කාර්මික විවිධාංගීකරණයට අනුබල දීම.<br>▪ ධීවර, කෘෂි සහ සංචාරක කර්මාන්තවලට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ඒ ඒ ප්‍රදේශවල දියුණු කිරීම. |
| ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | යෝග්‍ය සවිබල ගැන්වීමේ යාන්ත්‍රණ තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නගා සිටුවීම | ▪ ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අනුගත ඒකාබද්ධ සහය ලබා දීම සඳහා කැපවූ අංශයක් ස්ථාපිත කිරීම සහ ව්‍යාපාරික අවශ්‍යතා කාර්යක්ෂමව ලබා දීම සඳහා තනි කවුළු සහාය ලබා දීම. (Single Window)<br>▪ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය ආධාර සැපයීම සඳහා සංවර්ධන බැංකුවක් මඟින් මූල්‍ය ක්ෂේත්‍ර හරහා ශක්‍යතා ඇගයීම් මත රුපියල් මිලියන 10 දක්වා ඇපකර රහිත ණය යෝජනා ක්‍රමයක් (Based on Feasibility and Credit Score) ක්‍රියාත්මක කිරීම.<br>▪ සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුද ඇතුළත් සමුපකාර බැංකුකරණය ශක්තිමත් කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| | | ▪ සහයෝගීතාවයේ සාමූහික බලය වැඩිදියුණු කිරීම, ශක්තිමත් කිරීම සඳහා නව සමූපකාර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීම.<br>▪ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම හා හිඟ ණය සඳහා සහන සැලසීමට නව සහන බැංකුවක් ස්ථාපිත කිරීම.<br>▪ වෙළඳපොළ වෙත ළඟා වීමට Start-up තෝරා ගැනීමට සහාය වීම සඳහා Start-up Incubator වැඩසටහන ස්ථාපිත කිරීම, එම ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම.<br>▪ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන ක්‍රමය යටතේ(TIEP) අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර ආනයන සඳහා පහසුකම් සැලසීම.<br>▪ ප්‍රධාන වශයෙන් කෘෂි කර්මාන්තය පදනම් කරගත් අගය එකතු කළ කර්මාන්ත, ඛනිජ මත පදනම් වූ කර්මාන්ත, ඇසුරුම් කර්මාන්ත, විදුලිබල හා බලශක්තිය, අපනයන කේන්ද්‍රී නිෂ්පාදන, සමුද්‍රීය සේවා, ගුවන් යානා නඩත්තු කිරීම සහ සේවා සැපයීම, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ ඒ ආශ්‍රිත සේවා, ඉදිකිරීම් සහ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම.<br>▪ මත්ස්‍ය වගාව, තාක්ෂණයෙන් මඟ පෙන්වන මසුන් ඇල්ලීම, ධීවර උපකරණ හා යාත්‍රා නිෂ්පාදනය, නිෂ්පාදන කල්තබා ගැනීම, ඇසුරුම්කරණය, දේශීය විදේශීය වෙළඳපොළ හා කර්මාන්තයේ යෙදෙන ප්‍රජාවේ සමාජ හා ආර්ථික ගැටලු සැලකිල්ලට ගනිමින් ධීවර කර්මාන්තය දියුණු කිරීමට ජාලගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශව එක්ව කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාව ස්වයංපෝෂණය කිරීම ඉලක්ක කරගත් වැඩපිළිවෙළක් සකස්කොට ක්‍රියාත්මක කිරීම.<br>▪ සම්පත් සුලබතාවය හා ලබා ගත හැකි බව, වෙළඳපොළ අවස්ථා සහ වර්ධනය වීමේ හැකියාව මත පදනම්ව ඒ ඒ දිස්ත්‍රික්ක සංවර්ධන සැලැස්ම යටතේ දිස්ත්‍රික්කයට/ප්‍රදේශයට ආවේණික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ දේශීය පරිභෝජනය සඳහා උපකරණ, මෙවලම් සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ එමගින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා නිමැවුම් නිෂ්පාදනය උත්තේජනය කිරීම. |
| සම්ප්‍රදායික ශිල්ප හා හස්ත කර්මාන්ත | සම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය සහ සවිබල ගැන්වීම | ▪ මෙම කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතන පද්ධතිය පොදු අරමුණක් උදෙසා කාර්යක්ෂමව මෙහෙයවීම.<br>▪ වඩු කර්මාන්තය ඇතුළු අනෙකුත් සම්ප්‍රදායික කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සුලභ කිරීම හා තෝරාගත් යෙදවුම් වගා කිරීමට වැඩපිළිවෙළක් සකස් කිරීම.<br>▪ මොරටුව ඇතුළු සියලුම වඩු කාර්මික ජනතාව මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන යන සියල්ල ඒකාබද්ධ කොට ක්‍රියාකාරී මෙහෙයුම් කමිටුවක් පිහිටුවීම.<br>▪ ලියාපදිංචි ශිල්පීන්ට අවශ්‍ය කරන තාක්ෂණික මෙවලම් බදු සහන ලබා දීම.<br>▪ සමූපකාර ක්‍රමය යටතේ නිෂ්පාදකයන් සංවිධානය කිරීම සහ ශක්තිමත් කිරීම.<br>▪ අපනයන ක්‍රියාවලියේදී සිදුවන පිරිවැය අවම කර ගැනීමට අපනයන ක්‍රියාකාරකම් ජාලගත පද්ධතියක් මගින් ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙළක් දියත් කිරීම.<br>▪ ශිල්පීන් හා ශිල්පය ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂණ දැළක් ඇතුළු ජාතික වැඩපිළිවෙළක් දියත් කිරීම. |
| තිරසර සංවර්ධනයට අවශ්‍ය වන මැදිහත්වීම | තිරසර සහ සාධාරණ වෙළෙඳ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම | ▪ තිරසරත්වය කරා අර්ථවත් ප්‍රගතියක් ලබා ගැනීමට සහ ගෝලීය වෙළඳපොළේ විකාශනය වන ඉල්ලීම් වන සාධාරණ වෙළඳාම(Fair Trade) ශ්‍රම ප්‍රමිතීන් හා විනිවිදභාවය (Transparency) සපුරාලීම සඳහා කර්මාන්තවලට සහය වීම හා ඒ පිළිබඳව ජාතික වැඩපිළිවෙලක් දියත් කිරීම.<br>▪ පාරිසරික තිරසරභාවය සහතික කිරීම, දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සහ කාර්මික අංශයේ දිගුකාලීන ශක්‍යතාව සහ කුසලතා සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සන්ධිස්ථාන සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් උපායමාර්ගික පුළුල් වැඩපිළිවෙළක් සකස් කිරීම. |
| ඩිජිටල්කරණය සහ තාක්ෂණික භාවිතය | ඉදිරි වර්ධනය සඳහා කාර්මික ඩිජිටල් පරිවර්තනය සහ | ▪ හතරවෙනි කාර්මික විප්ලවයේ ප්‍රතිලාභ වේගයෙන් අත්පත් කර ගැනීම සහ ඉදිරි පස්වෙනි කාර්මික විප්ලවය සඳහා අපගේ කර්මාන්ත සූදානම් උදෙසා දර්ශකයක් |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | නවෝත්පාදනය මෙහෙයවීම | (Industry 4.0/5.0 Maturity Index) ස්ථාපිත කිරීමට කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම.<br>▪ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාව, අති නවීන දත්ත මධ්‍යස්ථාන සහ විස්තීර්ණ සයිබර් ආරක්ෂණ පද්ධති ඇතුළත් ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයෝජන දිරිමත් කිරීම.<br>▪ කාර්මික නවෝත්පාදනයන් සහ තරඟකාරිත්වය ඇති කිරීම සඳහා යටිතල ව්‍යුහය IoT, AI, cloud computing සහ දත්ත විශ්ලේෂණ වැනි උසස් තාක්ෂණයන් සඳහා පදනම සැකසීම.<br>▪ ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යවසායකයින් අතර ඩිජිටල් පරිවර්තනය සඳහා ඔවුන්ගේ ධාරිතාව ඉහළ නංවමින් කර්මාන්ත 4.0 තාක්ෂණයන් අනුගමනය කිරීම දිරිමත් කිරීම සහ සහය වීම.<br>▪ ව්‍යාපාරවලට ඔවුන්ගේ මෙහෙයුම්වලට ඩිජිටල් තාක්ෂණ ඒකාබද්ධ කිරීමට උපකාර කිරීම සඳහා දිරිගැන්වීම් හා තාක්ෂණික සහාය සැපයීම.<br>▪ ශ්‍රම බලකායේ ඩිජිටල් සාක්ෂරතාවය සහ තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නිපුණතා සහ නැවත පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා ආයෝජන දිරිමත් කිරීම.<br>▪ කර්මාන්තය, ශාස්ත්‍රීය, පර්යේෂණ ආයතන සහ ආරම්භක ව්‍යවසායකයින් අතර සහයෝගීතාවයට සහය වන ඩිජිටල් නවෝත්පාදන පරිසර පද්ධතියක් (Startup Eco System) ස්ථාපිත කිරීම.<br>▪ දැනුම බෙදා ගැනීම, තාක්ෂණික හුවමාරුව සහ ව්‍යවසායකත්ව වර්ධනය සඳහා පහසුකම් සැලසීම සඳහා නවෝත්පාදන මධ්‍යස්ථාන, තාක්ෂණික උද්‍යාන සහ ඉන්කියුබේටර් ස්ථාපිත කිරීම.<br>▪ නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත රහස්‍යභාවය සහ ආරක්ෂාව හා සයිබර් ආරක්ෂාව සහතික කරන පුළුල් නීතිමය රාමුවක් රාමුවක් ක්‍රියාත්මක කිරීම.<br>▪ පූර්ව නිශ්චිත ප්‍රමිතික සහ ඉලක්කවලට ළඟාවීමට, ඩිජිටල් පරිවර්තන ප්‍රයත්නවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා යාන්ත්‍රණ සකස් කිරීම.<br>▪ ඊ -රාජ්‍ය මුලපිරීම්( e-Government Initiatives) හරහා කර්මාන්ත ක්‍රියාකාරකම් විධිමත් කිරීමට සහ සේවා කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීමට අති |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | නවීන තනි කවුළු වේදිකාවක් (Single Window) යෙදවීම. |
| ව්‍යාපාර කිරීමේ පහසුව ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්වය | ඩිජිටල් නවෝත්පාදන, මූල්‍ය ආකෘති සහ සහාය සේවා මඟින් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික වර්ධනය මෙහෙයවීම | ▪ ක්ෂුද්‍ර මූල්‍ය මූලාරම්භයන්, ව්‍යාපාර ප්‍රවර්ධන අරමුදල් සහ නව්‍ය සංවර්ධන බැංකු, මඟින් මූල්‍යකරණයට ප්‍රවේශවීමට පහසුකම් ලබා දීම.<br>▪ වෘත්තීය වැඩසටහන් සහ පාසල් විෂය මාලාවට අධ්‍යාපනය සහ පුහුණුව ඒකාබද්ධ කිරීම මගින් ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම, ඩිජිටල් නිදහස් සේවය (Free lancing) වෘත්තියක් ලෙස විධිමත් ලෙස පිළිගෙන අත්‍යවශ්‍ය පහසුකම් පිරිනැමීම.<br>▪ ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ ව්‍යාපාර ක්‍රියාවලීන්හි තාක්ෂණය භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.<br>▪ වෙළඳ ගිවිසුම්, අපනයන ප්‍රවර්ධන මුලපිරීම් සහ ජාලකරණය හරහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම.<br>▪ ඉන්කියුබේටර්, ඇක්සලරේටර්, සම- වැඩ කරන අවකාශයන් සහ ජාලකරණ ඇතුළුව ව්‍යවසායකත්වය සඳහා ආධාරක පරිසර පද්ධතියක් (Incubators, Accelerator Program, Co-working Spaces and Networking) සකස් කිරීම. |

## 3.9 තිරසර සම්පත් භාවිතාවක් - උපරිම ප්‍රතිලාභ ජනනයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- විද්‍යාත්මක ගවේෂණය
- තිරසර කැණීම් සහ භාවිතය
- ප්‍රශස්ථ උපයෝජනය
- දේශීය හා ගෝලීය වෙළඳපොළ උපරිම ප්‍රතිලාභ

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ඛනිජ ආශ්‍රිත සම්පත් | සම්පත් ප්‍රශස්තකරණය, නවෝත්පාදනය සහ තිරසර සංවර්ධනය තුළින් කාර්මික වර්ධනය ප්‍රවර්ධනය කිරීම | ඛනිජ ආශ්‍රිත සම්පත් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමෙන් පසු පහත සඳහන් කර්මාන්ත ක්‍රමානුකූලව ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත.<br><br>▪ දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කොට රට තුළ සහ සාගර පතුල තුළ ඇති ඛනිජ නිධි හා විරළ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ගවේෂණය සිදු කිරීම.<br>▪ ඛනිජ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම, වෙළඳපොළ පුරෝකථනය කිරීම ආදිය සඳහා විශේෂඥ ඒකකයක් ස්ථාපිත කිරීම.<br>▪ දේශීය වෙළඳපොළ අවශ්‍යතාවය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කොට ගුණාත්මක තත්ත්වයේ ලුණු නිෂ්පාදනය පුළුල් කිරීම.<br>▪ ලුණු නිස්සාරණයේ අතුරු නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණික හා යටිතල පහසුකම්.<br>▪ ශ්‍රී ලංකාවේ ඇති සර්පන්ටයින් නිධි උපයෝගී කර නිකල් සල්ෆේට් හා මැග්නීසියම් ආශ්‍රිත නිෂ්පාදන.<br>▪ කෘෂිකර්මාන්තයේ කෙටිකාලීන බෝග සඳහා වඩාත්ම යෝග්‍ය සිංගල් සුපර් පොස්පේට්(SSP) නිපදවීමට සහ මාධ්‍ය කාලීන බෝග සඳහා පොස්පේට් පොහොර නිෂ්පාදනය සඳහා කර්මාන්ත.<br>▪ කෘෂිකර්මාන්ත සඳහා යොදා ගැනෙන ඩොලමයිට් පොහොර ප්‍රමිතියෙන් යුතුව නිපදවීම.<br>▪ දේශීය වෙළඳපොළ ඉලක්කකොට අවසාදිත හුණුගල් ඇති ප්‍රදේශ පදනම්ව නව සිමෙන්ති නිෂ්පාදනාගාරයක්.<br>▪ ඖෂධ, කඩදාසි, රෙදිපිළි ඇතුළු අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය ගුණාත්මක තත්ත්වයේ අවක්ෂේපිත කැල්සියම් කාබනේට් නිෂ්පාදනය.<br>▪ ඛනිජ වැලි පිරිපහදුවේදී වඩාත් පිරිසිදු ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් ආදිය නිස්සාරණය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වා දීම.<br>▪ ඉල්මනයිට් සහ රූටයිල් අමුද්‍රව්‍ය ලෙසට අපනයනය වෙනුවට ටයිටේනියම් ඔක්සයිඩ් ($TiO_2$) නිපදවීමේ කර්මාන්ත ශාලාවක්.<br>▪ ඛණිජ වැලි නිස්සාරණයේදී ලැබෙන සර්කෝන් පෝසිලෙන් භාණ්ඩ ඔපදැමීම සඳහා අවශ්‍ය වන ආකාරයට පිරිසිදු කරන කර්මාන්ත. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ජාත්‍යන්තර නීතිවලට අනුකූලව හා අදාළ ආයතනවල සහය ඇතිව මොනසයිට් වැලිවලින් තෝරියම්, ලැන්තනම් හා සීරියම් වෙන්කිරීමේ කර්මාන්ත ශාලා.<br>▪ ගාර්නට් වැලි ආශ්‍රිත අගය එකතු කිරීමේ කර්මාන්ත.<br>▪ ධමනි තිරුවාන හා සිලිකා වැලිවල ඌණ උපයෝගීතාවයන් අවම කර ඒ ආශ්‍රිත නව කර්මාන්ත පිහිටුවීම.<br>▪ මිනිරන්වල කාබන් ප්‍රතිශතය 99.9% දක්වා ඉහළ දැමීම සඳහා පර්යේෂණ සිදුකොට ඒ ආශ්‍රිත කර්මාන්ත.<br>▪ මිනිරන්වලින් නිමි භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම.<br>▪ අධි කාර්යක්ෂම බැටරි, යකඩ, සිමෙන්ති, ටයර් ආදී නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහල දැමීමට ග්‍රැෆීන් යොදාගැනීමේ කර්මාන්ත.<br>▪ දේශීය අමුද්‍රව්‍ය යොදාගනිමින් අධි තාක්ෂණික උපකරණ සඳහා අවශ්‍ය සෙරමික් හා පෝසිලේන් උපාංග සැකසීමේ නිෂ්පාදන දිරිගැන්වීම. |
| මැණික් හා ස්වර්ණාභරණ | ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තවල තිරසර සංවර්ධනය සහ ගෝලීය තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම | ▪ මැණික් නිධි හඳුනාගැනීම සඳහා නවීන තාක්ෂණය<br>▪ මැණික් වල අගය එකතු කිරීමේ නව තාක්ෂණික සහය<br>▪ ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපොළක්<br>▪ රත්නපුර නගරය ආශ්‍රිතව ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක්<br>▪ පතල් කර්මාන්තයේ හා මැණික් ව්‍යාපාරයේ තිරසර සංවර්ධනය ඉලක්කකර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත සඳහා අත්‍යවශ්‍ය යාවත්කාලින සංශෝධනයන්<br>▪ ජාත්‍යන්තර මට්ටමේ මැණික් පර්යේෂණ රසායනාගාර<br>▪ මැණික් කර්මාන්තයේ යෙදෙන සියලුම පාර්ශවකරුවන් විධිමත්ව ලියාපදිංචි කිරීම හා යාවත්කාලීන දත්ත පද්ධතියක්<br>▪ මැණික් පතල් සේවකයන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රමිතීන්<br>▪ ජාත්‍යන්තර මැණික් මිල හා ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු දේශීය පතල්කරුවන්ට ලබා දීමේ ක්‍රමවේදයක් |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ මැණික් කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා 'මැණික් කර්මාන්ත සේවක සුරක්ෂා අධිකාරිය' පිහිටුවීම<br>▪ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සමඟ සබැඳි රාජ්‍ය ආයතන සියල්ල එකිනෙක භෞතික ලෙස හා ඩිජිටල් ලෙස සම්බන්ධීකරණය<br>▪ මැණික් කර්මාන්තයේ නියැලෙන ශ්‍රමිකයින් මුහුණ දෙන පතල් අනතුරු හේතුවෙන් සිදුවන පූර්ණ ශරීර අකර්මණ්‍ය වීමකදී සහ මරණයකදී සාධාරණ වන්දි මුදල් ලබාදෙන ක්‍රමයක්<br>▪ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයින් සඳහා දැනට පවතින අරමුදල රාජ්‍ය මැදිහත්වීම යටතේ ක්‍රමවත් කරමින් විශ්‍රාම දීමනාවක් සහිත සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක්<br>▪ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලාවන් හඳුන්වාදීම සහ එකී පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම්<br>▪ සම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය සුරක්ෂිත කරමින් මැණික් කර්මාන්තය යාන්ත්‍රිකරණය කිරීම<br>▪ කර්මාන්ත සංවර්ධනයට හිතකර බදු ක්‍රමයක් හඳුන්වා දීම |

## 3.10 සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් - තිරසර විනිමය ප්‍රභවයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- බලශක්තිය අත්‍යාවශ්‍ය ජාතික සේවාවක් ලෙස
- තිරසර හා සුරක්ෂිත බලශක්ති සැපයුම සහ පරිභෝජනය
- බලශක්ති ආර්ථිකය තුළින් විදේශ විනිමය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| බලශක්ති පිරිවැය අවම කිරීම | තරඟකාරී අවම කාබන් වෙළඳපොල යාන්ත්‍රණ හරහා සැමට ප්‍රවේශ විය හැකි අඩු වියදම් බලශක්තිය තහවුරු කිරීම | ▪ පුනර්ජනනීය බලශක්ති සහ පිරිසිදු බලශක්ති ප්‍රභවයන්ට ප්‍රමුඛත්වය දෙමින් විදුලි ජනනය සඳහා ඛනිජ තෙල් මත යැපීම අවම කිරීම.<br>▪ විදුලිය සඳහා තීරු ගාස්තු යාවත්කාලීන කිරීම සහ තරඟකාරී මිලකරණ ආකෘතියක් ක්‍රියාත්මක කිරීම.<br>▪ පැහැදිලි සහ සාධාරණ ගැලපුම් ක්‍රියාවලියක් නිර්මාණය කිරීම සඳහා ද්‍රව පෙට්‍රෝලියම් සහ ඛනිජ තෙල් මිල සූත්‍ර වෙනස් කිරීම.<br>▪ බලශක්ති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සංකීර්ණ සහ අතරමැදි බදු රාශියක් වෙනුවට සරල බදු ක්‍රමයක් හඳුන්වා දීම |
| පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් උපයෝගී කර ගනිමින් විදුලි උත්පාදනය වැඩි දියුණු කිරීම | නවා ප්‍රවේශයන් තුළින් දේශීය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ විභවයන් උපරිම කිරීම | ▪ බලශක්ති අර්බුදය විසඳීම සඳහා සූර්ය බලශක්ති ධාරිතාව මෙගාවොට් 2,000 කින් ඉහල නැංවීම සඳහා පස් අවුරුදු සැලැස්මක් ආරම්භ කිරීම.<br>▪ පිරිවැය අවම කිරීම සඳහා නව ව්‍යාපාර ආකෘති සහ තීරුබදු හරහා වහල මත සවි කරන සූර්ය බල පද්ධති සහ බැටරි ගබඩා පද්ධති ප්‍රචලිත කිරීම.<br>▪ ශ්‍රී ලංකාවේ සුළං බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා තරඟකාරී ප්‍රසම්පාදන යෙදවීම.<br>▪ ශක්‍යතා අධ්‍යයන මත පදනම්ව ජලවිදුලි පෝෂක ප්‍රදේශවල, වන ආවරණය වැඩි දියුණු කිරීම. |
| සූර්ය පැනල ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ජාල ගත කුඩා පද්ධති (micro grid) හෝ සුහුරු ජාල (smart grid) සංකල්පය මත පදනම් වූ පද්ධතියක් | පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම සහතික කිරීම සහ ඵලදායී ජාල කළමනාකරණය හරහා බලශක්ති ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීම සක්‍රිය කිරීම | ▪ පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය වැඩි දියුණු කිරීම සඳහා සුහුරු ජාල යටිතල පහසුකම් ස්ථාපිත කිරීම<br>▪ සාධාරණ වන්දි සඳහා නම්‍යශීලී සේවා සැපයීම සහ පාරිභෝගික සහභාගීත්වය සහතික කිරීම |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ හරිත හයිඩ්‍රජන් තාක්ෂණය | සහයෝගිතා රාමුවක් ස්ථාපිත කිරීම මගින් හරිත හයිඩ්‍රජන් විභවයන් උකහා ගැනීම | ▪ හරිත හයිඩ්‍රජන් ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා කැප වූ රාජ්‍ය නියෝජිතායතනයක් ස්ථාපිත කිරීම<br>▪ හරිත හයිඩ්‍රජන් අංශයේ ප්‍රවීණත්වය සහ නවෝත්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ශාස්ත්‍රීය හා කර්මාන්තවල වෘත්තිකයන් සම්බන්ධ කිරීම<br>▪ හරිත හයිඩ්‍රජන් තාක්ෂණය සඳහා සහයෝගීතාවය සහ ආයෝජන ඉහල නැංවීම සඳහා ජාත්‍යන්තර නායකයින් සහ පාර්ශවකරුවන් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම<br>▪ නියමු ව්‍යාපෘති ආරම්භ කිරීම සහ තාක්ෂණ සමග ඒකාබද්ධ කිරීම |
| බලශක්ති ගබඩා පද්ධති | ජාල විශ්වසනීයත්වය වැඩි දියුණු කරන පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධතාවයට සහය වන ආර්ථික වාසි සපයන බලශක්ති ගබඩා පද්ධති සඳහා ක්‍රමානුකූල යාන්ත්‍රණයක් වැඩිදියුණු කිරීම සහතික කිරීම | ▪ පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය වැඩි දියුණු කිරීම සඳහා පොම්ප කරන ලද ජල විදුලි ගබඩා, බැටරි බලශක්ති ගබඩා පද්ධති සහ දෙමුහුන් පද්ධතිවල විභවයන් තක්සේරු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම.<br>▪ ශක්‍යතා අධ්‍යයනයන් මගින් හඳුනාගෙන ඇති විශේෂිත බලශක්ති ගබඩා ව්‍යාපෘති සහ තාක්ෂණයන්ට ගැලපෙන නව්‍ය ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීම<br>▪ බලශක්ති ගබඩා ව්‍යාපෘති සහ ඊට අදාල තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය ආයෝජන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම |
| සංක්‍රාන්ති ඉන්ධන (transition fuel) ලෙස ස්වභාවික ද්‍රව වායු (LNG) | විවිධාංගීකරණය තුළින් බලශක්ති සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම | ▪ තරඟකාරී ප්‍රසම්පාදනය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම තුලින් ස්වභාවික ද්‍රව වායු ආනයනය සඳහා සහාය වීම<br>▪ තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් තුලින් ස්වභාවික ද්‍රව වායු සැපයීම සඳහා ඉන්ධන ප්‍රභවයන් හඳුනා ගැනීම සහ අනාරක්ෂිතභාවය අවම කිරීම<br>▪ දැනට පවතින මෙගාවොට් 1,500ක තාප විදුලි බලාගාර ස්වභාවික ද්‍රව වායු බලාගාර බවට පරිවර්තනය කිරීම |
| කුඩා ජලවිදුලි බලාගාර සහ අනෙකුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා | සමතුලිත ප්‍රතිලාභ ලැබීමේ යාන්ත්‍රණයන් තුලින් නව්‍යකරණ | ▪ ගිවිසුම් අලුත් කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම, මහජනතාවට ප්‍රතිලාභ ගලායාම සහතික කිරීම සහ සාධාරණ මෙහෙයුම් ගාස්තුවක් සහතික කිරීමෙන් ව්‍යාපෘති සංවර්ධකයා විසින් ආයෝජනය කරන ලද ප්‍රාග්ධන මූල්‍ය ආරක්ෂා කිරීම |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම (PPA) අලුත් කිරීම | ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සහතික කිරීම | |
| කුඩා න්‍යෂ්ටික බලාගාර තාක්ෂණයට අනුගත වීම(SMR technology) | වැඩිදියුණු කළ න්‍යෂ්ටික තාක්ෂණයන් සංවර්ධනය කිරීම සහ භාවිතය තුළින් න්‍යෂ්ටික බලශක්තිය යෙදවීම සහතික කිරීම | ▪ අවශ්‍ය මානව සම්පත්, භෞතික පහසුකම්, ප්‍රමිතීන් සහ නියාමන රාමු සංවර්ධනය කිරීම සඳහා සහයෝගීතා ගිවිසුම් අවසන් කිරීමට සහ අත්සන් කිරීමට තාක්ෂණයෙන් ඉදිරියෙන් සිටින ප්‍රමුඛ රටවල් සහ සංවිධාන සමඟ සම්බන්ධ වීම |
| ඛනිජ තෙල් අංශයේ සංවර්ධනය | අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා සහ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අනුගාමී සහ උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තය වැඩිදියුණු කිරීම සහතික කිරීම | ▪ පවතින පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ගොඩනැගීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් කඩිනම් කිරීම.<br>▪ නිෂ්පාදන ආර්ථිකයට ඉන්ධන සැපයීම සඳහා පිරිපහදු අතුරු නිෂ්පාදන භාවිතා කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සහ අධ්‍යයනයන් හරහා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා දක්ෂ ශ්‍රම බලකායක් පුහුණු කිරීම සඳහා පරිපූර්ණ, ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම.<br>▪ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් දැනට පවතින සියලුම ගිවිසුම් නැවත සලකා බැලීම.<br>▪ තෙල් සංස්ථාව සතු ටැංකි 24 ක් සහ හවුල් ව්‍යාපාර සමාගමට අයත් ටැංකි 61ක් ඒවායේ උපයෝගීතාව උපරිම කර ගැනීම සඳහා නව ව්‍යාපාර ආකෘතීන් හරහා ආර්ථිකයට ඒකාබද්ධ කිරීම.<br>▪ ගබඩා සංකීර්ණ නවීකරණය කිරීම සහ දුම්රිය ප්‍රවාහනය භාවිතා කිරීම මඟින් , කාලගුණ විචල්‍යතා සහ භූ දේශපාලන විචල්‍යතාවන්හිදී පවා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම.<br>▪ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) හි අරමුදල් හරහා කොළඹ වරාය සහ කොලොන්නාව පර්යන්තය අතර අබලන් වූ නල මාර්ගය, විවිධ ඛනිජ තෙල් නිෂ්පාදන පැටවීම සහ ගොඩබෑම කළ හැකි පද්ධතියක් ලෙස වැඩිදියුණු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ දැනට පවතින තෙල් පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව ත්‍රිකුණාමලයේ ජාත්‍යන්තර තෙල් සම්ප්‍රේෂණ සහ භාණ්ඩ ගබඩා කිරීමේ පර්යන්තයක් ඉදිකිරීම.<br>▪ දේශීය ඉල්ලුමට සරිලන පරිදි සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ පිරිපහදු කළ තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා විදේශීය වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක් අත්පත් කර ගැනීම.<br>▪ මන්නාරම සහ කාවේරි ද්‍රෝණියේ ස්වභාවික වායු සම්පත්වල වාණිජ වටිනාකම සාක්ෂාත් කර ගැනීම සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ වාණිජකරණය සහ නව ගවේෂණ ගිවිසුම් කඩිනම් කිරීම.<br>▪ රජයේ මැදිහත්වීම මඟින් යහපත් ආර්ථිකයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව විදුලිය සහ ඛනිජ තෙල් ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා ජලාශ සහ ඉන්ධන ගබඩා මට්ටම් සහ අවදානම් කළමණාකරණ මෙවලම් පුරෝකථනය කිරීමට නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම.<br>▪ 2050 ශුද්ධ ශුන්‍ය විමෝචන ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරමින් දේශීය සහ විදේශගත ශ්‍රී ලාංකීය විද්‍යාර්ථීන්ගේ සහයෝගය ඇතිව, දැනට එළඹී ඇති ප්‍රමාණවත් නොවන කෙටිකාලීන පාරිසරික ඉලක්ක පිළිබඳ වගන්ති යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. |
| විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘති සම්බන්ධීකරණය, ජාත්‍යන්තර ආයෝජන. | බලශක්ති කාර්යක්ෂමතාව සහතික කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ක්‍රමානුකූලව ප්‍රතිව්‍යුහගත කිරීමේ යාන්ත්‍රණයන් හරහා විශ්වාසනීය සේවා සැපයීම සහතික කිරීම | ▪ පාර්ශ්වකරුවන්ගේ උපදේශන සහ සාක්ෂි පදනම් කරගත් උපාය මාර්ග හරහා විදුලිබල හා ඛනිජ තෙල් ක්ෂේත්‍ර ක්‍රමානුකූලව ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කිරීම.<br>▪ දිගුකාලීන බලශක්ති සැපයුම් සැලැස්මක් සමඟ සමපාත වන රාජ්‍ය පෞද්ගලික සහ ජාත්‍යන්තර ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ පහසුකම් සැලසීමට විශේෂිත කාර්යාංශයක් ස්ථාපිත කිරීම.<br>▪ විදුලිබල පද්ධතියේ සිදුවන තාක්ෂණික හානි සහ බලශක්ති පද්ධතිවල ආයතනික කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) හරහා අවශ්‍ය ක්‍රියාමාර්ග බලාත්මක කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශාන්තිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ කර්මාන්ත-සම්මත දර්ශක මත පදනම්ව විදුලිය බිඳවැටීම් අත්විඳින පාරිභෝගිකයින් සඳහා දිගුකාලීන වන්දි යාන්ත්‍රණයක් ඇතිකිරීම. |
| පාරිභෝගික සේවාව | සාධාරණ මූල්‍ය විසඳුම් ක්‍රියාවට නැංවීමෙන් සියලුම පාරිභෝගිකයින්ට, විශේෂයෙන් අඩු ආදායම්ලාභී කුටුම්භ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට (SMEs) සාධාරණ ලෙස විදුලි බල ප්‍රවේශය සහතික කිරීම | ▪ 2022 සහ 2024 අතර අයුක්ති සහගත ලෙස ඉහළ බිල්පත් හේතුවෙන් විසන්ධි කරනු ලැබූ අඩු ආදායම්ලාභී පවුල් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇතුළු පාරිභෝගිකයින් හට විදුලි සම්බන්ධතා ලබා දීම.<br>▪ මූල්‍ය සහන සහතික කිරීම සහ ක්‍රමානුකූලව ආපසු ගෙවීමට පහසුකම් සැලසීම සඳහා ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීමට පාරිභෝගිකයින් හට සාධාරණ වාරික සැලැස්මක් ඉදිරිපත් කිරීම.<br>▪ අත්‍යවශ්‍ය විදුලි සේවා සඳහා පුළුල් ප්‍රවේශය ප්‍රවර්ධනය කරමින් අඩු ආදායම්ලාභී කුටුම්භ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා නව විදුලි සම්බන්ධතා සඳහා වාරික ගෙවීමේ විකල්ප ලබා දීම. |
| රාජ්‍ය ආයතනවල සහ ආගමික ස්ථානවල බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ වැඩසටහන් | පුළුල් ජාතික වැඩසටහනක් හරහා බලශක්ති ස්වාධීනත්වය සහ තිරසර බව සහතික කිරීම | ▪ ආයතනවලට (රජයේ රෝහල්, පාසල් සහ ආගමික) ස්වයං ජනන විදුලිය නිපදවීමට හැකිවන පරිදි සූර්ය පැනල, සුළං ටර්බයින සහ වෙනත් පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් හඳුන්වා දීම<br>▪ සමස්ත පරිභෝජනය අඩු කරමින් බලශක්ති කාර්යක්ෂම භාවිතයන් සහ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සහ සම්පත් ලබා දීම. |
| ප්‍රවාහන බලශක්ති සංක්‍රමණ | ප්‍රවාහන අංශය ෆොසිල ඉන්ධන මත යැපීමේ සිට විද්‍යුත් සංචලනය දක්වා පරිවර්තනය කිරීම, පිරිසිදු බලශක්ති උත්පාදනය කිරීම සහ ස්මාර්ට් ප්‍රවාහන යටිතල පහසුකම්වල තිරසර සංවර්ධනයට සහාය වීම සහතික කිරීම | ▪ ප්‍රවාහන අංශය ෆොසිල ඉන්ධන වලින් ක්‍රමානුකූලව පිරිසිදු බලශක්තිය භාවිතයෙන් විද්‍යුත් සංචලනය වෙත මාරු කිරීම.<br>▪ ජාතික ප්‍රවාහන සැලැස්ම, ජාතික විදුලි සංචලතා සැලැස්ම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම ඒකාබද්ධ කිරීම<br>▪ විදුලි සංචලතා මූලපිරීම් අධීක්ෂණය කිරීම සඳහා කැපවූ ආයතනයක් පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ජාතික EV ආරෝපණ ජාලයක් සංවර්ධනය කිරීම සහ හබ් සහ ස්පෝක් ස්මාර්ට් (hub-and-spoke smart city transportation) නගර ප්‍රවාහන ජාල ක්‍රියාත්මක කිරීම.<br>▪ විදුලි වාහන භාවිතය දිරිමත් කිරීම සඳහා මූල්‍ය දිරිගැන්වීම් හඳුන්වා දීම |
| බලශක්ති වෙළඳාම | ගෝලීය බලශක්ති වෙළඳපොලේ තරඟකාරී ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම | ▪ ජාත්‍යන්තර දත්ත මත පදනම්ව බලශක්ති ආයෝජන, වෙළඳාම සහ ගෝලීය වෙළෙඳපොළේ අනාගත දිශානතිය පිළිබඳ විශේෂඥ උපදෙස් සැපයීම සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම<br>▪ ශ්‍රී ලංකාව එහි භූගෝලීය සහ ආර්ථික විභවයන් උපයෝගී කරගනිමින් බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා ජාතික උපාය මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කිරීම. |
| ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම | විනිවිදභාවයෙන් යුත් කාර්යක්ෂම ටෙන්ඩර් සහ ප්‍රසම්පාදන පද්ධතියක් සහිත විස්තීර්ණ ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම හරහා මුදල් සඳහා වටිනාකම සහතික කිරීම. | ▪ බලශක්ති අංශයේ විනිවිද පෙනෙන හා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා ආරක්ෂිත ඩිජිටල් වේදිකාවක් ඇති කිරීම.<br>▪ බලශක්ති ගනුදෙනු පිළිබඳ තොරතුරු තත්කාලීනව ලබාගැනීම පහසු කිරීම සඳහා දේශීය බැංකු පද්ධති සමඟ බාධාවකින් තොරව සම්බන්ධ විය හැකි ඩිජිටල් වේදිකාවක් සැකසීම.<br>▪ විශේෂයෙන් කාර්මික සහ වාණිජ ක්ෂේත්‍රයන් සඳහා දිරිගැන්වීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් වේදිකාව උපයෝගී කර ගැනීම.<br>▪ සැපයුම් දාමයේ විශ්වසනීයත්වය ඉහළ නංවමින් සැපයුම්කරුවන් වෙත කඩිනමින් ගෙවීම් කිරීම සහතික කිරීම සඳහා ක්‍රියාවලීන් විධිමත් කිරීම.<br>▪ බලශක්ති සම්පත් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා, අවදානමට ලක්විය හැකි පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා පියවරයන් ගැනීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| බලශක්ති විගණනය | බලශක්ති විගණනයන් සිදු කිරීම සඳහා දිරිගැන්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම තුළින් බලශක්ති කාර්යක්ෂමතාව සහතික කිරීම | ▪ විස්තීර්ණ බලශක්ති විගණනයන් පැවැත්වීම සඳහා ව්‍යාපාර දිරිගැන්වීමට මූල්‍ය දිරිගැන්වීම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම.<br>▪ කාර්යක්‍ෂමතා වැඩිදියුණු කිරීම් සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා මහා පරිමාණ කාර්මික සහ වාණිජ පාරිභෝගිකයන් නිරන්තර බලශක්ති විගණනයකට ලක් කිරීම අනිවාර්ය කිරීම<br>▪ බලශක්ති සංරක්ෂණයේ යහපත් භාවිතයන් සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා කාර්මික උපකරණ, ගොඩනැගිලි සහ උපකරණ සඳහා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ බලාත්මක කිරීම |
| විමෝචන පාලන යාන්ත්‍රණය | විමෝචනය සහ හරිත බලශක්ති භාවිතයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ දේශීය කර්මාන්තවල තරඟකාරිත්වය සහතික කිරීම | ▪ ජාත්‍යන්තර වෙළෙඳපොළට, නිෂ්පාදන අපනයනය කරන දේශීය කර්මාන්තවලට සහාය වීම සඳහා හරිත බලශක්ති භාවිතයන් අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා වගකිව යුතු කැපවූ අධීක්ෂණ ආයතනයක් නිර්මාණය කිරීම. |
| තාක්ෂණය වැඩි දියුණු කිරීම සහ කුසලතා සංවර්ධනය | ජාත්‍යන්තර බලශක්ති ක්ෂේත්‍රය තුළ අන්තර්ජාතික තරඟකාරිත්වය ඉහළ නංවන අතරම ගෝලීය දේශගුණික ප්‍රවර්ධනයන්ට දායක වන නිපුණ ශ්‍රම බලකායක් සහතික කිරීම. | ▪ දේශගුණික ඉලක්කවලට සහාය වීම සඳහා නිපුණ සහ දක්ෂ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම තුළින් ගෝලීය දේශගුණික ප්‍රයත්නයන් සඳහා දායක වීම සහ විදේශ ආදායම් උත්පාදනය කිරීම සඳහා මාර්ගයක් සකසා ගැනීම.<br>▪ ගෝලීය බලශක්ති ක්ෂේත්‍රයට අවශ්‍ය නිපුණතා සැපයීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පුහුණු අංශ දේශීය විශ්වවිද්‍යාල පද්ධතිය සහ අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන සමඟ ඒකාබද්ධ කිරීම.<br>▪ බලශක්ති ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ජාතික උසස් අධ්‍යාපන ආයතන සහ බලශක්ති උපයෝගිතා, නියාමකයින් සහ කර්මාන්තය වැනි |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ඵලදායී පර්යේෂණ සහ සංවර්ධන සහයෝගිතා ප්‍රවර්ධනය කිරීම.<br>▪ විදුලිය සහ ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ දේශීය සමාගම්වලට ඇති බාධා ඉවත් කෙරෙන අතර, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.<br>▪ තාක්ෂණික හුවමාරුව සහ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා ජාත්‍යන්තර සමාගම් සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට දේශීය සමාගම් දිරිමත් කිරීම.<br>▪ ජාතික බලශක්ති ව්‍යාපෘතිවලට සහභාගී වීමෙන් ලබා ගන්නා අත්දැකීම් සහ සුදුසුකම් උපයෝගී කරගනිමින් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟ කිරීමට සහ අභ්‍යන්තර හා රාජ්‍ය තාන්ත්‍රික යාන්ත්‍රණයන් හරහා තවදුරටත් සහාය ලබා ගැනීමට දේශීය සමාගම්වලට හැකියාව වර්ධනය කිරීම. |

## 3.11 මහජන ප්‍රවාහන සේවාවක් - කාර්යක්ෂම ගමනාන්තයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ප්‍රවාහනය මහජන සේවාවක්
- පරිසර හිතකාමී හා තිරසර ප්‍රවාහන සේවාවක්
- ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක්
- මගී සංයුතියෙහි විවිධත්වය
- ප්‍රවාහන මාධ්‍ය අතර අන්තර් සම්බන්ධීකරණය
- ඩිජිටල් තාක්ෂණයෙන් සවිබලගැන් වූ ප්‍රවාහන පද්ධතියක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| දුම්රිය සේවය | ජාතික දුම්රිය පද්ධතිය පුනර්ජීවනය සහ පුළුල් කිරීම තුළින් තිරසර හා කාර්යක්ෂම ප්‍රවාහනය සහතික කිරීම | ▪ අබලන් තත්වයේ පවතින දුම්රිය මාර්ග නවීකරණය කර, විධිමත් නඩත්තු වැඩපිළිවෙලක් හඳුන්වා දී නවීන තාක්ෂණයෙන් යුත් ස්වයංක්‍රීය සංඥා පද්ධති ස්ථාපනය කිරීම.<br>▪ ප්‍රායෝගික අවශ්‍යතා පදනම් කරගනිමින් ක්‍රමානුකූලව ප්‍රධාන දුම්රිය මාර්ග මංතීරු දෙකේ මාර්ග ලෙස සහ ප්‍රධාන නගර ආශ්‍රිතව මංතීරු තුනේ මාර්ග ලෙසටත් වැඩිදියුණු කිරීම.<br>▪ ප්‍රමුඛතා පදනමින්, ක්‍රමානුකූලව, දැනට දුම්රිය මාර්ග ජාලය මගින් ආවරණය නොවන ප්‍රදේශ දක්වා දුම්රිය මාර්ග දීර්ඝ කර සෑම ප්‍රධාන නගරයකටම දුම්රිය මගින් ප්‍රවේශය සැපයීම.<br>▪ දුම්රිය මැදිරි වැඩිපුර යෙදවීම හා දුම්රිය ගමන් වාර ගණන වැඩිකිරීමෙන් සතියේ සෑම දිනකම පැය විසිහතර පුරා කාර්යක්ෂම දුම්රිය සේවාවක් ඇති කිරීම.<br>▪ විදුලි බලයෙන් දුම්රිය ධාවනය කිරීම දක්වා දුම්රිය පද්ධතිය ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම<br>▪ නිෂ්පාදන අමුද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික හා ධීවර නිෂ්පාදන ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා දුම්රිය සේවය කාර්යක්ෂමව භාවිතා කිරීම.<br>▪ දුම්රිය ස්ථාන ආසන්නයේ මගීන්ගේ පෞද්ගලික වාහන නැවැත්වීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීම.<br>▪ දුම්රිය සහ බස් සේවා සංවර්ධනය කිරීමේ වැඩසටහන්වලට ප්‍රමුඛත්වය දෙමින් අධික ජනගහනයක් සහිත ජනාකීර්ණ ප්‍රදේශවල පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම සඳහා දුම්රිය පාදක ප්‍රවාහන ක්‍රමවේදයන් (සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති වැනි) ක්‍රමාණුකූලව හඳුන්වා දීම. |
| බස් මගී සේවාව | තොරතුරු තාක්ෂණය සහ ගුණාත්මක මානව සම්පත් ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් මගින් බස් සේවාව නවීකරණය කිරීම තුළින් භාවිතය පහසුවන පරිදි (user-friendly) පොදු මගී ප්‍රවාහනය ප්‍රවර්ධනය සහතික කිරීම | ▪ මගී ප්‍රවාහනය සඳහා විශේෂයෙන් නිෂ්පාදිත බස් රථ හඳුන්වා දීම සහ එවැනි බස් රථ මිලදී ගැනීම සඳහා පහසු මූල්‍ය යෝජනා ක්‍රම ඇති කිරීම.<br>▪ ප්‍රධාන මාර්ගවල හා වර්තමානයේ මගී බස් ප්‍රවාහනය බිඳ වැටී තිබෙන අර්ධ නාගරික හා ග්‍රාමීය මාර්ගවල මෙන්ම රාත්‍රී කාලයේ ප්‍රවාහනයද විධිමත් කරමින් ශක්තිමත් බස් මගී සේවාවක් ඇති කිරීම.<br>▪ නවීන ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් බස් රථවලින් ලැබෙන සියලු ආදායම් සාධාරණ ලෙස බස් හිමියන් අතර බෙදීයන පරිදි, නිර්ණය කරනු ලබන පොදු ප්‍රවාහන කලාප සඳහා |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | රාජ්‍ය සහ පෞද්ගලික බස් සේවා ඒකාබද්ධ කරමින් ස්ථාපනය කෙරෙන පොකුරු බස් සමාගම් ඇති කිරීම.<br>▪ ඩිජිටල් වේදිකාවක් හරහා පෙර ගෙවුම් කාඩ්පත් මගින් ගෙවීම් කිරීමට ඉඩ සලසන පරිදි සියලුම බස් රථවල ටිකට් යන්ත්‍ර (POS) සවිකිරීම.<br>▪ පොදු ප්‍රවාහනයට ප්‍රමුඛත්වය දෙමින් ජනාකීර්ණ ප්‍රදේශවල බස් මංතීරු වෙන් කිරීම සහ ක්‍රමානුකූලව කඩිනම් බස් ප්‍රවාහන පද්ධති (Bus Rapid Transit (BRT) system) හඳුන්වා දීම.<br>▪ පොදු ප්‍රවාහන සේවය සඳහා විදුලියෙන් ක්‍රියාත්මක වන බස් රථ ක්‍රමානුකූලව හඳුන්වා දීම.<br>▪ මගීන්ට කිසිදු හිරිහැරයකින් තොරව ගෞරවාන්විතව බස් රථවල ගමන් කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා මගීන් සහ බස් සේවකයින් දැනුවත් කිරීම හා පුහුණු කිරීම.<br>▪ බස් නැවතුම්පොළ අසල මගීන් භාවිතා කරන පෞද්ගලික වාහන නවතා තැබීමේ පහසුකම් සංවර්ධනය කිරීම. |
| විධිමත් හා අනිවාර්ය කාලසටහන් | තොරතුරු තාක්ෂණය භාවිතයෙන් පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා නියාමන යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහතික කිරීම | ▪ දුම්රිය සේවය මෙන්ම මගී බස් රථ සේවය සඳහාද අනිවාර්ය කාලසටහන් ක්‍රමයක් හඳුන්වා දීම.<br>▪ උදෑසන සිට මධ්‍යම රාත්‍රිය දක්වා කාලසටහනකට අනුව ක්‍රියාත්මක වන අනිවාර්ය පොදු ප්‍රවාහන සේවයක් හඳුන්වා දීම.<br>▪ ඩිජිටල්කරණය කළ කාලසටහන් මාර්ගගතව ප්‍රකාශයට පත් කෙරෙන අතර, බස් රථ සහ දුම්රිය ස්ථාන වල ප්‍රදර්ශනය කෙරෙන කාලසටහන් අනුවම ධාවනය සිදු කිරීම.<br>▪ මගී ජනතාවට දුර ගමන් සඳහා මාර්ගගතව ආසන වෙන්කරවා ගැනීමේ අවස්ථා ලබාදීම. |
| මගී හුවමාරු නගර (Transit Cities) | ඒකාබද්ධ, කාර්යක්ෂම පොදු ප්‍රවාහනයක් සඳහා මගී හුවමාරු නගර සංවර්ධනය කිරීම | ▪ දුර බැහැර ප්‍රදේශයන්හි සිට තදාසන්න නගර දක්වා පැමිණෙන මගීන් සඳහා, බස් නැවතුම්පොළ සහ දුම්රිය ස්ථානය එකම ස්ථානයක පිහිටා ඇති මගී හුවමාරු නගර පිහිටුවීම සඳහා පහසුකම් හඳුනාගෙන සංවර්ධනය කිරීම.<br>▪ මගී හුවමාරු නගරවල සිට ප්‍රධාන නගර දක්වා කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවා ඇති කිරීම.<br>▪ මගී හුවමාරු නගරවල ආරක්ෂිතව වාහන නැවැත්වීමේ ස්ථාන සහ අවශ්‍ය අනෙකුත් පොදු පහසුකම් ඇති කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| ග්‍රාමීය ප්‍රවාහනය | ග්‍රාමීය ප්‍රදේශවල පොදු ප්‍රවාහනය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම තුළින් අන්තර්ගතික වර්ධනය (inclusive growth) සහතික කිරීම | ▪ දැනට පොදු ප්‍රවාහනය නොමැති ග්‍රාමීය ප්‍රදේශ සඳහා පොදු මගී ප්‍රවාහන සේවා හඳුන්වා දීම<br>▪ ග්‍රාමීය මාර්ගවල බස් සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ දිරිගැන්වීම් ලබා දීම<br>▪ ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදන ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු තාක්ෂණයන් සහිත ප්‍රවාහන සේවා ඇති කිරීම. |
| මාර්ග නඩත්තුව | තිරසර නඩත්තුව සහ පුළුල් වූ මාර්ග සම්බන්ධතා ජාලයක් තුළින් කාර්යක්ෂම ප්‍රවේශයක් සහ සංචලනයක් සහතික කිරීම | ▪ කඩිනමින් පිළිසකර කළ යුතු ග්‍රාමීය සහ වතු මාර්ග හඳුනා ගැනීම, ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කිරීම සහ ප්‍රමුඛතා වැඩසටහනකට අනුව මාර්ග අලුත්වැඩියා කිරීම සහ තිරසර ලෙස නඩත්තු කිරීම.<br>▪ අධිවේගී මාර්ග (E), මහාමාර්ග (A, B) සහ පළාත් මාර්ග (C, D) ඵලදායී ලෙස කාලාවර්තක නඩත්තු කිරීම (periodic maintenance)<br>▪ කඩවත සිට මීරිගම දක්වා දැනට ඇණහිට ඇති මධ්‍යම අධිවේගී මාර්ගයේ ගැටළු නිරාකරණය කිරීම සහ ඉදිකිරීම් අවසන් කිරීම. |
| පා පැදි භාවිතය දිරිමත් කිරීම | පාපැදි භාවිතයට අදාල යටිතල පහසුකම් තුළින් තිරසර නාගරික සංචලනය සහතික කිරීම | ▪ ප්‍රධාන නගර තුළ සහ අවට ප්‍රදේශවල සිට රථවාහන තදබදයක් ඇති ප්‍රධාන නගර දක්වා ආරක්ෂිත පාපැදි මංතීරු ඉදිකිරීම<br>▪ අලුතින් ඉදිකරනු ලබන මාර්ගවල හැකි සෑම අවස්ථාවකදීම පාපැදි භාවිතයට හිතකර යටිතල පහසුකම් ඇති කිරීම<br>▪ ප්‍රධාන දුම්රිය ස්ථාන, ප්‍රධාන බස් නැවතුම් හා ආයතන ඇතුළු පොදු ස්ථානවල පාපැදි නැවතුම් පහසුකම් ඇති කිරීම |
| පදික මංතීරු | පදිකයින් සඳහා පහසු පරිසරයක් සකස් කිරීම | ▪ ප්‍රධාන නගරවල මාර්ග දෙපස පදික මංතීරු ඉදිකිරීම<br>▪ පදිකයින්ට සෙවණ සැලසීම සඳහා මාර්ග දෙපස ගස් සිටුවීම |
| භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා ජල මාර්ග භාවිතා කිරීම | ප්‍රවාහනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ජල මාර්ග මගින් ලබා දීම | ▪ ප්‍රවාහනය සඳහා ජල මාර්ග භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ කිරීමට සහ උපදෙස් ලබා දීමට තාක්ෂණික ඒකකයක් පිහිටුවීම.<br>▪ ශක්‍යතා අධ්‍යයන මගින් හඳුනාගත් ජල මාර්ගවල මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| කාන්තා, වැඩිහිටි හා විශේෂ අවශ්‍යතා සහිත මගීන්ගේ ආරක්ෂාව සහ අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | සමාජයේ සෑම කෙනෙකුටම පොදු ප්‍රවාහනය ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ සුවපහසු බව සහතික කිරීම | ▪ කාන්තාවන්ගේ, වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ සුවිශේෂී ප්‍රවාහන අවශ්‍යතා පිළිබඳව ප්‍රජාව තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම<br>▪ ප්‍රවාහන සේවාවන්හිදී කාන්තාවන් මුහුණදෙන හිංසන සහ ගැටලු ක්ෂණිකව දැනුම් දීමට යෙදවුම් මෘදුකාංගයක් සහ ඒ වෙනුවෙන් ක්‍රියාත්මකවන විශේෂ ඒකකයක් ඇති කිරීම<br>▪ දුම්රිය සහ බස් රථවල විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවට සහ වැඩිහිටි පුද්ගලයින්ට විශේෂ ප්‍රවේශ පහසුකම් ඇති කිරීම<br>▪ විශේෂ අවශ්‍යතා සහිත සහ වැඩිහිටි ප්‍රජාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ භාවිතා කළ හැකි වන පරිදි දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් ස්ථාන නවීකරණය කිරීම<br>▪ පොදු ප්‍රවාහන රථවල වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවට ප්‍රමුඛතාවය ලබාදෙන ආසන වෙන්කිරීම අනිවාර්යය කිරීම |
| මාර්ග අනතුරු අවම කිරීම | වැඩිදියුණු කළ මාර්ග ආරක්ෂාව තුළින් රට පුරා ආරක්ෂිත ගමනාගමනය සහතික කිරීම | ▪ සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීමට මාර්ග යටිතල පහසුකම්වල හඳුනාගත් ගැටළු සඳහා වැඩිදියුණු කිරීම් හඳුන්වා දීම, සියලුම රියදුරන් සහ යතුරුපැදිකරුවන් වඩාත් විනයගරුක රිය පැදවීමකට යොමු කිරීම සහ මාර්ග නීති පිළිපැදීම අනිවාර්ය කිරීම<br>▪ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සහ අලුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම |
| විකල්ප මගී ප්‍රවාහන මෙහෙයුම් (Para-transit operations) | විකල්ප මගී ප්‍රවාහන සේවා (para-transit services) සඳහා නියාමනය කරන ලද පරිසරයක් සහතික කිරීම | ▪ ත්‍රිරෝද රථ සේවාව, කාර්ය මණ්ඩල ප්‍රවාහනය සහ පාසල් ප්‍රවාහන සේවා ඇතුළුව අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීම<br>▪ විකල්ප මගී ප්‍රවාහන සේවා සඳහා ඩිජිටල් ජංගම දුරකථන යෙදුමක් හඳුන්වාදීම |
| මගීන් සහ ප්‍රතිලාභීන් සංවිධානය | ප්‍රවාහන සේවා සහ එහි යටිතල පහසුකම් සංවර්ධනයේදී ජනතා කේන්ද්‍රීය තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහතික කිරීම | ▪ රජය විසින් මගී සංවිධාන අදාළ ක්ෂේත්‍රයේ මගී නියෝජිතයින් ලෙස පිළිගනිමින් ඔවුන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පාර්ශ්වකරුවන් ලෙස සහභාගී කර ගැනීම.<br>▪ මාර්ග, පාලම් වැනි ප්‍රවාහන යටිතල පහසුකම්, ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී අදාළ ප්‍රදේශයේ ජනතාව එම ක්‍රියාකාරකම් ඇගයීමට සහ විගණන කටයුතු සඳහා සක්‍රීයව සහභාගී කර ගැනීම. |

## 3.12 තිරසර සමුද්‍ර සම්පතක් - ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයෙන් පංගුවක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සමුද්‍ර සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම සඳහා ඒකාබද්ධ සාගර පාලනය
- සමුද්‍රීය පරිසරය සහ සම්පත්වල ආරක්ෂණය සඳහා වගකීම සහ වගවීම
- පොදු සාගර සම්පත් සඳහා ප්‍රවේශ වීම හෝ එම සාගර සම්පත් පුද්ගලික ප්‍රයෝජනයට යොදා ගන්නේ නම් පරිභෝජන ගාස්තු ගෙවීම මත පදනම්ව සිදු කිරීම
- සමුද්‍ර පාලන සහ පරිපාලන තීරණ ගැනීමේදී පූර්වාරක්ෂාකාරී ප්‍රවේශය
- සමුද්‍ර සහ වෙරළබඩ ප්‍රදේශ සහ ඒවායේ සම්පත් සැලසුම් කිරීම, භාවිතය සහ සංරක්ෂණය කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය
- සමුද්‍ර සම්පත්හි ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාවට වෙත බෙදී යාම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සමුද්‍රීය සැපයුම් කාර්ය සම්පාදනය | ජාත්‍යන්තර සාගර කර්මාන්තයෙහි පුළුල් වන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහළ කුසලතා සහිත හා තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම. | ▪ ප්‍රාථමික සහ වෘත්තීය නාවික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම පුළුල් කිරීම<br>▪ වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම සහ අදාළ සහතික ලබා ගැනීම පහසු කිරීම<br>▪ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) අවශ්‍යතාවය සැපිරීම සඳහා අවශ්‍ය වන විෂය නිර්දේශයන් සමාලෝචනය සහ සංශෝධනය කිරීම සඳහා ව්‍යුහගත ක්‍රියාවලියක් හඳුන්වා දීම<br>▪ අමාත්‍යාංශ විභාග අංශය, තත්ත්ව කළමනාකරණ පද්ධතියකට (QMS) අනුකූල ලෙස කටයුතු කිරීම සහතික කිරීම සඳහා තෙවන පාර්ශ්වීය ඇගයීම් කමිටුවක් පත් කිරීම<br>▪ කාර්මික පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම<br>▪ ජාත්‍යන්තර වෙළඳපොලේ නව වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම<br>▪ නාවුක සුභසාධනය සහ ආචාරධර්ම සුරැකීම සහ වැඩිදියුණු කිරීම |
| | ජාතික ආදායම සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා ගෝලීය සමුද්‍ර ව්‍යාපාර ආකර්ෂණය කර කරගැනීමට පුළුල් පහසුකම් සහිත නවීනතම වරායන් ස්ථාපිත කිරීම. | ▪ වරාය, නඩත්තු, දත්ත ගබඩා, නිෂ්පාදන ක්‍රියාවලීන්, ජාතික නැව්, යටිතල පහසුකම්, අංගන සහ ක්‍රියාකාරිත්වයන් පුළුල් කිරීම<br>▪ නාවික කාර්මික සේවා සහ නඩත්තු, මෙහෙයුම්, නියෝජිතයන්, සැපයුම් ජාල, විශේෂ තාක්ෂණික සේවා, බැංකු, නැව් ප්‍රතිචක්‍රීකරණය සහ නැව් හා වෙනත් කටයුතු සඳහා සේවා සැපයීම ආදිය වැඩිදියුණු කිරීම<br>▪ සංචාරක ක්ෂේත්‍රය සමග නාවුක ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීම<br>▪ සමුද්‍රීය ආරක්ෂාව, ඉන්ධන සහ ආහාර ඇතුළු නාවුක සේවා සපයන, සමුද්‍රීය සේවා මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම.<br>▪ ප්‍රතිනැව්ගත කිරීම, ප්‍රති පැටවීම සහ නැවෙන් නැවට නැව් භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සැපයීම සහ පර්යන්තයන්හි භාණ්ඩ රඳවාගැනීමේ කාලය අඩුකිරීම (cross-docking) සඳහා සියලු පහසුකම් සහිත කාර්යක්ෂම කලාපීය සැපයුම් කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට වරාය පහසුකම් සංවර්ධනය කිරීම.<br>▪ ශ්‍රී ලංකාව හරහා යාත්‍රා කරන නැව් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම<br>▪ නැව් සහ යාත්‍රා සකස් කිරීම සහ අලුත්වැඩියාව සඳහා තාක්ෂණය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | තිරසර පාරිසරික භාවිතයන් සහතික කරමින් ව්‍යාපාරික හිතකාමී පරිසරයක් පෝෂණය කරන ප්‍රගතිශීලී නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. | ▪ නෞකා ලියාපදිංචිය සම්බන්ධයෙන් පවතින නීති සමාලෝචනය, සංශෝධනය හා ඒ හා සම්බන්ධ වෙළඳපොළ ආකෘතීන් අනුගමනය කිරීම<br>▪ ඵලදායී සහ සුපරීක්ෂාකාරී වරාය පාලන පරීක්ෂණ (PSC) පද්ධතියක් හඳුන්වා දීම.<br>▪ ඉලක්ක පදනම් කරගත් විනිවිදභාවයෙන් යුත් වරාය පාලන පරීක්ෂණ සේවාවක් හඳුන්වා දීම.<br>▪ නාවික දූෂණය වැළැක්වීමේ ජාත්‍යන්තර සම්මුතිය (MARPOL) සහ අනෙකුත් පාරිසරික ආරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීම<br>▪ ශ්‍රී ලංකාව තුළ නාවික ආරක්ෂණය පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම |

## 3.13 ආරක්ෂිත දත්ත පද්ධතියක් - සන්නිවේදන තාක්ෂණ විප්ලවයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සියලු පුරවැසියන් සඳහා සන්නිවේදන සම්බන්ධතා
- තොරතුරු සහ දත්ත වෙත පහසු ප්‍රවේශය
- සාධාරණ මිල
- ජාතික සහ පුද්ගලික දත්ත ආරක්ෂාව
- සයිබර් ආරක්ෂාව සහ දත්ත පෞද්ගලිකත්වය
- හරිත යටිතල පහසුකම්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ICT යටිතල පහසුකම් සංවර්ධනය | අඩු වියදමකින් මහජනතාවට යටිතල පහසුකම් ප්‍රවේශය සක්‍රිය කිරීම සහතික කිරීම | ▪ යටිතල පහසුකම සහ දුරකථන ග්‍රාහක අංකය, සේවා සපයන ආයතන අතර හුවමාරු කරගත හැකි වන පරිදි ජාතික උපායමාර්යකට අනුකූළව ජාතික සන්නිවේදන ජාලය ගොඩනැංවීම සහ අන්තර්ග්‍රහණය<br>▪ සේවා සපයන්නාගේ සිට ග්‍රාකයා දක්වා සියලුම වගකීම සහ මෙහෙයුම් කටයුතු ප්‍රාදේශීය පරිපාලන ඒකක වෙතින් මහජනතාවට අන්තර්ජාලය වෙත ප්‍රවේශ විය හැකි පොදු ප්‍රවේශතා ලක්ෂ්‍ය ගණන වැඩිකිරීම<br>▪ පොදු අන්තර්ජාල ප්‍රවේශ ස්ථාන වැඩි කිරීම<br>▪ විදුලිබල මණ්ඩලයෙහි සම්ප්‍රේෂණ ජාලය සමග එක්ව මධ්‍යගත රැහැන් පද්ධතියක් (Centralized backbone network) ඉදිකිරීම සහ ග්‍රාමීය ප්‍රදේශ සඳහා සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම<br>▪ මහජන දත්ත පද්ධතිය සමඟ (CIVIC registration) දුරකථන සමාගම්හි ග්‍රාහක දත්ත පද්ධතිය එකාබද්ධ කිරීම<br>▪ E-රාජ්‍ය පද්ධතියක් සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීම සහ සියල්ල මධ්‍යගත පද්ධතියකට ගොනු කිරීම (**රැහැන් රහිත සන්නිවේදනයක් තුළින්**)<br>**රැහැන් රහිත සන්නිවේදනය** (Wireless Communication)<br>▪ 5G, LTE වැනි සංඛ්‍යාත පරාසයේ කාර්යක්ෂමතාවයන් ඇති තාක්ෂණයන් සඳහා ප්‍රමුඛතාවය<br>▪ 3G සහ CDMA වැනි තාක්ෂණයන් භාවිතයෙන් ක්‍රමානුකූලව ඉවත් වී 2G සේවා හදිසි සේවාවන් සඳහා භාවිතය |
| | ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම ශක්තිමත් කිරීම සහතික කිරීම<br>සන්නිවේදන සේවා : | **ආරක්ෂණ සංඛ්‍යාත පරාසයන්** (GUARD-BANDS)<br>▪ සේවා සපයන සමාගම් වලට ලබාදී ඇති සංඛ්‍යාත පරාසයන් නැවත සංශෝධනය කිරීම සහ සන්තතික සංඛ්‍යාත පරාසයක් සැපයීම මෙන්ම සංඛ්‍යාත පරාසයෙහි ආරක්ෂණ සංඛ්‍යාත පරාසයන් (GUARD-BANDS) අවම කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | **Public Wi-Fi** සහ රැහැන් ගත සම්බන්ධතා ප්‍රවර්ධනය<br>▪ පාසල්, විශ්ව විද්‍යාල, පුස්තකාල අධ්‍යාපන ආයතන, උද්‍යාන රාජ්‍ය කාර්යාල ඇතුළු මහජනයා ගැවසෙන ස්ථානයන්හි public Wi-Fi ස්ථාපිත කරන අතර සාධාරණ මිලකට අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීම සහ සියලුම අත්‍යාවශ්‍ය සේවාවන් සහිත IOT යෙදුම් වෙත නොමිලේ ප්‍රවේශය.<br>**විද්‍යුත් සන්නිවේදන කර්මාන්තය සඳහා වන පොදු ක්‍රියාමාර්ග**<br>▪ හදිසි සේවා, රජයේ සේවා, මහජන ආරක්ෂණ සේවා සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය වැනි අත්‍යාවශ්‍ය සේවාවන් වෙත නොමිලේ ප්‍රවේශය<br>▪ ග්‍රාමීය ප්‍රදේශ, සීමිත ආවරණ ඇති ප්‍රදේශ සහ පොදු ස්ථාන සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>▪ අධ්‍යාපන වැඩ සටහන් සහිත (IOT යෙදුම්, මාර්ගගත අධ්‍යාපන වැඩ සටහන් සහ වෙනත් අධ්‍යාපනික උපකරණ සඳහා (Documents, E-library) සෑම පුරවැසියෙකුටම නොමිලේ ප්‍රවේශය ලබාදීම<br>▪ සෑම ක්ෂේත්‍රයක් සඳහාම IOT යෙදුම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන යටිතල පහසුකම් ලබාදීම<br>▪ යටිතල පහසුකම සමාගම් අතර භුවමාරුව සහ බෙදා හැරීම, සන්නිවේදන ප්‍රමිතීන් සහ සන්නිවේදන ගාස්තු නිර්ණය කිරීමට නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම<br>**විකාශන කර්මාන්තය**<br>▪ විකාශන ජාලාවන් අංකිතකරණයට (converted into digital) ලක් කිරීම සහ ඒ සඳහා වන නවතම තාක්ෂණයන් අවශෝෂණය කර ගැනීම, ඒ හා බැඳී පවතින්නා වූ අනෙකුත් සේවාවන්ද මහජනතාවට ලබා දීම<br>▪ සන්නිවේදන කොමිෂන් සභාව (CRC-SL) යටතේ විකාශන කර්මාන්තය සඳහා නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ එක් ආයතනයක/ සමාගමක අනුබද්ධ සමාගම් ආකෘතිය යටතේ ඒ ඒ නාලිකාවන්හි අනන්‍යතාවයන් රැකෙන පරිදි රජය සතු ගුවන් විදුලි හා රූපවාහිනී ආයතන ඒකාබද්ධ කිරීම<br>▪ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (CH-01) ජාතික නාලිකාව, නේත්‍රා (CH-02) නාලිකාව සේවය මහජන සේවා විකාශනයන් (Public Services Broadcast (PSB) Domain) 368 Channel EYE (CH-03) වාණිජ නාලිකාවක් ලෙස ක්‍රියා කිරීම<br>▪ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය සහ දෙමළ සේවය මහජන සේවා විකාශයන් (Public Services Broadcast (PSB) Domain) ලෙස ක්‍රියාත්මක කරන අතර, අනෙකුත් නාලිකා වාණිජ නාලිකා ලෙස පවත්වා ගැනීම<br>▪ වාර්ෂික අයවැය මඟින් එක් එක් අමාත්‍යාංශ සඳහා වෙන් කරනු ලබන මාධ්‍ය අයවැය මහජන සේවා විකාශනයන් (Public Services Broadcast (PSB)) ලෙස ක්‍රියාත්මක ආයතනයන්ට ලබාදීම.<br>▪ තොරතුරු රසාස්වාදය සහ අධ්‍යාපනික අන්තර්ගත වැඩසටහන් විකාශනය කිරීමට අදාළ තාක්ෂණික යටිතල පහසුකම වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.<br>▪ අධ්‍යාපනික සේවා සඳහා කාර්යක්ෂම මාධ්‍ය ලෙස භූමික රූපවාහිනිය ජාලය (Terrestrial TV Network) හඳුනා ගැනීම සහ එම පහස්කම සපුරාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.<br>▪ මෙම කලාපය තුළ ක්‍රීඩා, විනෝදාස්වාද, සහ සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු ජාත්‍යන්තර උත්සව, ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවල බාහිර විකාශන ආවරණය සහ සම්ප්‍රේෂණය සිදු කරන බාහිර විකාශන ඉංජිනේරු ආයතනයක් ලෙස ජාත්‍යන්තර බාහිර විකාශන කර්මාන්තයේ තරගකාරි ලෙස කටයුතු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | **සිනමා සහ විනෝදාස්වාද කර්මාන්තය**<br>▪ ඩිජිටල් සිනමා ප්‍රක්ෂේපණයේ අවම ප්‍රමිතිය 2K ලෙස ක්‍රියාත්මක කිරීම.<br>▪ සිනමාව විනෝදාස්වාදය සහ නව මාධ්‍ය (Cinema, Entertainment Digital and New media) යන කර්මාන්ත වලට අදාළ නියාමන ආයතනයක් පිහිටුවීම.<br>▪ නවීන තාක්ෂණයෙන් පිරිපුන් චිත්‍රාගාර, පසු නිෂ්පාදන ආයතන ඉදිකිරීම සහ අනෙකුත් තාක්ෂණික අංශයන් සහ නව උපකරණ ආනයනය කිරීම සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය දිරිමත් කිරීම සහ බදු සහන සහ දිරිගැන්වීම් ලබා දීම.<br>▪ විදේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා පහසුකම් සේවා කර්මාන්තය සඳහා නව නියාමනයන් මෙන්ම ලියාපදිංචියේ සිට අනෙකුත් කාර්යන් සම්බන්ධීකරණය සහ මධ්‍යගත කරණය සඳහා වන කාර්යංශයක්.<br>▪ OTT සහ VOD සේවා වැනි IOT යෙදවුම් සහ විනෝදාස්වාද කර්මාන්තය සහ නව මාධ්‍ය (Digital and New media) සඳහා ආයෝජන දිරිමත් කිරීම. |

## 3.14 ඵලදායී කළමනාකරණය - ඒකාබද්ධ පරිහරණ සැලසුමක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ප්‍රශස්ත ඉඩම් පරිහරණය
- සංවේදී ප්‍රදේශවල ඉඩම්වල ආරක්ෂාව
- කාර්යක්ෂම හා ඵලදායී ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ඉඩම් පරිහරණය සහ ඉඩම් පරිහරණ කළමනාකරණය | සීමිත ඉඩම් සම්පත කාර්යක්ෂමව හා ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම තුළින් එහි ආර්ථික වටිනාකම සහ ප්‍රතිලාභය ඉහළ නැංවීම. | ▪ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සහ සැලැස්ම සකස් කිරීම/යාවත්කාලීන කිරීම.<br>▪ ඒකාබද්ධ ඉඩම් පරිහරණ සිතියමක් සකස් කර යාවත්කාලීන කිරීම.<br>▪ ජාතික ඉඩම් පරිහරණ සැලසුම් ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස් කිරීම.<br>▪ අවකාශීය දත්ත විශ්ලේෂණය මත පදනම්ව ඉඩම් යෝග්‍යතා සිතියමක් සකස් කිරීම.<br>▪ ඵලදායී ඉඩම් පරිපාලනයට සහ කළමනාකරණයට පහසු වන සේ ඉඩම් පිළිබඳ නව නීති රාමුවක් ස්ථාපිත කිරීම සහ ඉඩම් පනත බලාත්මක කිරීම.<br>▪ ඉඩම් පරිහරණ සැලසුම් තුළින් ආපදා අවම කිරීම, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ සහ අනුවර්තනය වීමේ යාන්ත්‍රණයන් නිසි පරිදි සහතික කිරීම.<br>▪ ඉඩම් කළමනාකරණය සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සඳහා ජාතික ඉඩම් සභාවක් ස්ථාපිත කිරීම.<br>▪ ජාතික මට්ටමේ ඉඩම් ලේඛනයක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම. |
| | ඩිජිටල්කරණය හරහා කාර්යක්ෂම හා ඵලදායී ඉඩම් පරිපාලන පද්ධතියක් ප්‍රවර්ධනය සහතික කිරීම | ▪ ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ඉඩම් කට්ටි සහ ඉඩම් වාර්තා ඩිජිටල්කරණය කිරීම.<br>▪ ඉඩම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම කිරීම.<br>▪ ඉඩම් සම්බන්ධ ගැටළු කඩිනමින් සහ සාධාරණ ලෙස විසඳීම සඳහා ක්වාසි අධිකරණ ආයතන ජාලයක් පිහිටුවීම.<br>▪ විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රමවේද මගින් ඉඩම් පරිහරණ සහ සංවර්ධන බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සරල සහ කාර්යක්ෂම කිරීම. |
| | පාරිසරික වශයෙන් සංවේදී පරිසර පද්ධති නිසි ලෙස හඳුනාගැනීම සහ ඒවා සුදුසු පරිදි ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීම | ▪ සංවේදී ප්‍රදේශයන්හි ඉඩම් ආරක්ෂා කිරීම.<br>▪ පාරිසරික හා ඓතිහාසික වශයෙන් සංවේදී ප්‍රදේශ සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ඉඩම් ලියාපදිංචිය | ඉඩම් බැහැර කිරීම සම්බන්ධව වඩාත් හොද සේවාවක් මහජනතාව වෙත ලබාදීම සඳහා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම | ▪ දීර්ඝ කාලයක් රජයේ ඉඩම්වල පදිංචිව සිටින ජනතාව වෙත ක්‍රමානුකූල ඇගයීමකින් පසු නීත්‍යානුකූල ඔප්පු ලබා දීම.<br>▪ සියලුම පළාත් පාලන ආයතන සහ ඉඩම් කළමනාකරණ ආයතන සම්බන්ධ කර ගනිමින් ඒකාබද්ධ ඉඩම් තොරතුරු පද්ධතියක් (ILII) ස්ථාපිත කිරීම.<br>▪ ඉඩම් විෂය හා සම්බන්ධ කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුත් වගවීමක් සහිත රාජ්‍ය සේවාවක් සහතික කිරීම. |
| මැනුම් සහ සිතියම්කරණය | කාර්යක්ෂම, ඵලදායී සහ තිරසර ඉඩම් කළමනාකරණය සඳහා ඉඩම් මැනුම් සහ සිතියම්කරණ සේවාවන් ශක්තිමත් කිරීම | ▪ නවීන තාක්ෂණය තුලින් ඉඩම් මැනීම සහ සිතියම් ගත කිරීමේ පාලන ජාලය පුළුල් කරිම සහ ඉඩම් මැනීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.<br>▪ මුළු රටම ආවරණය වන පරිදි LiDAR හෝ සුදුසු තාක්ෂණ යොදා ගනිමින් අත්‍යාවශ්‍ය නිවැරදි සිරස් දත්ත ලබා ගැනීම.<br>▪ සියලුම ඉඩම් මැනුම් ජාතික ජාලයට සම්බන්ධ කිරීම මඟින් ඉඩම් මැනුම්වල ඒකාබද්ධතාවයක් ඇති කිරීම.<br>▪ නවක මැනුම් උපාධිධාරීන්ගෙන් ප්‍රශස්ත සේවාවක් ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම.<br>▪ සංවර්ධන ව්‍යාපෘති වලට අවශ්‍ය නිරවද්‍ය සහ කාලීන අවකාශීය මිණුම් දත්ත ප්‍රමුඛතා පදනමින් රැස්කිරීම හා ගබඩා කිරීම.<br>▪ භූ-තොරතුරු සම්පාදනයට අවශ්‍ය අවකාශීය දත්ත යාවත්කාලීන කිරීම සඳහා නව තාක්ෂණය භාවිතා කර විශ්වාසනීය සහ නිවැරදි දත්ත මූලාශයන් සැපයීම.<br>▪ විස්තීරණ දත්ත කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා ජාතික අවකාශීය දත්ත සමෝධාන ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම. |

## 3.15 විද්‍යාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයක් - ගුණාත්මක සේවානියුක්තියක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- නිර්මාණශීලී ඉදිකිරීම් ක්ෂේත්‍රයක්
- විනිවිදභාවයෙන් යුතු සාධාරණ ප්‍රසම්පාදනය
- ඉදිකිරීම් අංශය අධීක්ෂණය, සහාය සහ නියාමනය
- ව්‍යවසායකයින් අතර සාධාරණ තරඟකාරීත්වය හා සම ප්‍රවේශය
- නවීන වාස්තු විද්‍යාත්මක දැනුම මත පදනම් වූ රැකියා සුරක්ෂිතභාවය, සාධාරණ වැටුප්, නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සහිත ගුණාත්මක සේවා නියුක්තියක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ඉහළ ගුණාත්මකභාවයෙන් තරඟකාරී ඉදිකිරීම් කර්මාන්තයක් | ඉදිකිරීම් කර්මාන්තයේ පර්යේෂණ හා සංවර්ධන හැකියාවන්, නවෝත්පාදන, තිරසරභාවය සහ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම තුළින් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම | ▪ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත විශ්ලේෂණය කර අවශ්‍යය සංශෝධන සිදු කිරීම<br>▪ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් සඳහා පුළුල් ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම<br>▪ ඉදිකිරීම් ඇපකර අරමුදල මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් පිළිගන්නා සමාගම් වෙත මූල්‍ය ඇපකර ලබා දීම<br>▪ ඉදිකිරීම් ශිල්පීන්ගේ සමාජ පිළිගැනීම හා ශිල්ප ප්‍රගුණත්වය නිර්ණය කර සහතික කරන හැඳුනුම්පතක් සෑම ඉදිකිරීම් ශිල්පියෙකුටම ලබා දීම<br>▪ ඉදිකිරීම් ආරවුල් කඩිනමින් විසඳීම සඳහා බේරුම්කරණ මධ්‍යස්ථානය සහ බේරුම්කරුවන්ගේ සංචිතය ශක්තිමත් කිරීම<br>▪ පාරිසරික අවධානම් පිළිබඳ ගැඹුරු තක්සේරුවක් සමඟ සියලු ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පාරිසරික වගවීම අනිවාර්ය කිරීම<br>▪ විශේෂිත කොන්දේසි යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට ජාත්‍යන්තර සමාගම් සහභාගී කරවා ගැනීමෙන් දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම<br>▪ ගෝලීය සංවර්ධනයන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කර්මාන්තය නවීකරණය සහ යාවත්කාලීන කිරීම සඳහා සැලසුම් සහ පිරිවිතර සකස් කිරීම<br>▪ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම<br>▪ ජාත්‍යන්තර ඉදිකිරීම් ව්‍යාපෘතිවලට ප්‍රවේශ වීම සඳහා දේශීය කර්මාන්තකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම<br>▪ දේශීය ලංසුකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම<br>▪ නව්‍ය තාක්ෂණයන් සහ අඩු පිරිවැය අමුද්‍රව්‍ය හඳුන්වා දීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයට විශේෂිත පර්යේෂණ සහ සංවර්ධන අංශයක් ස්ථාපනය කිරීම<br>▪ රට තුළ ඇති සියලුම ඉදිකිරීම් පුහුණු ආයතන සම්බන්ධීකරණය හා ඉදිකිරීම් තාක්ෂණික අධ්‍යාපනය නියාමනය කිරීම.<br>▪ ලියාපදිංචි ඉදිකිරීම් ශිල්පීන් සඳහා දීර්ඝ කාලීන රක්ෂණ සැලසුමක් සහ විශ්‍රාමික ප්‍රතිලාභ ක්‍රමයක් හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ජාතික ආපදා තත්ත්වයන් කළමනාකරණය සහ ශ්‍රම බලකාය පුහුණු කිරීමේ දී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවල සහභාගීත්වය සහතික කිරීම.<br>▪ නවීන ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයේ දැනුම ඉහළ නැංවීම.<br>▪ ඇස්තමේන්තු කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලින් පිළිබඳව රජයේ සහ පෞද්ගලික අංශයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. |

## 3.16 ශක්තිමත් සහ නව්‍ය ගුවන් සේවා අංශයක්

**ප්‍රතිපත්ති මූලධර්මයන්**

- කලාපීය සම්බන්ධතාව ශක්තිමත් කිරීම
- සංචාරක කර්මාන්තය සඳහා උත්ප්‍රේරකයක් වීම
- ආසියානු කලාපයේ ගුවන් සේවා හා නඩත්තු කේන්ද්‍රස්ථානය බවට පත් වීම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සංචාරක සංවර්ධනය සඳහා ගුවන් සේවා | බාහිර සබඳතා ශක්තිමත් කරන සහ රට ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරනු ලබන ස්ථාවර සහ තරඟකාරී ජාතික ගුවන් සේවයක් ඇති කිරීම | ▪ ජාතික ගුවන් සේවය ආරක්ෂා කිරීම සහ එහි මූල්‍ය ස්ථාවරත්වයට හානියක් නොවන පරිදි ප්‍රධාන සංචාරක ගමනාන්ත වෙත සම්බන්ධතාවය සහතික කිරීම |
| | ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් සහ අභ්‍යන්තර ගුවන් තොටුපළවල් ඇතුළු ගුවන් යටිතල පහසුකම් සංවර්ධනය හා පුළුල් කිරීම | ▪ ප්‍රධාන සංචාරක මූලාශ්‍රයන්හි සිට ශ්‍රී ලංකාව දක්වා අඩු වියදම් ගුවන් සේවා දිරිමත් කිරීම.<br>▪ රට තුළ ඌන උපයෝජිත ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම<br>▪ කලාපයේ තරඟකාරී ගුවන් තොටුපලවල ප්‍රමිතීන්ට අනුකූල වන සංචාරක හිතකාමී, ආකර්ශනීය පහසුකම් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පුළුල් කිරීම<br>▪ ඉලක්කගත සංචාරක කොටස් ආකර්ෂණය කර ගැනීම සහ පහසුකම් සැපයීම සඳහා යාපනය, හම්බන්තොට සහ මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් ආශ්‍රිත කලාපවල විශේෂිත සංචාරක කලාප පිහිටුවමින් එම ගුවන් තොටුපළවල් සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රධාන දොරටු බවට සංවර්ධනය කිරීම .<br>▪ ප්‍රධාන සංචාරක ගමනාන්ත වෙත දේශීය ගුවන් සම්බන්ධතා සහතික කිරීම සඳහා වත්මන් නියාමන සහ මෙහෙයුම් පරිසරය සමාලෝචනය කිරීම<br>▪ වැඩි වියදම් දරන සංචාරක වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වන සම්බන්ධතාවයට සහාය වීම සඳහා ප්‍රධාන විභව ප්‍රදේශවල පවතින අභ්‍යන්තර ගුවන් තොටුපළවල් සහ ජල-ගුවන් තොටුපළවල් තවදුරටත් සංවර්ධනය කිරීම.<br>▪ රට පුරා ඇති සියලුම ගුවන් තොටුපළවල් සහ ගමනාන්ත වෙත සංචාරකයින්ට බාධාවකින් තොරව ගමන් කිරීම සහතික කිරීම සඳහා මනා ගොඩබිම් ප්‍රවාහන ජාලයක් ස්ථාපිත කිරීම |
| ගුවන් සේවා | කලාපයේ ගුවන්යානා නඩත්තු, අලුත්වැඩියාව සහ ප්‍රතිසංස්කරණ කේන්ද්‍රස්ථානය (MRO) ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම | ▪ ආසියානු කලාපයේ ගුවන් සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා ගුවන් යානා සේවා සහ නඩත්තු මධ්‍යස්ථානයක් පිහිටුවීම. |

# 4 වන පරිච්ඡේදය

## 4. අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්

### හැඳින්වීම: පාලනය සහ ප්‍රතිසංස්කරණ තුළින් තිරසර අනාගතයක්

ප්‍රාජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සහ සියලු පුරවැසියන්ගේ සමානාත්මතාවය සහතික කිරීම සඳහා එක් රටක් තුළ සියලුම ජනතාවට පාලනයට සම්බන්ධ විය හැකි ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙනු ඇත.

මිලියන 1.4 ක සේවකයින්ගෙන් සමන්විත රාජ්‍ය සේවය රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන මෙවලම වන නමුත් වර්තමානයේ දී දූෂණය සහ දේශපාලන මැදිහත්වීම හේතුවෙන් මහජන අවිශ්වාසය සහ අකාර්යක්ෂමතාවය වැනි අභියෝගවලට මුහුණ දී ඇත. මහජන විශ්වාසය නැවත ඇති කිරීමට සහ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීමට රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.

අධිකරණ ක්‍රියාවලියේ ස්වාධීනත්වය සහ විනිවිදභාවය නොමැතිකම හේතුවෙන් අධිකරණ පද්ධතිය කෙරෙහි වූ මහජන විශ්වාසය නැති වී ඇත. මහජන විශ්වාසය නැවත ගොඩනැගීම, ස්වාධීනව හා කාර්යක්ෂමව යුක්තිය පසිඳලීම මගින් නීතියේ ආධිපත්‍ය නැවත ස්ථාපිත කිරීමට ඉඩ සැලසෙයි.

නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා පොලිසිය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන නමුත් බොහෝ විට එය දූෂිත හා දේශපාලනික බලපෑම් වලට ලක්ව ඇති බව පොදු මහජන මතයයි. පොලිසිය මහජනතාවට අවංකව සේවය කරන ස්වාධීන හා කාර්යක්ෂම සේවාවක් බවට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍ය වේ.

බන්ධනාගාර පද්ධතිය ද අධික තදබදය, මූලික පහසුකම් නොමැතිකම සහ රැඳවියන් අපයෝජනය වැනි ගැටලුවලට මුහුණ දී ඇත. අපරාධ කිරීමට මිනිසුන් පෙළඹීමක් නොමැති සමාජ පරිසරයක් නිර්මාණය කිරීම බලාපොරොත්තු වුවද සිරකරුවන්ගේ සුබසාධනය සහ ඔවුන් සඳහා ඵලදායී පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද දැඩි අවශ්‍යතාවයක් ද පවතී.

මත්ද්‍රව්‍ය භාවිතය සැලකිය යුතු සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති අතර, මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන් කිරීමට රජයේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එහි තත්ත්වය තවදුරටත් අයහපත් වී ඇත. සිරගත කිරීම පිළිබඳ පමණක් අවධානය යොමු කිරීමට වඩා මත්ද්‍රව්‍ය නිවාරණය සහ පුනරුත්ථාපනය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික පිහිටීම ආර්ථික වර්ධනයට සහ රාජ්‍ය තාන්ත්‍රික නායකත්වයට අවස්ථා උදා කර ඇති නමුත් බාහිර සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය බොහෝවිට බලපෑමට ලක්වේ. ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කලාපීය බලපෑම් මධ්‍යයේ වුවද, ජාතික අවශ්‍යතා මත පදනම් වූ ශ්‍රී ලාංකීය විදේශ ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

ස්වාධීන හා සමතුලිත රාජ්‍ය තාන්ත්‍රිකභාවය, ප්‍රජාතන්ත්‍රවාදී විධිමත් පාලනය, සමානාත්මතාවය සහ සමගිය සමඟ පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා කැප වූ වෘත්තීය හමුදාවක් සිටීම මත ජාතික ආරක්ෂාව පදනම වේ. එසේම, නීතිය ක්‍රියාත්මක කරනු ලබන විවිධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම තුළින් අභ්‍යන්තර ආරක්ෂාව සහතික කර ගැනීම අවශ්‍ය වේ.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

සියලු පුරවැසියන් සඳහා තිරසර අනාගතයක් ගොඩනැගීම සඳහා අතීතයෙන් උගත් පාඩම් පාදක කර ගනිමින්, එක්සත් ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් සහතික කිරීම.

## 4.1. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් - ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක්

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ප්‍රජාතන්ත්‍රවාදී විධිමත් පාලනය | ආන්තික කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා නෛතික සහ ආයතනික රාමුව ශක්තිමත් කිරීම | • සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සඳහන් අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගෙන බලාත්මක කිරීම.<br>• ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව ළමුන්, කාන්තාවන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව්‍යවස්ථාමය නීතිය පුළුල් කිරීම. |
| | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා මැතිවරණ ප්‍රතිසංස්කරණ තුළින් එක්සත් සමාජයක් ගොඩනැංවීම. | • එක් රටක් තුළ සියළු ජනතාවට පාලනයට සම්බන්ධ විය හැකි පරිදි සෑම පළාත් පාලන, දිස්ත්‍රික් සහ පළාතකටම දේශපාලන හා පරිපාලන බලය බෙදා හැරෙන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන සහ සියලු පුරවැසියන්ගේ සමානාත්මතාවය සහතික කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම.<br>• විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තුව ස්ථාපිත කිරීම සහ විධායක බලතල නොමැති ජනාධිපතිවරයෙකු පත් කිරීම.<br>• නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම.<br>• ජනාධිපති නිල නිවාස එකකට සීමා කිරීම.<br>• විශ්‍රාමික ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබාදී ඇති විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම.<br>• විද්‍යාත්මක පදනමකින් ස්ථාපිත කර ඇති අමාත්‍යාංශ 25කට අමාත්‍යවරුන් 25ක් සහ ඊට අනුරූප නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම සහ රාජ්‍ය අමාත්‍ය ධූර අහෝසි කිරීම.<br>• සෑම අමාත්‍යාංශයකටම අදාළ විෂය පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක සභාවක් පත් කිරීම.<br>• පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ ඇමතිවරුන්ට, ඔවුන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් පත් කිරීමට ඉඩ නොදීම ඇතුළු ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | • පාර්ලිමේන්තු සැසිවාරවලට සහභාගි වීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති දීමනා අහෝසි කිරීම.<br>• පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05කට පසු ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම.<br>• මන්ත්‍රීවරුන් හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් රජය සමඟ සෘජුව හෝ වක්‍රව ව්‍යාපාරවල හෝ කොන්ත්‍රාත්තුවල යෙදීම වැළැක්වීම.<br>• පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන බදු රහිත වාහන බලපත්‍ර ඉවත් කිරීම.<br>• අමාත්‍යවරුන්ට / නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ඔවුන්ගේ නිල කාලය තුළ භාවිත කිරීමට එක් වාහනයක් පමණක් ලබාදීම.<br>• සිය වගකීම ඉටුනොකරන්නේ නම් හෝ දූෂණයේ යෙදෙන්නේ නම් මහජන නියෝජිතයා ආපසු කැඳවීමේ බලය ඡන්ද දායකයාට ලැබෙන විධිවිධාන හඳුන්වා දීම.<br>• ජාතිකත්වය අතර අසමගිය හා ආගමික වෛරය ඇති නොකරන ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් කරුණු මත වෙනස් කොට නොසැලකීම යන කොන්දේසි වලට යටත්ව භාෂණයේ නිදහස තහවුරු කිරීම.<br>• රට තුළ සහ ඉන් පිටත සංක්‍රමණිකයන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම. |

## 4.2 කාර්යක්ෂම රාජ්‍ය සේවයක් - කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම
- කුසලතා මත පත්වීම් සහ උසස්වීම්
- කාර්යක්ෂමතාව සහ විධිමත් ක්‍රියාවලි
- සදාචාරාත්මක හැසිරීම සහ අඛණ්ඩතාව
- දියුණු තාක්ෂණය භාවිත කිරීම
- ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය
- සහයෝගීතාවය
- මහජන සහභාගීත්වය, දැනුවත් කිරීම සහ නිපුණතාවය
- කිසිවකු අත් නොහැරීම සහතික කිරීම
- වෙනස්කොට නොසැලකීම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සැපයීම | රාජ්‍ය සම්පත් උපරිම ලෙස භාවිතයට ගනිමින් ඩිජිටල් රාජ්‍ය සේවාවක් සැපයීම සහතික කිරීම | ▪ සේවා ව්‍යවස්ථාවන්හි පවතින ගැටළු නිරාකරණය කිරීම සහ ඒවා සංශෝධනය කිරීම<br>▪ බිම් මට්ටමේ සිට හඳුනාගත් සමාජ-ආර්ථික ගැටළු සහ අවශ්‍යතාවයන් වලට විසඳුම් ලබා දීම සඳහා ජාතික සංවර්ධන වැඩ පිළිබඳ මත පදනම්ව අව්‍යශ අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම<br>▪ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනවල විෂය ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ<br>▪ තාර්කික පදනමක් මත ඒවා නව අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම සහ සමාජ-ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී ඉහළ කාර්යක්ෂමතාවයක් පවත්වා ගැනීම සඳහා මෙම ආයතන අතර සිරස් සහ තිරස් සම්බන්ධතා ගොඩනගා ගැනීම<br>▪ අවශ්‍යතාවය අනුව නව ආයතන පිහිටුවීම, සමාන විෂය පථයන් සහිත ආයතන තාර්කානුකූල පදනමක් මත ඒකාබද්ධ කිරීම සහ අනවශ්‍ය ආයතන අහෝසි කිරීම<br>▪ ඩිජිටල්කරණය, කාර්ය සාධන කළමනාකරණය, සහ පුරවැසි සහභාගීත්වය යන සංකල්ප සැලකිල්ලට ගනිමින් පවතින රාජ්‍ය කළමනාකරණ ක්‍රියාවලීන් නව රාජ්‍ය කළමනාකරණ පද්ධති වෙත පරිවර්තනය කිරීම<br>▪ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ජනප්‍රිය විකල්පය වන සේවක කප්පාදු කිරීම වෙනුවට, නව සමාජ ආර්ථික ඉලක්කයන් සපුරා ගැනීමේ අරමුණ සහිතව සේවකයින් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ සුදුසුකම් වැනි තොරතුරු හඳුනා ගැනීම සඳහා කඩිනම් සංගණනයක් පැවැත්වීම<br>▪ දෙපාර්තමේන්තු සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය ඉලක්ක කරා ළඟා වන බව සහතික කිරීම සඳහා කාර්ය සාධන කළමනාකරණ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම<br>▪ ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් එකම වහලක් යටින් සංකල්පය මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල බහු සේවා සපයන මධ්‍යස්ථාන ලෙස ස්ථාපිත කිරීම<br>▪ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සක්‍රීයව සහ නිෂ්ක්‍රීයව සිදුවන මහජන මුදල් නාස්තිය වැළැක්වීම, කාර්යක්ෂම, යහපත් හැසිරීම් සහ දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් සැපයීම සම්බන්ධයෙන් නිලධාරීන් ඇගයීම සඳහා මහජන ප්‍රතිචාර ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>▪ රාජ්‍ය සම්පත් නිසියාකාරව සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම<br>▪ රාජ්‍ය සම්පත් නාස්තිය වැළැක්වීම සඳහා රාජ්‍ය ආයතන දිරිමත් කිරීම සහ ඒවා මැනීමට පරිමාණයන් හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ප්‍රසම්පාදනය, මූල්‍යකරණය, විගණනය, සැලසුම්කරණය සහ පරිපාලනය ඇතුළුව, රාජ්‍ය සේවයේ අභ්‍යන්තර ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් මෙවලම් සකස් කිරීම.<br>▪ රාජ්‍ය සේවයේ සියලුම වර්ගවල සේවාවන් සඳහා නිලධාරීන් බඳවා ගැනීම සහ උසස්වීම් සඳහා අවශ්‍යවන නීති රීති නිශ්චිත කාල රාමුවක් තුළ සංශෝධනය කිරීම.<br>▪ රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී සහය දැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් සතුව තිබිය යුතු හැකියාවන් වර්ධනය කිරීමටත්, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීමටත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) හි ධාරිතාවය ඉහළ දමමින් ප්‍රතිව්‍යුහගත කිරීම. |

## 4.3 නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සාධාරණව හා සමානව නීතියේ රැකවරණය
- ස්වාධීනත්වය හා ජනතා විශ්වාසය
- විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම | අධිකරණ පද්ධතිය පුළුල් කිරීම තුළින් නිසි වේලාවට සාධාරණ විනිශ්චයක් ලබාදීම සහතික කිරීම | ▪ නීති විශේෂඥ කමිටුවක් මඟින් පවතින නීති සමාලෝචනය කොට අවශ්‍ය නීති යාවත්කාලීන කිරීමට නීති විශාරදයන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම.<br>▪ අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වා දීම හා විනිසුරුවරුන්ට සහ කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමට පියවර ගනිමින් අධිකරණ ක්‍රියාවලිය වඩාත් සුමට හා කාර්යක්ෂම කිරීම.<br>▪ සුහුරු අධිකරණ ශාලා (Smart Court Houses) පිහිටුවීමට පියවර ගැනීම සහ අධිකරණ වාර්තාවල මෘදු පිටපත් (Soft copies) පවත්වාගෙන යාම.<br>▪ නිවැරදි, පැහැදිලි සහ කඩිනම් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණ සහ මුල් අවස්ථා අධිකරණවල විනිශ්චකාරවරුන්ට සහාය වීමට පර්යේෂණ නිලධාරීන් පත් කිරීම.<br>▪ දකුණු ආසියානු කලාපයේ ජාත්‍යන්තර වාණිජ ගනුදෙනු පදනම් කරගෙන පැන නගින ගැටලු බේරුම්කරණය සහ සමථකරණය කිරීම සඳහා ජාත්‍යන්තර බේරුම්කරණ සහ සමථකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>▪ අපරාධමය නීතිය හා බැඳුණු නඩු භාණ්ඩ ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>▪ දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබාගන්නා නඩු භාණ්ඩ ඒවායේ වටිනාකම් ක්ෂයවීමට පෙර අදාළ පාර්ශව වෙත මුදාහැරීමේ හෝ රාජසන්තක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා නව නීති හඳුන්වා දීම.<br>▪ ඇප නීතියේ සහ ඇප දීමේ ක්‍රියාවලියේ වත්මන් ගැටළු සොයා බලා ඇප සම්බන්ධ නීති යාවත්කාලීන කිරීම.<br>▪ බාලවයස්කාර දරුවන්ට සහ කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලද ලිංගික අපරාධ සම්බන්ධ නඩු විභාග කිරීම හා වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම සඳහා ප්‍රමුඛත්වය දීම සහ කඩිනම් කිරීම වෙනුවෙන් යාන්ත්‍රණයක් හඳුන්වා දීම.<br>▪ අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පළාත්බදව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශාඛා පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| අල්ලස හා දූෂණ | අල්ලස හා දූෂණය තුරන් කිරීම | ▪ සොරාගත් රාජ්‍ය වත්කම් නැවත අයකරගැනීම සඳහා, සොරකම් කරන ලද වත්කම් ප්‍රතිෂ්ඨාපනය (STAR) සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) ආදී ජාත්‍යන්තර ආයතනවල තාක්ෂණික සහ උපදේශන සේවාවන් ලබා ගනිමින් රජයේ වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනයක් පිහිටුවීම.<br>▪ 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 34 වන වගන්තිය අනුව සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධීකරණයට හා දූෂණය වැළැක්වීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් බලාත්මක කිරීමට, අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට අවශ්‍ය බලතල සහිතව පහසුකම් සැලසීම.<br>▪ මූල්‍ය අපරාධ, අල්ලස් හෝ දූෂණ චෝදනා නඩු කාර්යක්ෂම කිරීම සඳහා ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් පත් කිරීම.<br>▪ සෑම දිස්ත්‍රික්කයම දූෂණ විරෝධී කොමිසමේ කාර්යාලයක් පිහිටුවීම.<br>▪ දූෂණ විරෝධී කොමිසම වෙත ලැබෙන පැමිණිලි මාස හයක් ඇතුළත විමර්ශනය කිරීම හෝ එසේ නොකරන ලද පැමිණිලි පිළිබඳ වාර්තාවක් සෑම මාස හයකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br>▪ රාජ්‍ය මූල්‍ය දූෂණ චෝදනාවලට ලක්වූවන්ට රැකවරණය ලබාදෙන්නන් අදාළ වරදට සම්බන්ධ අයවලුන් ලෙස සලකා නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා අවශ්‍ය නීති සකස් කිරීම.<br>▪ මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම<br>▪ දූෂණ, වංචා, අල්ලස් වැනි දෑ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට හා ඒවාට එරෙහිව මහජනතාව බලගැන්වීමේ ව්‍යාපාරයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ස්ථාපිත කිරීම.<br>▪ අල්ලස් කොමිසම හා නීතිපති මගින් ඉල්ලා අස්කර ගන්නා ලද නඩු නැවත සමාලෝචනයට ලක්කර සුදුසු නඩුකර නැවත පැවරීමට කටයුතු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| නීතිපති දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම | ▪ අධිකරණ පද්ධතිය තුළ සිදුවන ප්‍රමාදයන් තුරන් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ස්වාධීන වූ රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාලයක් (Directorate of Public Prosecution) සහ පළාත්බද උප කාර්යාල පිහිටුවීම.<br>▪ නීතිපති දෙපාර්තමේන්තුව මගින් අනුගමනය කළ යුතු නඩු පැවරීමේ ක්‍රියාපටිපාටි (Prosecution Guidelines) ලේඛන ගත කිරීම.<br>▪ විමර්ශන ක්‍රියාවලියෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු නොපැවරීමට කටයුතු කරන්නේනම් ඊට හේතු අතෘප්තියට පත් පාර්ශව වෙත දැනුම් දීම.<br>▪ නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අගතියට පත්වන පාර්ශවයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කිරීම.<br>▪ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල පිහිටුවීම. |

## 4.4 මිත්‍රශීලි පොලිස් සේවාවක් - තෘප්තිමත් වෘත්තීයභාවයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- ස්වාධීනත්වය
- කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාව
- වෘත්තීය නිපුණතාව

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| පොලිස් සේවය | වෘත්තීයභාවය සහ වගවීම ශක්තිමත් කිරීම තුළින් විනිවිදභාවයෙන් යුත්, කාර්යක්ෂම සහ විශ්වාසනීය සේවාවක් නිර්මාණය කිරීම | ▪ පොලිසිය සහ මහජනතාව අතර සමීප හා විධිමත් සබඳතාවයක් ඇති කිරීම සඳහා “පොලිස් මහජන සම්බන්ධතා කමිටු” හඳුන්වාදීම.<br>▪ පොලිස් අත්අඩංගුවට ගැනීමෙන් පැය 24ක් ඇතුළත සැකකරුගේ භාරකරුවන්ට හෝ ළඟම ඥාතීන්ට දැනුම් දීම.<br>▪ කිසියම් විමර්ශනයක් සඳහා පොලිස් ස්ථානයකින් සැකකරුවෙකු පිටතට රැගෙන යන්නේ නම් මහේස්ත්‍රාත්වරයා දැනුවත් කිරීම සහ සැකකරුගේ ජීවිතය ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම.<br>▪ සියලුම පැමිණිලි පරිගණක ගත කිරීමට සහ e- පොලිස් වාර්තා ලබා දීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.<br>▪ පොලිසියට ලැබෙන සියලුම පැමිණිලි කඩිනමින් විමර්ශනය කර අවසන් කිරීම සහ එසේ කළ නොහැකි අවස්ථාවලදී පොලිස් කොමිසමට වාර්තා කිරීම.<br>▪ අපරාධ විමර්ශනය සඳහා විද්‍යාත්මක පුහුණුව, නව තාක්ෂණික මෙවලම් සහ තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම.<br>▪ පොලිස් සේවයේ සියලුම පත්වීම්, උසස්වීම් සහ ස්ථාන මාරුකිරීම් දේශපාලනීකරණයෙන් තොරව සිදුකිරීමට පොලිස් කොමිසම බල ගැන්වීම<br>▪ පොලිස් කොස්තාපල් ධූරයේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක ධූරය දක්වා කරනු ලබන උසස් කිරීම් සම්බන්ධයෙන් වන විධිමත් උසස් කිරීම් කාර්ය පටිපාටියක් හඳුන්වාදීම<br>▪ පොලිස් සැරයන් සිට සහකාර පොලිස් අධිකාරී දක්වා කෙරෙන උසස් කිරීම් නිර්දේශපාලනිකව, කුසලතා සහ කාර්ය සාධනය මත පමණක් සිදු කිරීම.<br>▪ පොලිස් සේවය වෘත්තීය පොලිස් සේවාවක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීම හා අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය, පොලිස් මහජන සම්බන්ධතාවයන්, උපදේශනය සහ මනෝවිද්‍යාව වැනි ක්ෂේත්‍ර පිළිබඳව උපාධි පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථා සැලසීම.<br>▪ දක්ෂ පොලිස් නිලධාරීන් සඳහා ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම හා ඔවුන්ට විදේශ පුහුණු ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇගයීමට ලක් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ නිවසක හිමිකමක් නොමැති පොලිස් නිලධාරීන්ට නිවාස ලබාදීමේ වැඩසටහනක් හඳුන්වාදීම.<br>▪ අනෙකුත් රාජ්‍ය සේවකයන්ට සමානුපාතිකව පොලිස් සේවයේ වැටුප් හා දීමනා ඉහළ නැංවීම.<br>▪ අල්ලස, දූෂණය හා වංචාවෙන් තොර පොලිස් සේවයක් සඳහා විශේෂ විමර්ශන ඒකකය වඩාත් ශක්තිමත් කිරීම. |
| සැමට යුක්තිය | දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳුණු අපරාධ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම | ▪ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවලින් වරදකරුවන් වූ දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.<br>▪ 2019.04.21 දින සිදුවූ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශවලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට එරෙහිව කඩිනම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.<br>▪ දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳුණු දේශපාලන ඝාතන, මාධ්‍යවේදීන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ වෙනත් අය පැහැරගෙන යාම පිළිබඳ විමර්ශන කඩිනමින් අවසන් කර අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම.<br>▪ දේශපාලන බලපෑම්මත තර්ජනයට ලක්ව රට හැරගිය මාධ්‍යවේදීන්, ආරක්ෂක අංශ නිලධාරීන් ඇතුලු අනෙකුත් පුද්ගලයන්ට යුක්තිය ඉටුකිරීම. |

## 4.5. මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- භාරකාරත්වය සහ රැකවරණය
- පුනරුත්ථාපනය සහ සමාජගත කිරීම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| බන්ධනාගාර අංශය | සිරකරුවන්ගේ පුනරුත්ථාපනය සහ සුබසාධනය වැඩි දියුණු කිරීම හරහා ගුණාත්මක ජීවන තත්ත්වයන් සහතික කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීම | ▪ බන්ධනාගාර තුළ සිදුවන සියලු ආකාරයේ හිංසනයන් වැළැක්වීම<br>▪ රැඳවියන්ගේ ස්වභාවය, මානසික මට්ටම හා අනෙකුත් ගති ලක්ෂණ පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් කොට ඒ අනුව රැඳවියන් කාණ්ඩ ගත කොට රඳවා තැබීම<br>▪ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි බන්ධනාගාර වල තුළ විශේෂ පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් පුළුල් කිරීම<br>▪ රැඳවියන්ට ලබා දෙන ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම<br>▪ සුළු වැරදි වලට දඬුවම් ලබන පුද්ගලයන් බන්ධනාගාර ගත කිරීමකින් තොරව ප්‍රජා වැඩසටහන් සඳහා යොමු කිරීම<br>▪ රැඳවියන් ප්‍රතිශෝධනය කිරීම සඳහා වෘත්තීය උපදේශන සේවාවක් ආරම්භ කිරීම<br>▪ රැඳවියන්ගේ ශාරීරික සෞඛ්‍යය පවත්වාගෙන යාම සඳහා විධිමත් අභ්‍යාස වැඩසටහන් හඳුන්වා දීම<br>▪ දීර්ඝ කාලීනව සිරදඬුවම් විඳින සිරකරුවන් විවිධ නිෂ්පාදන සහ සේවා සඳහා යොදා ගැනීමේ වැඩසටහන් හඳුන්වා දීම<br>▪ යහපත් කල් ක්‍රියාවෙන් යුත් සිරකරුවන් එළිමහන් සිරකඳවුරුවල රඳවා තැබීම හා / හෝ විධිමත් අධීක්ෂණය යටතේ නිවෙස් වෙත යැවීම සඳහා වූ ක්‍රමවේදය විධිමත් කිරීම<br>▪ සෑම බන්ධනාගාරයකටම අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පාඨමාලා ලබාදීම<br>▪ රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම වැළැක්වීම සඳහා අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ අදාළ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම<br>▪ කාන්තා රැඳවියන්ගේ සුබසාධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහ බන්ධනාගාර තුළ ඔවුන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් වැළැක්වීම<br>▪ කාන්තා රැඳවියන් සමඟ බන්ධනාගාරවල ජීවත් වන ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපන, සෞඛ්‍ය සහ වෙනත් සේවාවන් පුළුල් කිරීම |

## 4.6. මතින් තොර රටක් - නීරෝගී පුරවැසි ජීවිතයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- මත්ද්‍රව්‍ය වැළැක්වීම
- මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කිරීම

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| මත්ද්‍රව්‍ය වැළැක්වීම | සුදුසු නියාමන සහ ආයතනික ප්‍රතිසංස්කරණ හරහා මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම | ▪ රට තුළ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම<br>▪ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වෙනම කාර්යාංශයක් පිහිටුවීම<br>▪ නාවික සහ ගුවන් නිරීක්ෂණ පහසුකම් සංවර්ධනය, නවීන උපකරණ සැපයීම සහ නිලධාරීන් පුහුණු කිරීම මඟින් මත්ද්‍රව්‍ය රට තුළට පැමිණීම වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා නිලධාරීන්ට පුහුණු කිරීම<br>▪ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදා ගැනීම සඳහා පුනරුත්ථාපන වැඩසටහන් විධිමත් කිරීම<br>▪ මත්ද්‍රව්‍ය වැරදි සඳහා දඬුවම් ශක්තිමත් කිරීම සහ නඩු කඩිනමින් විසඳීමට පියවර ගැනීම<br>▪ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා අඛණ්ඩ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>▪ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ කාර්යයන් පුළුල් කිරීම සහ මත්ද්‍රව්‍යවලට එරෙහි ව කටයුතු කරන පුද්ගලයින් අධීක්ෂණය සඳහා කමිටු පිහිටුවීම<br>▪ මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර බලපෑම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම |
| මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම | | |

## 4.7 උදාර රාජ්‍යතාන්ත්‍රිකත්වයක් - ස්වෛරී රාජ්‍යයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සහ එහි ප්‍රතිපත්තීන් සහ එක්සත් ජාතීන්ගේ ආයතන පද්ධතියට අනුකූල වීම.
- ජාත්‍යන්තර සහ කලාපීය සාමය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම.
- ස්වෛරීත්වය සහ භෞමික අඛණ්ඩතාව පිළිබඳ අන්‍යෝන්‍ය ගෞරවය, ආක්‍රමණශීලී නොවන බව, රාජ්‍යවල සමානාත්මතාවය, අන්‍යෝන්‍ය වර්ධනය සහ අන්‍යෝන්‍ය ගෞරවය සහ එකිනෙකාගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම මත ගොඩනැගෙන සාමකාමී සහජීවනය.
- ගෝලීය ගැටලු කළමනාකරණය සහ විසඳීමේ උසස් රාජ්‍ය තාන්ත්‍රිකභාවය.
- රාජ්‍යයෙන් රාජ්‍යයට සහ ජනතාවගෙන් ජනතාවට රාජ්‍යතාන්ත්‍රිකභාවය මගින් කලාපීය සහ ගෝලීය ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| නොබැඳි සහ සමබර රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තිය | ගතික විදේශ ප්‍රතිපත්තියක් තුළින් ශ්‍රී ලංකාවේ ගෝලීය පැවැත්ම සහ රාජ්‍ය තාන්ත්‍රික සඵලදායිතාවය වැඩි දියුණු කිරීම. | ▪ උපායමාර්ගික ප්‍රමුඛතා, ඉලක්ක සහ විදේශයන්හි ශ්‍රී ලංකා නියෝජිතයින්ගේ අපේක්ෂිත හැසිරීම් විස්තර කෙරෙන හා පැහැදිලි මාර්ගෝපදේශ සහිත සවිස්තරාත්මක විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීම<br>▪ ගෝලීය වෙනස්කම් අනුව සුදුසු පරිදි යොදා ගැනීම සඳහා කාලීනව එම ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.<br>▪ සවිස්තරාත්මක විශ්ලේෂණයකින් පසු නව විදේශ ප්‍රතිපත්තියේ අරමුණු සපුරාලීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගත කිරීම<br>▪ ශ්‍රී ලංකා විදේශ සේවය (SLFS) කෙරෙහි යොමු ගත කළ සහ සම්බන්ධීකරණය කරන ලද මාර්ගෝපදේශයක් හඳුන්වාදීම.<br>▪ රටේ ආර්ථික හැකියාවට ශක්තිමත් දායකත්වය ලැබෙන පරිදි, ශ්‍රී ලංකාව සිය දූත මණ්ඩල විවෘත කළ යුතු ආර්ථික වශයෙන් වර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවල් සහිත කලාප ඇගයීමට ලක් කිරීම |
| රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල | ගෝලීය නියැලීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායී බව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික ජාලය ප්‍රශස්ත කිරීම | ▪ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල තාර්කිකකරණය සහ නිවැරදි කාර්ය මණ්ඩල ප්‍රමාණය සමාලෝචනය කිරීම.<br>▪ වෙළඳාම වැඩිදියුණු කිරීම, සංචාරක ප්‍රවර්ධනය, වෘත්තීය සහ වෘත්තීය කුසලතා පුහුණුව සහ රැකියා අවස්ථා යනාදිය සමඟ සමපාත වන පරිදි එක් එක් තානාපති කාර්යාල සඳහා කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම.<br>▪ ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානින් ලෙස ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත වෘත්තීය රාජ්‍යතාන්ත්‍රිකයින් පත් කිරීම.<br>▪ විදේශ සේවය සඳහා වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ රාජතාන්ත්‍රික විචක්ෂණ බුද්ධිය සහිත සුදුසුකම්ලත් නිලධාරීන් පත් කිරීම<br>▪ ආචාරධර්ම පද්ධතිය: අවංකභාවය, වෘත්තීයභාවය සහ වගවීම අවධාරණය කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පැහැදිලි ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම.<br>▪ විදේශ සේවය දේශපාලනීකරණයෙන් ඉවත් කර කුසලතා මත පත්වීම් ලබාදීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ආයතනික ප්‍රතිසංස්කරණ හා මධ්‍යගත අධීක්ෂණය | ප්‍රතිචාර දැක්වීම, වගවීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික රාමුව සවිබල ගැන්වීම සහ නවීකරණය කිරීම | ▪ රාජ්‍යතාන්ත්‍රික මුලපිරීම් විමධ්‍යගත කිරීම - ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව රාජ්‍ය තාන්ත්‍රික කටයුතු මෙහෙයවීම සඳහා තානාපති කාර්යාල බල ගැන්වීම සහ නිරන්තර අධීක්ෂණය තුළින් වගවීම සහතික කිරීම.<br>▪ විධිමත් ක්‍රියාවලි:- පුරවැසියාගේ සහ රාජ්‍යයේ අවශ්‍යතාවලට අනුව වඩාත් කාර්යක්ෂම හා ප්‍රතිචාරාත්මක වීම සඳහා, රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලින් සරල කිරීම සහ විධිමත් කිරීම.<br>▪ මානව සම්පත් (සියලුම කාණ්ඩ සඳහා) සහ භෞතික වත්කම් පිළිබඳ දත්ත පද්ධතියක් ඇති කිරීම.<br>▪ රාජ්‍යතාන්ත්‍රික පුහුණු කිරීම් ආයතනය සහ ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKI) ප්‍රතිව්‍යුහගත කිරීම සහ ශක්තිමත් කිරීම. |
| රාජ්‍යතාන්ත්‍රික පුහුණුව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම: | විස්තීර්ණ, කලාපීය විශේෂිත පුහුණු වැඩසටහන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ධාරිතාව වැඩි දියුණු කිරීම. | ▪ වැඩිදියුණු කළ පුහුණු වැඩසටහන්: සාකච්ඡා සහ සංසන්ධි කතිකා (Negotiations) කුසලතා, සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ විවිධ කලාපවල දූත මණ්ඩල මුහුණ දෙන විශේෂිත අභියෝගවලට විසඳුම් සෙවීමට ඒ සඳහාම සකසන ලද පුහුණු සැසි හඳුන්වාදීම.<br>▪ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය: රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා අඛණ්ඩ ඉගෙනීම සහ වෘත්තීය සංවර්ධනය හඳුන්වාදීම. |
| ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවා කාර්යක්ෂමතාව | ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික සේවය තුළ වගවීම, අඛණ්ඩතාව, විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම | ▪ මධ්‍යගත අධීක්ෂණය සහ ඇගයීම: ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා ඔවුන්ගේ කටයුතු ජාතික විදේශ ප්‍රතිපත්ති අරමුණු සමඟ පෙළගැස්වීම තක්සේරු කිරීම සඳහා නිතිපතා සමාලෝචන පැවැත්වීම.<br>▪ ප්‍රමිතිගත වාර්තාකරණය: දූත මණ්ඩල විසින් ඔවුන්ගේ ක්‍රියාකාරකම්, අභියෝග සහ ජයග්‍රහණ පිළිබඳව විදේශ අමාත්‍යාංශය නිතිපතා යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන පරිදි ප්‍රමිතිගත වාර්තාකරන ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ සේවා සඳහා ගතවන කාලය අඩු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සපයන e - සේවා වැඩි කිරීම.<br>▪ ජනහිතකාමී ආකල්පයකින් ශ්‍රී ලාංකේය ඩයස්පෝරාව වෙත අවම වියදමකින් ඉහළ ගුණාත්මක සේවාවක් සැපයීම.<br>▪ ජාතික ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් විදේශිකයින් ශ්‍රී ලංකාවට පැමිණීම දිරිමත් කිරීමට කාර්යක්ෂමව සේවා සැපයීම.<br>▪ කාර්යක්ෂම ලෙස සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය අරමුදල්, තාක්ෂණය සහ තාක්ෂණික දැනුවත්භාවය ලබා දීම. |
| දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකත්වය | සැවොම ඇතුළත් වූ ගෝලීය පාලනය ප්‍රවර්ධනය කිරීම, බහුපාර්ශ්විකත්වයට සහාය දීම සහ ශ්‍රී ලංකාවේ වටිනාකම් ප්‍රවර්ධනය කිරීම තුළින් ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාවේ පැවැත්ම සහ බලපෑම සහතික කිරීම | ▪ සවිස්තරාත්මක අධ්‍යයනයක නිර්දේශ අනුව, විදේශ දූත මණ්ඩලවල තත්ත්වය උසස් කිරීම සහ නව තානාපති කාර්යාල විවෘත කිරීම.<br>▪ G20 රටවල්, BRICS+ රටවල්, ASEAN රටවල්, දකුණු ආසියාතික, මැදපෙරදිග සහ අප්‍රිකානු මහාද්වීපය සමඟ රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික සහ සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛත්වය දීම.<br>▪ සියලුම රාජ්‍යයන් සඳහා ඔවුන්ගේ ප්‍රමාණය සහ සංවර්ධන තත්ත්වය නොසලකා ගෝලීය තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඇති අයිතිය පිළිගැනීම.<br>▪ සියලුම රාජ්‍යයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන විවෘත, සැවොම ඇතුළත් වූ සහ සමෘද්ධිමත් දකුණු ආසියානු කලාපයක් ප්‍රවර්ධනය කිරීම.<br>▪ දකුණු ආසියාවේ සහ ඒ අවට ආරක්ෂිත සහ සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාම.<br>▪ එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ කලාපීය ආර්ථික කොමිෂන් සභා ඇතුළු එහි අනුබද්ධ ආයතන හරහා බහුපාර්ශ්විකත්වයට සහාය වීම.<br>▪ විශේෂයෙන්ම ආර්ථික ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට සහාය විය හැකි නව අවස්ථා සහ නව ගෝලීය සහ කලාපීය අවකාශයන් ගවේෂණය කිරීම.<br>▪ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය සහ දේශගුණික යුක්තිය වැනි සාරධර්ම තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය | ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීමෙන් ශ්‍රී ලංකාව ගෝලීය ආර්ථිකයේ ප්‍රමුඛස්ථානයේ තැබීම | ▪ ජාත්‍යන්තර ආර්ථිකය සමඟ සම්බන්ධ වීම හා ආර්ථික සමෘද්ධිමත්භාවය සහ ආරක්ෂාව සැපයීම සඳහා දේශීය ආර්ථිකය ස්ථානගත කිරීම.<br>▪ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා සෘජු විදේශ ආයෝජන (FDI), මූල්‍යාධාර සහ තාක්ෂණ හුවමාරුව ලබා ගැනීමේ අරමුණින් විදේශීය හවුල්කරුවන් සමඟ සම්බන්ධවීම හා සෘජු විදේශ ආයෝජන මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට උත්සාහ කිරීම.<br>▪ ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමේ අරමුණේ දී, ජාත්‍යාන්තර හවුල්කරුවන් සහ මිතුරන් සමඟ සහයෝගිතාවයෙන් හවුල් අභිලාෂයන් කරා ගමන් කිරීමට අපේක්ෂා කරන බැවින්, ශ්‍රී ලංකාවේ වෙළඳාම, සංචාරක සහ ආයෝජන විශ්ලේෂණය සහ ප්‍රවර්ධනය කිරීම<br>▪ විචක්ෂණශීලී ආර්ථික කළමනාකරණයක් අනුගමනය කිරීම හා අනෙකුත් රටවල් සමඟ ආර්ථික සහයෝගීතාව පුළුල් කිරීම සඳහා ජාතික ආර්ථික රාමුව තුළ දේශීය වෙළඳපොළ විවෘත කිරීම.<br>▪ G20 රටවල්, BRICS+ රටවල්, ASEAN, මැදපෙරදිග සහ අප්‍රිකානු මහාද්වීපය සමඟ රාජ්‍ය තාන්ත්‍රික, ආර්ථික සහ සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා පූර්ණ ප්‍රමුඛතාවය ලබා දීම.<br>▪ විදේශීය සහ දේශීය පෞද්ගලික අංශයේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපාරික ක්‍රියා පටිපාටි විධිමත් කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ මානව නිපුණතා වර්ධනය කිරීම ඇතුළත් නවීන සහ විස්තීර්ණ ආයෝජන නීතියක් සම්පාදනය කිරීම.<br>▪ අපනයන වැඩි කිරීම අරමුණින් ගෝලීය නිෂ්පාදන ජාලයන් වෙත ශ්‍රී ලංකාව සම්බන්ධ කිරීමට නව වෙළඳ ගිවිසුම් හා අනෙකුත් වෙළඳපල වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම.<br>▪ ජාත්‍යන්තර වෙළඳාම සඳහා තීරණාත්මක සේවා සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳ |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| | | හවුල්කරුවන් සමඟ නව ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් වලට එළඹීම හා පවත්නා වෙළඳ ගිවිසුම් අනෙකුත් හවුල්කරුවන්ගේ ද කැමැත්ත ඇතිව විශ්ලේෂණය කර නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා වැඩිදියුණු කිරීම.<br>▪ තිරසර බලශක්ති ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තියේ ප්‍රමුඛයෙක් ලෙස ස්ථානගත කිරීම.<br>▪ උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල ධීවර කටයුතු වලට විදේශීය ධීවරයින් ගෙන් එල්ල වී ඇති අභියෝග රාජ්‍යතාන්ත්‍රිකව විසඳා අවශ්‍ය යටිතල පහසුකම් සහ අලෙවි පහසුකම් සඳහා ඉඩ පහසුකම් සැලසීම. |
| ජාතික ආරක්ෂාව | අන්තර්ජාතික සම්මතයන් හා සමපාත වන පරිදි ශ්‍රී ලංකාවට අනන්‍ය වූ ප්‍රවේශයක් තුලින් ස්වෛරීභාවය සහ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම | ▪ දේශීය ජල තීරය (territorial waters) අයිතිවාසිකම්ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.<br>▪ ශ්‍රී ලංකාව තුළ කිසිදු අභ්‍යන්තර ක්‍රියාකාරකමක් සඳහා විදේශීය හමුදා බලකායකට අවසර නොදීම.<br>▪ ජාත්‍යන්තර නීතිය; කලාපීය සහ ගෝලීය ස්ථාවරත්වය, සාමය සහ ආරක්ෂාව; සහ බහුපාර්ශ්වික පද්ධතිය ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම<br>▪ ත්‍රස්තවාදය, බෙදුම්වාදය, අන්තවාදය, මුහුදු කොල්ලකෑම් සහ වෙනත් සම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජනවලට එරෙහිව සටන් කිරීම සඳහා අග්නිදිග ආසියාතික සහ ආසියානු සංවිධාන සමඟ කටයුතු කිරීම ශක්තිමත් කිරීම.<br>▪ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට සහ ආර්ථික අවශ්‍යතාවලට බාධාවක් නොවන පරිදි විදේශීය ආයෝජන ආකර්ෂණය කර කළමනාකරණය කිරීම<br>▪ සයිබර් ආරක්ෂණ සහයෝගීතාව ස්ථාපිත කිරීම, ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට දැඩි ලෙස අනුගත වන අතරම සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් සහ උපායමාර්ග වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගැනීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සමුද්‍ර රාජ්‍යතාන්ත්‍රිකභාවය | සමුද්‍රයීය ආරක්ෂාව, පාරිසරික ආරක්ෂාව සහ විශ්වසනීය සැපයුම් දාමයන් ඒකාබද්ධ කිරීම තුළින්, අසල්වැසි රටවල් සමඟ සහයෝගීතාවයෙන් ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාවේ කාර්යභාරය ශක්තිමත් කිරීම | ▪ ජාත්‍යන්තර නීතිය අනුව සියලුම රටවල් මුහුදු සහ ගුවන් ප්‍රවේශ භුක්ති විඳින ලෝකයක් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම.<br>▪ එක්සත් ජාතීන්ගේ සාගර නීතිය මත පදනම් වූ ආරක්ෂිත සහ ස්ථාවර සමුද්‍රයීය වසමක් සහ නිදහස් හා විවෘත මුහුදු මංතීරු සුරක්ෂිත කිරීම.<br>▪ ඉන්දියන් සාගරයේ ප්‍රධාන නැව් මාර්ග සහ උසස් මට්ටමේ සැපයුම් සේවා සඳහා සමීපව උපායමාර්ගික පිහිටා තිබීම හේතුවෙන් කලාපීය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කිරීම සහතික කිරීම<br>▪ මුහුදු කොල්ලකෑම් වළක්වන මුර සංචාර, පරිසර දූෂණය පාලනය, සමුද්‍ර පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය, සමුද්‍ර ගවේෂණය, සමුද්‍රයීය ආරක්ෂාව සහ ඔරොත්තු දෙන හා විශ්වාසදායක සැපයුම් දාම පිළිබඳ ආරක්ෂක සැපයුම්කරුවෙකු ලෙස ඉන්දියානු සාගරය සමඟ සමුද්‍ර දේශසීමා බෙදා ගන්නා රටවල් සමඟ සමීපව කටයුතු කරන පළමු ප්‍රතිචාරකයා සහ ශුද්ධ ආරක්ෂකයා බවට පත්වීම. |
| සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකත්වය | ශ්‍රී ලංකාවේ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකත්වය ප්‍රවර්ධනය කිරීම | ▪ විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යාංශයක් පිහිටුවීම.<br>▪ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලාංකේය කලාකරුවන්ට සහාය වීම සහ ගෝලීය සංස්කෘතික උත්සවවලට සහභාගී වීම තුළින් මෘදු බලය ගොඩනැගීම සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම සඳහා සංස්කෘතික හුවමාරුව වැඩිදියුණු කිරීම හා විදේශයන්හි ශ්‍රී ලාංකේය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම.<br>▪ රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහා අත්‍යාවශ්‍ය පූර්ව අවශ්‍යතාවයක් ලෙස ශ්‍රී ලාංකිකයන් සහ අනෙකුත් ජාතීන් අතර නිසි අනෝන්‍ය අවබෝධය හඳුනා ගැනීම.<br>▪ අනෙකුත් රටවල් සමග ශක්තිමත් සබඳතා ඇති කර ගැනීමට පදනමක් ලෙස ක්‍රීඩා හුවමාරු වැනි ක්‍රීඩා රාජ්‍යතාන්ත්‍රිකභාවය උපයෝගී කර ගැනීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ විශාල ශ්‍රී ලාංකේය ඩයස්පෝරාවක් සිටින රටවල් සහ අපට සැලකිය යුතු සංචාරකයින් ගලා එන රටවල් සමඟ නිශ්චිත සංස්කෘතික ප්‍රවර්ධන සති/මාස ආරම්භ කිරීම.<br>▪ රටේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම මිනිසුන් අතර මිත්‍රත්වය ගොඩනැගීම සඳහා ඒත්තු ගැන්වීම, ආකර්ෂණය සහ සංස්කෘතික හුවමාරුව සඳහා ආගමික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම. |
| විද්‍යා හා තාක්ෂණ රාජ්‍යතාන්ත්‍රිකභාවය | විද්‍යා හා තාක්ෂණ රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම | ▪ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලික මෙවලමක් බවට පත් කිරීම.<br>▪ ශ්‍රී ලංකාව තුළ කලාපීය හා ගෝලීය වැදගත්කමින් යුතු රසායනාගාර හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමට සහ ප්‍රදර්ශන පැවැත්වීමට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින්ගේ සෘජු මැදිහත්වීම ඇතිව ගෝලීය විද්‍යා ප්‍රජාව ආකර්ෂණය කර ගැනීම.<br>▪ ශ්‍රී ලංකාව විද්‍යාව හා තාක්ෂණික ක්ෂේත්‍රයේ වැදගත් කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට සූදානම් විද්‍යාඥයින් සහ විශිෂ්ට පර්යේෂකයින් සඳහා පුරවැසිභාවය ලබා දීමට සලකා බැලීම.<br>▪ විද්‍යාව, තාක්‍ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය යන STEAM සංයෝජනය ප්‍රවර්ධනය කිරීම මගින් මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට විදේශීය සහය ලබා ගැනීම.<br>▪ ආසියාවේ ඩිජිටල් ද්වාරය ලෙස ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සමාගම් දිරිමත් කිරීම.<br>▪ UNESCAP වැනි බහුපාර්ශවික නියෝජිතායතන සඳහා වෙන් වූ නියෝජිතයන් පත් කිරීම. |
| පාර්ලිමේන්තු රාජ්‍යතාන්ත්‍රිකභාවය | ජාත්‍යන්තර සහයෝගීතාවයන් මගින් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු රාජ්‍ය තාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම | ▪ අනෙකුත් පාර්ලිමේන්තු සමග පාර්ලිමේන්තු මිත්‍රත්ව සමිති පිහිටුවීම සහ, ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ කථානායක, පාර්ලිමේන්තු මන්ත්‍රී සහ කාර්ය මණ්ඩල මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව දිරිමත් කිරීම.<br>▪ කලාපීය සහ ගෝලීය පාර්ලිමේන්තු සංසද භාවිතා කරමින් රටට උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අවශ්‍ය සියලු පහසුකම් සැලසීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය | අන්‍යෝන්‍ය සබඳතා වර්ධනය කිරීම මගින් මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම | ▪ ජනතාවගේ පොදු යහපත සඳහා ශ්‍රී ලංකාවේ රජය නොවන සංවිධාන සහ අනෙකුත් පිළිගත් සිවිල් සංවිධාන විදේශයන්හි ප්‍රවර්ධනය කිරීම<br>▪ කලාපීය සහ ගෝලීය දේශපාලන හා ආර්ථික වර්ධනයන් අධ්‍යයනය කරන සහ සම්බන්ධ වන බුද්ධිමණ්ඩල සහ වේදිකා ශක්තිමත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට දායකත්වය සැපයීමට සිටින ශ්‍රී ලාංකික රාජ්‍යතාන්ත්‍රිකයින්, ශාස්ත්‍රපතිවරුන්, ආරක්ෂක විශේෂඥයින් සහ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් අගය කිරීම.<br>▪ පළාත් සභා, මහ නගර සභා, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ප්‍රධාන රාජ්‍ය ආයතන යනාදිය මඟින් රටෙහි පවතින නීති රාමුව තුළ වෙනත් රටවල සිටින සමාන ආයතන සමඟ සුහද සහ අර්ථවත් සබඳතා ඇති කර ගැනීම සඳහා විදේශ සබඳතා කාර්යාල විවෘත කිරීමට පහසුකම් සැලසීම.<br>▪ අවශ්‍ය විටෙක මහජන රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය ඇති ශ්‍රී ලාංකික ප්‍රමුඛ පුද්ගලයින් සන්නාම තානාපතිවරුන් හෝ විශේෂ නියෝජිතයන් ලෙස සේවයේ යොදවා ගැනීම.<br>▪ ශ්‍රී ලාංකීය ඩයස්පෝරාව ඔවුන් වෙසෙන රටේ අනෙකුත් ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීමට දිරිමත් කිරීම. |
| මානුෂීය රාජ්‍යතාන්ත්‍රිකභාවය | මානුෂීය රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ගෝලීය මානුෂීය භූමිකාව ශක්තිමත් කිරීම. | ▪ ජාත්‍යන්තර ආධාර වැඩසටහන් සහ ආපදා සහන මෙහෙයුම් සඳහා සහභාගී වීම.<br>▪ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මානුෂීය අර්බුදවලට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ ධාරිතාව ගොඩනැගීම.<br>▪ වෙනත් ජාතීන්ට අයත් මිනිසුන්ගේ සැබෑ දුක්ගැනවිලිවලට සහය වීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට එක්සත් ජාතීන්ගේ සාම සාධක හා සාමය බලාත්මක කිරීමේ අවස්ථා ලබා ගැනීම. |
| නීති ප්‍රතිසංස්කරණ | යෝග්‍ය නීති ප්‍රතිසංස්කරණ සහ අනෙකුත් ගෝලීය සහයෝගීතාව තුළින් විදේශගත ශ්‍රී | ▪ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික දායකත්වය ලබා ගැනීම පහසුවන පරිදි ද්විත්ව පුරවැසි නීති සහ ආගමන නීති ප්‍රතිසංස්කරණය කිරීම.<br>▪ සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) යටතේ නඩු පැවරීමට අදාළ නීති හඳුන්වා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | ලාංකිකයන්ගේ ආර්ථික දායකත්වය උපරිම කිරීම | ▪ ද්විපාර්ශ්වික සහ කලාපීය නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) මගින් විදේශීය වෙළඳපොළවල අපගේ වාණිජ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා වෙළඳ නීති ශක්තිමත් කිරීම.<br>▪ කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයන් (RCEP) ද්විපාර්ශ්විකව හෝ බහුපාර්ශ්විකව ස්ථාපිත කිරීම.<br>▪ ස්ථාවරත්වයට සහ සෞභාග්‍යය ට සහය වන ජාත්‍යන්තර නීති ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සහ ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා සහයෝගීතාවය සක්‍රීය කිරීම. |
| ඩයස්පෝරා මැදිහත්වීම | ශ්‍රී ලාංකික ඩයස්පෝරාව වෙත සේවා සැපයීම සහ රටේ සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම | ▪ විදේශ රටවල සිටින ශ්‍රී ලාංකික ඩයස්පෝරාව වෙත සේවා සැපයීම සඳහා පවතින මානව හා මූල්‍ය සම්පත් වඩා හොඳින් සම්බන්ධීකරණය කරමින් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම.<br>▪ විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ට තමන් පදිංචි රටෙහි සිට ඡන්දය භාවිත කිරීමට පහසුකම් සැලසීම.<br>▪ විදේශ රැකියා කරන පුරවැසියන් සඳහා විශ්‍රාම විශ්‍රාම වැටුපක් ඇතුළුව අත්‍යවශ්‍ය රක්ෂණ සහ සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.<br>▪ විදේශ රටවල වෙසෙන දක්ෂ ශ්‍රී ලාංකික ව්‍යවසායකයින්ට මූල්‍ය පහසුකම් ද සමගින් පහසුකම් සැලසීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ ව්‍යවසායක ප්‍රවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.<br>▪ සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවක් සිටින සෑම රටකම ශ්‍රී ලාංකේය ඩයස්පෝරාව සමඟ කටයුතු කිරීමට තානාපති කාර්යාල හා ඒකාබද්ධ වූ උපදේශක මණ්ඩල පිහිටුවා, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලය සමඟ ස්ථිර ලෙස සම්බන්ධ වීමට බල කිරීම.<br>▪ විදේශයන්හි ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා සම්මානිත කොන්සල්වරුන් ලෙස නේවාසික නොවන ශ්‍රී ලාංකිකයන් (NRSL) පත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ශ්‍රී ලංකා ගිණුම් වෙත මුදල් ප්‍රේෂණය කිරීමේ දී ඇති වන ඉහළ සේවා ගාස්තු, පදිංචි රටෙන් බහු මුදල් ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ දුෂ්කරතා වැනි ගැටලුවලට විසඳුම් ලබා දීම සහ එවැනි ගිණුම් සඳහා අවශ්‍ය රක්ෂණ ලබා දීම.<br>▪ විදේශ රැකියා කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ට සංවර්ධන ව්‍යාපෘති සඳහා බැඳුම්කර ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට පහසුකම් සැලසීම.<br>▪ ඒ ඒ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ට උප්පැන්න සහතික ඇතුළු වෙනත් සහතික සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම විධිමත් හා කාර්යක්ෂම කිරීම.<br>▪ විදේශගත ශ්‍රී ලාංකිකයන් ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීමට පෙළඹවීම සඳහා ද්විත්ව පුරවැසි ගාස්තු සංශෝධනය කිරීම. |
| වත්මන් විදේශ ප්‍රතිපත්ති ස්ථාවරයන් | වර්තමාන විදේශ ප්‍රතිපත්තියෙහි ස්ථාවරත්වය තහවුරු කිරීම | ▪ ඉන්දියාව ඇතුළු කලාපයේ කිසිදු රටක ආරක්ෂාවට තර්ජනයක් හෝ අවදානමක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ගොඩබිම, මුහුද සහ ගුවන් අවකාශයන් භාවිතා කිරීමට කිසිදු රටකට හෝ ආයතනයකට ඉඩ නොදීම.<br>▪ නිදහස් ස්වෛරී පලස්තීන රාජ්‍යයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ඇති ද්වි රාජ්‍ය විසඳුමට සහය දීම.<br>▪ ත්‍රස්තවාදය, බෙදුම්වාදය සහ අන්තවාදයේ තර්ජනය තුරන් කිරීම.<br>▪ ස්ථිර ප්‍රතිපත්තියක් ලෙස, ඉන්දියානු සාගරයේ විදේශීය හමුදා කඳවුරු සහ ඒ හා සමාන මිලිටරි ගිවිසුම් සහ මිලිටරිකරණ මුලපිරීම් වලට විරුද්ධ වීම. |

## 4.8 උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- පුරවැසි ආරක්ෂාව
- ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව
- අභ්‍යන්තර ආරක්ෂාව සහ ජාතික සංහිඳියාව
- සමුද්‍රීය වසම සහ ගුවන් තලය ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව පිළිබඳ වගවීම සහ වගකීම
- ජාතික සම්පත්වල ආරක්ෂාව
- බලශක්ති ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව සඳහා රාජ්‍ය බුද්ධි සේවා දායකත්වය
- විධිමත් ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධනය

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ජාතික ආරක්ෂාව සහ ස්වෛරීභාවය | ත්‍රිවිධ හමුදාවන්ට සහ ඒවාට අනුබද්ධ සේවාවන්ට අති නවීන තාක්ෂණය ඒකාබද්ධ කිරීමෙන් ජාතික ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාව ශක්තිමත් කිරීම | ▪ ජාතික ආරක්ෂාව සඳහා වගකීම සහ වගවීම සහතික කරමින් ජාතික ආරක්ෂක කවුන්සිලය ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම.<br>▪ කලාපීය සුරක්ෂිතභාවය සහ සාමකාමී සහජීවනය සහතික කිරීම, ආරක්ෂිත ජාත්‍යන්තර සබඳතා තුළින් ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම.<br>▪ සම්මුතියකින් තොරව රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය සහතික කිරීම<br>▪ සංකීර්ණ හා වේගයෙන් වෙනස් වන අභියෝගවලට මුහුණ දීම සඳහා නවීන හා තාක්ෂණික දැනුම සහ සංවර්ධනය සමඟ ආරක්ෂක අංශ කාලානුරූපව යාවත්කාලීන කිරීම සඳහා ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන ව්‍යුහය විධිමත් කිරීම.<br>▪ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සමඟ ජාතික ආරක්ෂාව පිළිබඳ දැනුම ඒකාබද්ධ කිරීමෙන් ආරක්ෂක අංශයේ විශිෂ්ටත්වය ඉහළ නැංවීම.<br>▪ ආර්ථික ස්ථාවරත්වය සඳහා උපායමාර්ගික ආරක්ෂක පරිසරයක් සහ ස්ථිර පදනමක් නිර්මාණය කිරීම.<br>▪ ජාත්‍යන්තර නීතිය පරිදි, සියලුම රටවල් වලට මුහුදු සහ ගුවන් ප්‍රවේශය භුක්ති විඳීමට ඇති අවස්ථාව ආරක්ෂා කිරීම.<br>▪ ගුවන් හමුදාවේ තාක්ෂණික දැනුම නාවික හා ගුවන් සේවා සමඟ ඒකාබද්ධ කිරීම සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන් කලාපීය ආරක්ෂාව සහතික කිරීම සඳහා විචක්ෂණශීලීව සහාය වීම.<br>▪ ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා ගුවන් හමුදාවේ තාක්ෂණික දැනුම නාවික හා ගුවන් සේවා සමඟ තීරණාත්මක ලෙස ඒකාබද්ධ කිරීම සහ කලාපීය ආරක්ෂාව සහතික කිරීමට සහාය වීම.<br>▪ ජාතික ආරක්ෂාව පිළිබඳ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින්ගෙන් සමන්විත ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.<br>▪ ජාතික ආරක්ෂාව සුරැකීම සඳහා ජාතික හා උපායමාර්ගික වැදගත් කමක් සහිත සම්පත් පරිභෝජනය හා සංරක්ෂණය සඳහා වගකිවයුතු හා වගවීමට යටත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| සමුද්‍රයීය ආරක්ෂාව | ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම සැලකිල්ලට ගනිමින්, නැගී එන ආරක්ෂක තර්ජන සම්බන්ධයෙන් කටයුතු කරන අතරම ගෝලීය වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා කලාපීය සමුද්‍රයීය ආරක්ෂාව සුරක්ෂිත කිරීම | ▪ සාගරය තුළ ස්ථාවර සමුද්‍ර පරිසරයක් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සහ සමුද්‍රීය කර්මාන්තය මුහුණ දෙන අභියෝගවලට එරෙහිව සමුද්‍රයීය නීති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම<br>▪ භෞමික ජල තීරයේ හිමිකම ඇතුළුව ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම<br>▪ එක්සත් ජාතීන්ගේ මුහුදු සම්මුතිය යටතේ ජාත්‍යන්තර සමුද්‍රයීය මායිම් ඵලදායී ලෙස පාලනය කිරීම සඳහා කලාපීය සහයෝගීතාවයෙන් යුත් ඒකාබද්ධ කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දීම<br>▪ ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ (EEZ) ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීමට හැකිවන පරිදී ශ්‍රී ලංකා නාවික හමුදාව හා ශ්‍රී වෙරළාරක්ෂක බලකාය තාක්ෂණිකව යාවත්කාලීන කර අදාළ නීති මඟින් බල ගැන්වීම<br>▪ ප්‍රධාන නැව් මාර්ග සහ උසස් තත්ත්වයේ සැපයුම් සේවා වලට ආසන්නව උපායමාර්ගිකව පිහිටීම හේතුවෙන් ඉන්දියානු සාගරයේ කලාපීය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කිරීම සහතික කිරීම<br>▪ මුහුදු කොල්ලකෑම් වටලන මුර සංචාර, සමුද්‍ර දූෂණ පාලනය, සමුද්‍ර පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය, සමුද්‍රයීය සෙවීම, සමුද්‍රයීය ආරක්ෂාව, විශ්වාසදායක සැපයුම් දාම, දත්ත සහ ත්‍රස්ත විරෝධී සහ ගලවා ගැනීමේ මෙහෙයුම්, ඒකාබද්ධ අභ්‍යාස ආදිය සම්බන්ධයෙන් ඉන්දියානු සාගරය සමඟ සමුද්‍රයීය දේශසීමා බෙදා ගන්නා රටවල් සමඟ සමීපව කටයුතු කරන ආරක්ෂක සැපයුම්කරුවෙකු සහ පළමු ප්‍රතිචාර දක්වන්නෙකු බවට පත්වීම<br>▪ කලාපීය සහයෝගීතාවයෙන් ගුවන්, මුහුද සහ ගොඩබිම් ස්වාධීනත්වය පිළිබඳ නිරපේක්ෂ පාලනයක් ඇති කර ගනිමින් සමුද්‍රයීය වසම් දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| සන්නද්ධ හමුදාවන්ගේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම | කාර්යක්ෂම මිනිස්බල සැලසුම් ක්‍රියාවලියක් මඟින් ආරක්ෂක හමුදාවන්ගේ වෘත්තීයභාවය සහ නිපුණතාවය වැඩි දියුණු කිරීම | ▪ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා ඒවා මෙහෙයවිය හැකි නිසි නායකත්වයන් යටතේ ජාතික ආරක්ෂාවට අදාළ දියුණු හා තාක්ෂණික දැනුම සහ ආරක්ෂක පරිසරයන් පිළිබඳ මනා පුහුණුව සමඟ දැනුම සහ හැකියාවන් සහිත වෘත්තීය හමුදාවන් ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීම.<br>▪ පිළිගත් හමුදාමය ක්‍රමවේදයන්ට අනුකූලව සහ කුසලතා, වෘත්තීමය දක්ෂතාවයන්, නොකිලිටි වෘත්තීමය ඉතිහාසය මත පමණක් පදනම්ව උසස් තනතුරුවලට පත් කිරීම සහ උසස්වීම් ලබාදීම සහ හමුදාවන්ට අදාළ විශේෂ පුහුණුවීම් සඳහා තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදයන් විධිමත් කිරීම.<br>▪ විශ්‍රාමික ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන්ගෙන් බහුතරයක් පුද්ගලික ආරක්ෂක ක්ෂේත්‍රයේ සේවය කරන බැවින් පුද්ගලික ආරක්ෂක සේවාවන් වඩා වෘත්තීය බව සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා කර්මාන්තය නියාමනය කිරීම.<br>▪ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ ගෞරවය හා අභිමානය ආරක්ෂා වන පරිදි හදිසි ජාතික අවශ්‍යතාවන්හි දී පිළිගත් ක්‍රමවේදයකට අනුකූලව හැර හමුදාවන්වලට අදාළ නොවන කිසිම සිවිල් කටයුත්තකට ඔවුන් අනුයුක්ත නොකිරීමට වග බලා ගැනීම.<br>▪ දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම. |
| බුද්ධි අංශ අධීක්ෂණය සහ වගවීම | සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන තර්ජන හඳුනා ගැනීම මඟින් ආරක්ෂක මෙහෙයුම් වලදී ඵලදායී අධීක්ෂණය සහ වගවීම ස්ථාපිත කිරීම | ▪ ජාතික ආරක්ෂාව සඳහා රාජකාරී ඉටු කිරීමේ දී වගකීම සහ වගවීම සහතික කිරීම සඳහා නිසි ක්‍රියා පටිපාටි සමඟ විශ්වාසදායක සහ කාර්යක්ෂම ඒකාබද්ධ බුද්ධි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ස්වාධීන සහ නිර්දේශපාලනික විමර්ශන සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.<br>▪ නීති ක්‍රියාත්මක කරන ආයතන (පොලිසිය, රේගුව, බන්ධනාගාරය) සම්පූර්ණ වගවීම සහතික කිරීම මඟින් ජාතික බුද්ධි සේවයේ ඵලදායී ඒකාබද්ධතාවය සමඟ අධීක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ විධිමත් කිරීම.<br>▪ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට දැඩි ලෙස අනුගත වන අතරම, සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් සහ උපාය මාර්ග වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගැනීම.<br>▪ ජාතික තොරතුරු පද්ධතිවල පවතින ආරක්ෂක ප්‍රතිපත්තිය කාර්යක්ෂම හා ඵලදායී ලෙස වැඩි දියුණු කිරීම සහ එම වගකිව යුතු ආයතන සවිබල ගැන්වීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ආරක්ෂක පුද්ගල සුභසාධනය | විශ්‍රාමික සහ වත්මන් ආරක්ෂක නිලධාරීන්ගේ යහපැවැත්ම සහ ගෞරවය සහතික කිරීම | ▪ තම මාතෘ භූමිය වෙනුවෙන් විවිධ කැපවීම් කරන ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, මියගිය, අතුරුදහන්, ආබාධිත සහ සේවය කරන රණවිරුවන් ගෞරවයෙන් හා අභිමානයෙන් යුතුව ජීවිතයක් ගත කිරීම සහතික කිරීම.<br>▪ ආරක්ෂක සේවාවන් හැර ගිය සොල්දාදුවන් සම්බන්ධයෙන් මානුෂීයව සලකා බැලීම මඟින්, ගෞරවනීය හා ඵලදායී පුරවැසියන් ලෙස ජීවත් වීමට ඔවුන්ව බල ගැන්වීම.<br>▪ විශ්‍රාමික ආරක්ෂක හමුදා සාමාජිකයින් සහ ආබාධිත සාමාජිකයින් ගෞරවයෙන් හා ආඩම්බරයෙන් ජීවත් වන බව සහතික කිරීම. |

## 4.9 ශ්‍රී ලාංකේය ජාතියක් - විශ්වීය පුරවැසියෙක්

### ප්‍රතිපත්ති මූලධර්මයන්

- සියලුම ජනවර්ගවල දේශපාලන හවුල්කාරිත්වය.
- ජනවර්ගය, භාෂාව, ආගම, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් හේතු මත කිසිදු පුරවැසියෙකු/ප්‍රජාවක් නින්දාවට, පීඩාවට, අවමන් සහගත සැලකීමට හෝ අසාධාරණයට ලක් නොවිය යුතුය.
- සියලු ජනවර්ග සහ ආගමික කණ්ඩායම්වල ආරක්ෂාව, අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ අයිතිවාසිකම්.
- ජාතිය, කුල සහ ආගමික මතවාදයන් ගෙන් නොබෙදුණු සහජීවනයෙන් සහ සංහිදියාවෙන් යුත් ශ්‍රී ලාංකික ජාතියක්.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| ප්‍රජාතන්ත්‍රවාදය | පාලනය සඳහා නිදහසේ ජනතාවට සම්බන්ධවීම සහතික කිරීම | ▪ එක් රටක් තුළ සියලු ජනතාවට පාලනයට සම්බන්ධ විය හැකි පරිදි සෑම පළාත් පාලන, දිස්ත්‍රික් සහ පළාතකටම දේශපාලන හා පරිපාලන බලය බෙදා හැරෙන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන සහ සියලු පුරවැසියන්ගේ සමානාත්මතාවය සහතික කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම.<br>▪ පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ පවත්වා ජනතාවට ආණ්ඩුකරණයට එක්වීමට අවස්ථාව සැලසීම.<br>▪ උතුරු නැගෙනහිර ඇතුළු රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් තහවුරු වන ආකාරයට සිවිල් පරිපාලනය විධිමත් කිරීම.<br>▪ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම හා ඔවුන් නිදහසේ සමාජගත කිරීම සහතික කිරීම<br>▪ රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් තහවුරු කරන සියලුම පීඩාකාරී පනත් අහෝසි කිරීම<br>▪ නීතිමය බලයක් සහිතව වෙනස් කොට සැලකීමට එරෙහි කොමිෂන් සභාවක් (Commission Against Discrimination) ස්ථාපිත කිරීම<br>▪ උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල පසුගිය කාලය තුළ සිදු වූ දේශපාලන ඝාතන, අතුරුදහන් වීම් සහ පැහැර ගැනීම පිළිබඳ විමර්ශනය කිරීම සහ යුක්තිය ඉටු කිරීම<br>▪ ජාතිවාදය සහ ආගමික අන්තවාදය හේතු කොට ගෙන ඇති වන ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කිරීමට සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමේ කාර්යයන් ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම.<br>▪ අන්තර් ආගමික ගැටළු නිරාකරණයට සර්ව ආගමික නායකයන්ගෙන් හා ආගමික උගතුන්ගෙන් සමන්විත අන්තර් ආගමික සභාවක් පිහිටුවීම.<br>▪ ලෝක ආගම් පිළිබඳව තුළනාත්මක අධ්‍යයනයන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>▪ ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ජාතික හා ආගමික සමගිය ඇති කිරීමට සංස්කෘතික වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.<br>▪ දේශපාලන බලපෑම්වලින් තොරව කුසලතා මත පදනම්ව සියලුම ජාතීන්ට අධ්‍යාපන හා රැකියා අවස්ථා ලබා දීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | |
| සහජීවනයෙන් යුත් සමාජයක් | ජනවර්ගය, භාෂාව, ආගම, කුලය සහ ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා හරිමින් සමාන අවස්ථා සමගින් ජාතික සමගිය සහතික කිරීම. | ▪ සහන සහ රැකවරණය අවශ්‍ය යුධ වැන්දඹුවන්, අවතැන්වූවන්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හා මානසික පීඩනයටපත් පුද්ගලයින්ට සහන සැලසීම.<br>▪ ඉඩම් හා ජනාවාස පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් මගින් දැනට පවතින ඉඩම් සහ ජනාවාස සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම.<br>▪ ජන සංයුතිය වෙනස් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන නැවත පදිංචි කිරීමේ වැඩසටහන් අවසන් කිරීම<br>▪ අවශ්‍ය සම්පත් හා තාක්ෂණික පහසුකම් සැපයීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි සංශෝධනය යටතේ පිළිගත් ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.<br>▪ 2023.10.15 දිනැතිව ජාතික ජන බලවේගය විසින් ප්‍රකාශයට පත්කළ හැටන් ප්‍රකාශනයේ සඳහන් පරිදි, කඳුකර දෙමළ ප්‍රජාවගේ අනන්‍යතාවය සහ අයිතීන් පිළිගනිමින් ඔවුන්ගේ ඉඩම්, නිවාස, අධ්‍යාපනය හා සෞඛ්‍යය ආදී පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගැනීම. |
| | සියලුම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් නඟා සිටුවීමෙන් ඔවුන්ගේ ගෞරවය තහවුරු කිරීම | ▪ ජීවන වියදමට සරිලන පරිදි උඩරට වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම.<br>▪ උතුරු හා නැගෙනහිර පළාත් සහ උඩරට ප්‍රදේශ වල පවතින පොලිස් ඒකක, රජයේ කාර්යාල වැනි සිවිල් සේවාවල දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි නිලධාරීන්, සේවකයින් සහ භාෂා පරිවර්තකයන් ලබාදීම. |